iProbono



ශ්‍රී ලංකාව

# ළමයින් පළමුව:

## ළමයින්ගේ ආරක්ෂාව පිළිබඳව ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ කාර්ය භාරය පිළිබඳ ගැඹුරු අධ්‍යයනයක්.

සහාය

Together, We Can!
Stop Child Cruelty Trust

<u>කතෘවරුන්</u>

නීතිඥ ශෙවින්ද්‍රි මැනුවල්, වැඩසටහන් කලමනාකාර - ශ්‍රී ලංකාව

නීතිඥ අශ්විනා සින්නතම්බි, වැඩසටහන් නිලධාරී - ශ්‍රී ලංකාව



<u>සංස්කාරක කණ්ඩායම</u>

සුප්‍රියා රෝයිචෞද්‍රි, පර්යේෂණ සහ බලපෑම් පිළිබඳ අධ්‍යක්ෂ

රධිකා සක්සේනා, ජ්‍යෙෂ්ඨ වැඩසටහන් කලමනාකාර - දකුණු ආසියාව

ටරාන් ඛාන්, සන්නිවේදන ප්‍රධානී

වෛද්‍ය තුෂර වික්‍රමනායක - සභාපතිනි, ළමා හිංසනයට තිත පදනම

<u>නිමැවුම</u>

රිචා ඔබෙරෝයි, සන්නිවේදන සහ අධිවාචන නිලධාරී

මෙම පර්යේෂණ ක්‍රියාදාමය පුරාවට තම වටිනා දායකත්වය සහ සහයෝගය ලබා දුන් ජාතික ළමා ආරක්ෂණ අධිකාරියේ පහත සඳහන් නිලධාරී මඬුල්ලට, කතෘ මණ්ඩලය සිය හෘදයාංගම ස්තුතිය පළකර සිටියි.

ප්‍රීති ඉනෝකා රණසිංහ - සභාපති, ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය

අනෝමා සිරිවර්ධන - අධ්‍යක්ෂ ජනරාල්

සංජීවනී අබේකෝන් - නීති බලාත්මක කිරීම පිළිබඳ අධ්‍යක්ෂ

රෝහණ රණසිංහ - පර්යේෂණ සහ සංවර්ධන ප්‍රධානී

රසික හෙගොඩආරච්චි - පර්යේෂණ සහ සුබසාධන නිලධාරී - පර්යේෂණ සහ සංවර්ධන අංශය


---

අපගේ සේවාවන් පිළිබඳ වැඩිදුර දැනගැනීමට අපගේ නිල වෙබ්අඩවිය වෙත පිවිසෙන්නː

www.i-probono.com


විමසීම් සඳහා සම්බන්ධ වන්නː

ශෙවින්ද්‍රි මැනුවල්, වැඩසටහන් කලමනාකාර, ශ්‍රී ලංකාව

shevindri.manuel@i-probono.com



ප්‍රකාශයට පත්කරනු ලැබුවේː 2024 දෙසැම්බර්

# පෙරවදන

ළමා ආරක්ෂාව යනු මානුෂික මූලික අයිතිවාසිකමක් වන අතර සාධාරණ සහ යුක්ති සහගත සමාජයක මූලිකාංගයක් වේ. iProbono හි අපි, සමාජයේ අතිශය අවදානමට භාජනය විය හැකි සාමාජිකයන් වන ළමයින්ගේ ආරක්ෂාව වෙනුවෙන් දැඩිව කැපව සිටින්නෙමු.

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය (අධිකාරිය) පිළිබඳ මෙම ඇගයුම අප භාරගෙන ඇත්තේ එහි කාර්ය සාධනය විදහා දැක්වීමට සහ වර්ධනය සඳහාවූ ක්ෂේත්‍රයන් හඳුනා ගැනීම පිණිසය. ශ්‍රී ලංකාවේ දරුවන්ගේ දීප්තිමත් අනාගතයක් සඳහා ශක්තිමත් සහ ඵලවත් ළමා ආරක්ෂණ පද්ධතියක් අවශ්‍ය වන්නේය යන අපගේ දැඩි විශ්වාසයට මෙම වාර්තාව සාක්ෂි දරනු ඇත. ළමා ආරක්ෂක අධිකාරියේ කාර්ය සාධනය විශ්ලේෂනය කිරීම තුලින්, ළමා ආරක්ෂාව පිළිබඳව වඩාත් ව්‍යාප්ත සහ ළමා කේන්ද්‍රීය පිවිසුමකට දායක වීමට අප අපෙක්ෂා කරන්නෙමු.

ළමාරක්ෂක අධිකාරියේ සහ එහි සේවයට කැපවූ කාර්‍ය්‍ය මණ්ඩලයේ වෙහෙසකර කාර්‍ය්‍ය අප අගය කරන්නෙමු. එසේ වුවද, වැඩි දියුණුව සඳහා සුවිශේෂ ඉඩ ප්‍රස්ථා ඇති බව අපගේ විශ්වාසයයි. අභියෝග සහ ඉඩ ප්‍රස්ථා ඉස්මතු කිරීම තුලින්, ඵලදායි සංවාදයක් ඇරඹීමට සහ කාර්ය ප්‍රවර්ධනයට පෙළඹවීමක් ලබා දීමට අපි අපේක්ෂා කරන්නෙමු. ශ්‍රී ලංකාවේ සෑම ළමයකුගේම දියුණුව සහතික කිරීම පිණිස ළමා ආරක්ෂණ යාන්ත්‍රණය ශක්තිමත් කිරීම පිණිස එක්ව කටයුතු කරන මෙන් රාජ්‍ය නිලධාරීන්, සිවිල් සමාජ ආයතන ඇතුළු ළමා ආරක්ෂණ කටයුතුවල නියැලී සිටින සහ උනන්දුවක් දක්වන සියළු පාර්ශවකරුවන්ගෙන් අප ආයාචනය කර සිටිමි.



අරිත වික්‍රමසිංහ
සමානාත්මකතා නීති අධ්‍යක්ෂක
Equality Law Director

# පටුන


| | |
|---|---|
| කාරක සංෂිප්තය | **5** |
| 1. හැඳින්වීම | **7** |
| 2. ක්‍රමවේදය | **9** |
| 3. නිරීක්ෂණ | **10** |
| 3.1 කර්තව්‍ය ඉටු කිරීම | **10** |
| 3.1.1 උපදේශාත්මක කාර්යයන් | **10** |
| 3.1.2 දැනුවත්බව සහ ශාස්ත්‍රඥාණය | **13** |
| 3.1.3 සම්බන්ධීකරණය සහ සමූපදේශ | **16** |
| 3.1.4 නියාමනය සහ ක්‍රියාත්මක කිරීම | **18** |
| 3.1.5 පර්යේෂන සහ දත්ත කළමනාකරණය | **22** |
| 3.1.6 පැමිණිලි හසුරුවීම සහ යොමු කිරීම් | **26** |
| 3.1.7 ජාත්‍යන්තර සම්බන්ධීකරණය | **29** |
| 3.1.8 අවදානමට භාජනය වියහැකි කණ්ඩායම් සඳහාවූ සහාය | **31** |
| 3.1.9 අනෙකුත් තීරණාත්මක අවශ්‍යතාවන් පිළිබඳ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ප්‍රතිචාරය | **35** |
| 3.2 සම්පත් වෙන්කිරීම සහ උපයෝගීතාව | **35** |
| 3.2.1 මූල්‍ය විශ්ලේෂණය | **35** |
| 3.2.2 අරමුදල් උපයෝගිතාවේ ඌණතා | **35** |
| 3.2.3 අරමුදල් අවකළමණාකරණය | **35** |
| 3.2.4 ගිණුම්කරන අඩුලුහුඬුකම් සහ මූල්‍ය අක්‍රමිකතා | **35** |
| 3.2.5 මානව සම්පත් | **36** |
| 4. ඉදිරි ගමන | **37** |
| 5. පුස්තක නාමාවලිය | **38** |

# කාර්ය සංක්ෂිප්තය

මෙම වාර්තාව, "ළමයින් පළමුව: ළමයින්ගේ ආරක්ෂාව පිළිබඳව ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ කාර්ය භාරය පිළිබඳ ගැඹුරු අධ්‍යයනයක " මගින් 2014 සිට 2022 දක්වා කාලය තුළ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ කාර්ය සාධනය පිළිබඳ විස්තීර්ණ විශ්ලේෂණයක් සපයන්නේය.

ළමා ආරක්ෂක අධිකාරිය පනතේ 14 වන වගන්තියෙන් දක්වා ඇති ළමා ආරක්ෂක අධිකාරියේ කර්තව්‍ය යට, ළමා ආරක්ෂාව සුරක්ෂිත කිරීම, උපදේශනාත්මක සේවා සැපයීම, ප්‍රතිපත්ති සම්පාදනය, ළමා ආරක්ෂණ පියවර සම්බන්ධීකරණය සහ නියාමනය, ළමා අපයෝජන පිළිබඳ පැමිණිලි විමර්ශනය සහ මහජන දැනුවත් කිරීම් ප්‍රචාරණ වැඩසටහන් පැවැත්වීම ඇතුළු පුළුල් කාර්ය රැසක් ඇතුලත්ය.

මෙම වාර්තාව වනාහි, වාර්ෂික වාර්තා, දත්ත සංඛ්‍යාලේඛන සහ පාර්ශවකරුවන් වෙතින් ලද අන්තර්දෘෂ්ටිය මඟින් ලද තොරතුරු මත එකී එක් එක් කාර්ය සාධනය පිළිබඳව විවේචනාත්මක ඇගයුමකි.

එක් සුවිශේෂී අභියෝගයක් වනුයේ, විශේෂයෙන්ම කොවිඩ්-19 වසංගතය සහ ආර්ථික අර්බුදයෙන් අනතුරුව, ජාතික ළමා ආරක්ෂණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ මන්දගාමීත්වයයි. ළමා ආරක්ෂණ ප්‍රත්‍යුත්ක්‍රමයන්හි (Initiatives) ඵලදායිතාව සහතික කිරීම සඳහා තීරණාත්මක සාධකයක් වනුයේ, ජාතික ළමා ආරක්ෂණ ප්‍රතිපත්ති (policy roll-out) ක්‍රියාත්මක කිරීම සඳහා පස් අවුරුදු කාර්ය සැලසුම ක්‍රියාත්මක කිරීම සීඝ්‍රවත් කිරීම සහ වගවීමෙන් යුතු පැහැදිලි පියවර සමඟින්වූ දැඩි නියාමන රාමුවක් සම්පාදනය කිරීමයි. මෙය ඉටුකර ගැනීමට පැහැදිලි කාලවකවානු සැකසීම, ප්‍රමාණවත් සම්පත් වෙන් කිරීම, සහ ස්ථාපිත මිණුම් ලකුණුවලට සාපෙක්ෂව නිරන්තරයෙන් ප්‍රගතිය විමසුම අවැසි වේ.

සැලකිල්ලට භාජනය විය යුතු තවත් ක්ෂේත්‍රයක් වනුයේ, මහජන දැනුවත් කිරීමේ වැඩ සටහන්වල සීමිත බලපෑම සහ වැඩසටහන් වල ප්‍රතිඵල සම්බන්ධ විස්තීර්ණ දත්ත ඌණතාවයි. ළමා ආරක්ෂක අධිකාරිය විසින් නොයෙකුත් දැනුවත් කිරීමේ ප්‍රචාරණ වැඩ සටහන් සහ පුහුණු සැසි පවත්වා ඇති නමුත්, ඔවුන්ගේ දිගු කාලීන බලපෑම පිළිබඳ වඩාත් ගැඹුරු විශ්ලේෂණයක් අවශ්‍ය වේ. සමීක්ෂණ, නාභිගත කණ්ඩායම් සහ (focus groups) බලපෑම් ඇගයුම් ඇතුළු දැඩි තුලනයක් මඟින් මෙය ඉටුකර ගත හැකිය. ඊටත් අමතරව, ළමා ආරක්ෂක අධිකාරියේ සංඛ්‍යා ලේඛන වාර්තාවන්හි විෂමතාවන් සහ ඉතා වැදගත් උපමාන ඌණතාවයන් පෙන්නුම් කෙරෙන අතර, එය එහි කාර්ය සාධනය පිළිබඳ විස්තීර්ණ ඇගයුමට බාධකයකි. මීට පිළියම් වශයෙන්, ළමා ආරක්ෂක අධිකාරිය විසින් විවිධ වාර්තාකරණ කාලයන් හි ස්ථිරභාවය සහ නිරවද්‍යතාව සහතික කල හැකි පරිදි තම දත්ත එක්රැස් කිරීම ප්‍රමිතිගත කල යුතුය.

ළමා ආරක්ෂක අධිකාරියේ දත්ත කළමණාකරණ ක්‍රියාවලිය ශක්තිමත් කල යුතු බව අප අධ්‍යයනය කලෙමු.දත්ත-බෙදාහැරීමේ පද්ධතියක් ස්ථාපිත කිරීම සාධනීය පියවරක් වුවද, එහි සංකීර්ණ ස්වභාවය සහ සම්බන්ධීකරණ ඌණතාවන් නිසා එම පද්ධතියේ සම්පූර්ණ උපයෝගිතාවට බාධා පමුණුවා ඇති. විධිගත අන්තර්-නියෝජන කමිටුවක් සහ ප්‍රමිතිගත දත්ත-බෙදාගැනීම් මූලලේඛයක් (protocol) නොමැතිවීම මෙම ගැටළුව තවත් ව්‍යාකූල කර ඇති අතර, එමගින් ස්ථිරසාරත්වයෙන් තොර උපායමාර්ග සහ ඵලරහිත තොරතුරු බෙදා ගැනීමට මං පහදා ඇත.මෙම අභියෝග ජය ගැනීම සඳහා, ළමා ආරක්ෂක අධිකාරිය විසින් දත්ත කළමනාකරණය සහ විශ්ලේෂනය, ක්‍රියාවලි අනුකූලනය (streamline) කිරීම සඳහා උත්තේජන තාක්ෂණ (leverage technology) භාවිතය සහ අදාල නියෝජිත ආයතන සමඟ සම්බන්ධීකරණය තහවුරු කිරීම ආදිය කෙරෙහි ප්‍රමුඛතාවය දැක්විය යුතුය.

ළමා ආරක්ෂක අධිකාරිය විසින් විද්‍යුත් සාක්ෂි (video evidence) ඒකකයක් ස්ථාපිත කිරීම ප්‍රශංසාත්මකය. එසේ වුවද, මෙම ඒකකය මූලිකවම බස්නාහිර පළාතට පමණක් සීමාවීම සහ එවන් ඒකකයන් ප්‍රමාණවත් පරිදි නොමැති වීම නිසා, අනෙකුත් පළාත්වල ළමයින්ට එහි ඵල ලබා ගැනීම අතිශය සීමාසහිත වී ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, යුක්තිය ඉටුවීමට මෙම වැදගත් මෙවලම උපයෝගී කර ගනිමින් ළමා අපයෝජන නඩු පවරා ඇත්තේ 2015 දී 1.4% ක් සහ 2021 දී 0.6% ක් පමණි. මෙයට පිළියම් වශයෙන්, රට පුරා ප්‍රධාන ස්ථානවල විද්‍යුත් සාක්ෂි ඒකක ස්ථාපිත කිරීම සඳහා ප්‍රමාණවත් සම්පත් වෙන් කිරීම අත්‍යවශ්‍ය වේ. මෙම සේවාව පුළුල් කිරීම මඟින්, සියළුම පළාත්වල ළමයින්ට මෙම වැදගත් සේවාව ලබා ගැනීමේ සම අවස්ථාව උදාවන අතර, නැවත නැවත අධිකරණය හමුවේ පෙනී සිටීමෙන් ඇති වන චිත්ත කම්පනයෙන් මිදී සාක්ෂි ලබාදීමේ අවස්ථාව ළමයින්ට උදාවේ.

"1929" හදිසි ඇමතුම් අංකය හඳුන්වා දීමෙන් ළමා අපයෝජනය සම්බන්ධයෙන් ලැබෙන පැමිණිලි වැඩවීමට ඉවහල්වී ඇති නමුත්, යුක්තිය ඉටුවීමේ නිබැඳි ප්‍රමාදය සුවිශේෂී අභියෝගයක්ව පවතී. එම ප්‍රමාදය ළමා වින්දිතයන් (victims) සහ ඔවුන්ගේ පවුල්වලට අනර්ථදායක බලපෑමක්.යුක්තිය ඉටුකිරීමේ ක්‍රියාවලිය බලගැන්වීම සඳහා ළමා ආරක්ෂක අධිකාරිය විසින් තම ක්‍රියාවලිය අනකුලනය කිරීම සඳහා අධිකරණය සමඟ සම්බන්ධීකරණය, නීති පද්ධතිය සඳහා ප්‍රමාණවත් සම්පත් වෙන්කිරීම සහ ළමා අපයෝජන නඩුවලට ප්‍රමුඛතාව දැක්වීම සඳහාවූ ප්‍රතිසංස්කරණ සඳහා පෙනී සිටීම ආදිය සිදු කල යුතුය.වැඩිමනත්ව ළමා ආරක්ෂක අධිකාරිය විසින් නඩු පසුපස හඹා යාම, නැඹුරුතා විශ්ලේෂණය, සහ සාක්ෂි මත පදනම්වූ තීරණ දැන්වීම ආදිය සඳහා මධ්‍යගත දත්ත පදනමක් ස්ථාපිත කිරීමේ අවශ්‍යතාවයද පවතී. එමඟින් සේවා සැපයුමේ හිඩැස් හඳුනා ගැනීම, ඵලදායි අයුරින් සම්පත් වෙන් කිරීම සහ ඉලක්කගත මැදිහත්වීම වර්ධනය කර ගත හැකිය. ළමා ආරක්ෂක අධිකාරිය විසින් ළමා ආරක්ෂණය සඳහා සුවිශේෂ පියවර රාශියක් ගෙන ඇති අතර, තවදුරටත් වර්ධනය කල යුතු ක්ෂේත්‍ර පිළිබඳව මෙම වාර්තාවෙන් ඉස්මතු කර දැක්වේ. තම බලපෑම ශුභවාදී කර ගැනීම පිණිස, ළමා ආරක්ෂක අධිකාරිය විසින් සම්පත් වෙන්කිරීම, අන්තර්-නියෝජිතායතන සම්බන්ධීකරණය සහ ප්‍රජා සම්බන්ධතා කටයුතු ආදියට ප්‍රමුඛතාව දිය යුතුය. නියාමන සහ පිරිඇගයුම් යාන්ත්‍රණය ශක්තිමත් කිරීම, මහජන දැනුවත්බව ඉහළ නැංවීම, සහ රජය සහ රාජ්‍ය නොවන සංවිධාන යන දෙපාර්ශවය සමගම සම්බන්ධීකරණය ගොඩ නැගීම ආදිය මඟින් ළමා ආරක්ෂක අධිකාරියට මතුවන අභියෝග වලට ඵලදායි අයුරින් මුහුණ දිය හැකි අතර, ළමා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමේ එහි හැකියාව වර්ධනය කර ගත හැකිය.



# 1 හැඳින්වීම

## 1.1 අරමුණ

ළමා ආරක්ෂක අධිකාරිය ශ්‍රී ලංකාවේ දරුවන්ගේ ආරක්ෂාවට වගකිව යුතු කේන්ද්‍රීය අධිකාරිය වන අතර, ආසන්න වශයෙන් මිලියන 7 ක්වූ දරුවන්ගේ යහපත සුරක්ෂිත කිරීම සඳහා අවශ්‍යතම කාර්ය භාරයක් ඉටු කරයි. මෙම වාර්තාව මඟින් 2014 (1) දක්වා කාලය සඳහා මහජනතාවට විවෘත ළමා ආරක්ෂක අධිකාරියේ වාර්ෂික වාර්තා, 2012 (2) වර්ෂයේ සිට ළම අපයෝජන පැමිණිලි පිළිබඳ සංඛ්‍යාත්මක දත්ත මෙන්ම විගණකාධිපතිවරයාගේ වාර්තා ද පරිශීලනය කරමින් ළමා ආරක්ෂක අධිකාරියේ කාර්ය සාධනය විශ්ලේෂණය කරනු ලබන්නේය. ළමයින්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් ළමා ආරක්ෂක අධිකාරිය විසින් ඉටු කරන තීරණාත්මක කාර්ය පිළිබඳව සැලකිල්ලට ගැනීමේදී, එහි කාර්ය සාධනය පිළිබඳව පූර්ණ ඇගයීමක් අත්‍යවශ්‍ය වේ. මෙම වාර්තාව මඟින් පවතින සුවිශේෂ විෂයමුල ග්‍රන්ථ (literature) ඉඩැස සපිරේ. මෙයට පසුබිම වන්නේ, 2010-2021 දක්වා කාලයේ ළමා අපයෝජන දණ්ඩ විනිශ්චයන් සහ 2020-2022 කාලයේ වාර්ෂික වාර්තා සම්බන්ධ තීක්ෂණ දත්ත සඳහා ප්‍රවේශය ලබා ගැනීම පිණිස සඡරදඉදබද (3) හි නීතිමය සහයෝගය ඇතිව ළමා හිංසනයට තිත පදනමේ (Stop Child Cruelty Trust) සභාපති වෛද්‍ය තුෂර වික්‍රමනායක විසින් මෑත කාලීන තොරතුරු දැන ගැනීමේ පනත යටතේ ගන්නා ලද පියවරයි.

ළමා ආරක්ෂක අධිකාරිය විසින් 1998 අංක 50 දරණ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනතට (මින්මතු "ළමා ආරක්ෂක අධිකාරිය පනත" යනුවෙන් හැඳින්වේ) අනුගත වීම පිළිබඳව අප විශ්ලේෂනය කරනුයේ පහත සඳහන් කරුණු පිළිබඳව අවධානය යොමු කිරීමෙනි:

- විමර්ශනය කිරීම, නඩු පැවරීම සහ ළමා අපයෝජන නඩු වලක්වා ගැනීම සඳහාවූ එහි ක්‍රියාකාරිත්ව නිපුණතාව,
- ළමා අපයෝජනය සහ ළමා ආරක්ෂක අධිකාරියේ කටයුතුවලට අදාල දත්ත වල ගුණාත්මකතාව සහ ප්‍රවේශය,
- ළමයින්ගේ ආරක්ෂණය සහ  ළමාරක ආරක්ෂක අධිකාරියේ සඵලතාව දියුණු කිරීම සහ ඉවැඩි කිරීම සඳහාවූ විභව ක්ෂේත්‍රයන්.

මෙම වාර්තාව මඟින් ළමා ආරක්ෂක අධිකාරියේ සඵලතාව සුවිශේෂි අයුරින් ඉවැඩි කිරීම සඳහාවූ උපායමාර්ගික නිර්දේශයන් සැපයේ. සාර්ථක දත්ත වාර්තාකරණය, ක්‍රියාවලි අනුකූලනය, සහ ශක්තිමත් සම්බන්ධීකරණය ගොඩ නැගීම මඟින් ළමා ආරක්ෂක අධිකාරිය ළමා ආරක්ෂණය පිළිබඳ පුරෝගාමි නියමුවා යන තලයට ඔසවා තබනු ඇත. මෙම නිර්දේශවල ප්‍රමුඛතාව දෙමින් යෝජිත වෙනස්කම් ක්‍රියාත්මක කිරීමට ඉක්මන් පියවර ගන්නා මෙන් අප ළමා ආරක්ෂක අධිකාරියෙන් ඉල්ලා සිටින්නෙමු.

## 1.2 ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සහ එහ කර්තව්‍යය පිළිබඳ ලුහුඬු විශ්ලේෂණයකි

ශ්‍රී ලංකාවේ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වනාහි, එය පිහිටුවීමට, කාර්යවලියට සහ බලයට අදාල නෛතික රාමුව සලසා ඇති ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනත ප්‍රකාරව ස්ථාපිත කරන ලද ව්‍යවස්ථාපිත කායකි. ළමාරක්ෂක අධිකාරියේ මූලික කර්තව්‍ය වනුයේ ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ළමා අපයෝජන වැලැක්වීමයි. ළමා අපයෝජන වැලැක්වීම, ළමා ආරක්ෂණය සහ අපයෝජනයට ලක්වූ ළමා වින්දිතයන්ට ප්‍රතිකාර කිරීම ආදිය සම්බන්ධ නීති ප්‍රවර්ධනය සහ බලාත්මක කිරීමේ බලය එයට පැවරී ඇත.එම අධිකාරිය ළමා ආරක්ෂාව පිළිබඳ ආණ්ඩුවේ ප්‍රධාන උපදේශකයා වශයෙන්ද කටයුතු කරයි. ළමා ආරක්ෂක අධිකාරිව පනතෙ 39 වන වගන්තිය ප්‍රකාරව ළමා අපචාරය (4) යන්න, දණ්ඩ නීති සංග්‍රහයේ (5), ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි නියුක්ත කිරීමේ පනතේ (6), ළමයින් හා යෞවනයන් පිළිබඳ ආඥාපනතේ (7) අදාළ වගන්ති හෝ අනිවාර්ය අධ්‍යාපන නියෝග (8) උල්ලංඝනය කිරීමක් වන්නාවූ, ළමයකුට අදාළව සිදු කරනු ලබන්නාවූ ද, යම් ක්‍රියාවක් නොකර හැරීමක් අදහස් වන බව අර්ථ දක්වා ඇත. සන්නද්ධ ගැටුමකට සම්බන්ධ ළමයකුට සිදුවිය හැකි ශාරීරික

---

[1] "Annual Reports". National Child Protection Authority, 2024
[2] The "1929" complaints statistics can be found on the National Child Protection Authority website. The statistics are disaggregated to No. of complaints per district and types of abuse. Statistical data is available from 2010 to 31.06.2024
[3[ Right to Information Win for Child Protection in Sri Lanka - iProbono.
[4] National Child Protection Authority Act, No. 50 of 1998.
[5] Penal Code of Sri Lanka
[6] The Employment, Young Persons and Children Act No. 47 of 1956.
[7] Children and Young Persons Ordinance No. 48 of 1939.
8] Ministry of Labour, Trade Union Relations and Sabaragamuwa Development. "The National Policy on Elimination of Child Labour in Sri Lanka." Ministry of Labour, Trade Union Relations and Sabaragamuwa Development. Date Accessed: 09.10.2024

හානිය හෝ ඔහුගේ හැඟීම්වලට සිදුවිය හැකි හානිය (9) සම්බන්ධයෙන්ද එම පනත අදාළ වේ. ළමා ආරක්ෂක අධිකාරිය පනතේ 14 වන වගන්තිය මඟින් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත පැවරී ඇති කර්තව්‍ය පිළිබඳ සවිස්තරාත්මකව දක්වා ඇත. මෙම කර්තව්‍යයන්ට ළමා අපචාරවලට සහ අපරාධමය විමර්ශනවලට ගොදුරුවූ ළමුන්ගේ ආරක්ෂාව සහ රැකවරණය තහවුරු කිරීම, ළමා ආරක්ෂාව පිළිබඳ කටයුතු වලදී ආණ්ඩුවට උපදේශාත්මක සේවාවන් සැපයීම, සහ ළමා ආරක්ෂක ප්‍රතිපත්ති සම්පාදනය සහ බලගැන්වීම ආදිය ඇතුලත් වේ. ඊටත් අමතරව, ළමා අපචාර මැඩපැවැත්වීම සඳහා සම්බන්ධීකරණය සහ අධීක්ෂන කටයුතු, ලමා අපචාර නඩු වාර්තාකරනය සහ විමර්ශනය, සහ අවදානමට ලක්ව ඇති දරුවන්ගේ ආරක්ෂාව පිළිබඳව මැදිහත්වීමේ වගකීමද ළමාරක්ෂක අධිකාරිය වෙත පැවරී ඇත.

අධිකාරිය විසින් මහජනතාව දැනුමවත් කිරීමේවැඩසටහන්ද පවත්වන අතර, ළමා ආරක්ෂණ ක්ෂෙත්‍රය තුල ශක්‍යතාව ගොඩ නැගීමටද කටයුතු කරන්නේය.

2012-2022 කාලය සඳහාවූ ළමා ආරක්ෂක අධිකාරියේ සංඛ්‍යාලේඛන වාර්තාවල ප්‍රධාන අනාවරණය මඟින්, සාමාන්‍යයෙන් වසරකට 1,990 ක් පමණ වන සහ මුළුමනින්ම 23,884 ක් වන පැමිණිලි අනුව, වැඩි වශයෙන් නිරන්තරයෙන්ම වාර්තා වන අපයෝජනයක් වශයෙන් ළමයින් කෲරත්වයට භාජනය කිරීම (10) පිළිබඳ ඒකාකාරී කෲරත්ව රටාවක් හඳුනාගෙන ඇත. මෙවන් පැමිණිලි විශාල ප්‍රමාණයකට හේතුවී ඇත්තේ අනිවාර්යය අධ්‍යාපනයේ ඌණතාවය, නොසැලකිල්ල සහ ලිංගික හිරිහැරයයි (11).




[9] see footnote [4]
[10] Section 308A of the Penal Code defines child cruelty as follows: "Whoever, having the custody, charge or care of any person under eighteen years of age, wilfully assaults, ill-treats, neglects, or abandons such person or causes or procures such person to be assaulted, ill-treated, neglected, or abandoned in a manner likely to cause him suffering or injury to health (including injury to, or loss of sight of hearing, or limb or organ of the body or any mental derangement), commits the offence of cruelty to children.
[11] Section 345 of the Penal Code defines sexual harassment as follows: "Whoever, by assault or use of criminal force, sexually harasses another person, or by the use of words or actions, causes sexual annoyance or harassment.

# 2. ක්‍රමවේදය

මෙම අධ්‍යයනය සඳහාවූ ක්‍රමවේදයට, ලබාගත හැකිවූ ළමා ආරක්ෂක අධිකාරියේ වාර්ෂික වාර්තා, සංඛ්‍යාලේඛන වාර්තා, සහ 2012-2022 දක්වා (ලබාගත හැකිවූ) විගණකාධිපතිවරයාගේ වාර්තාවන් පිළිබඳ සවිස්තරාත්මක විශ්ලේෂණ ඇතුලත් විය. ළමා ආරක්ෂක අධිකාරියේ කාර්ය සාධනය, පාලනය, මූල්‍යමය කාර්ය සාධනය සහ වගවීම ආදියට සබැඳි ප්‍රධාන මාතෘකා, රටාවන් සහ නැඹුරුව හඳුනා ගැනීම පිණිස ගුණාත්මක ප්‍රවේශයක් ප්‍රයෝජනයට ගනිමින් එකී ලේඛන විශ්ලේෂනය කරන ලදි.

මෙම ක්‍රමවේදයේ ප්‍රධාන අංගයක් වූයේ, ළමා ආරක්ෂක අධිකාරියේ හිඩැස් පිළිබඳ කරුණු පැහැදිලි කර ගැනීම සහ ආයතනයේ මෙහෙයුම් සහ අභියෝග පිළිබඳව වැඩිදුර අන්තර්දෘෂ්ටීන් ලබා ගැනීම පිණිස ළමා ආරක්ෂක අධිකාරියේ සභාපතිවරයා සහ අනෙකුත් නිලධාරීන් හමුවී සාකච්ඡා කිරීමය. 2024.10.30 දින පැවති මෙම හමුවේදී වැඩසටහන් දියත් කිරීම, දත්ත එකලැස් කිරීමේ ක්‍රියාවලිය, සහ වාර්තාකරණ යාන්ත්‍රණ (12) ආදියෙහි දුෂ්කරතා පිළිබඳව ගැඹුරු විශ්ලේෂණයකට අවස්ථාව සැලසින. ළමා ආරක්ෂණ කටයුතු මල නියැලී සිටින සහ උනන්දුව දක්වා පාර්ශවකරුවන් (පාර්ශවකරුවන්) සමඟින් ඍජුවම සම්බන්ධ වීම තුලින්, අපගේ විශ්ලේෂණයට සහ නිර්දේශවලට අවශ්‍ය අන්තර්දෘෂ්ටිය (insights) සහ සන්දර්භානුගත (contextual) දැනුම ලබා ගැනීම අපගේ අරමුණ විය.

කාලන්තරයක් තිස්සේ ළමාරක්ෂක අධිකාරියේ සමස්ථ කාර්ය සාධානයේ සිදුව ඇති වෙනස්කම් පිළිබඳව අප විසින් තුලනාත්මක විශ්ලේෂණයක් කරන ලදි. මෙම පිරිඇගයීම මඟින් 2012-2022 කාලය පුරාවට පහත සඳහන් නිර්ණායකයන් සම්බන්ධ ප්‍රගතිය තුලනය කෙරේ:

- කර්තව්‍ය ඉටුකිරීමේ කාර්ය සාධනය සහ සඵලතාව
- සම්පත් වෙන්කිරීම සහ උපයෝගී කර ගැනීම
- දේශීය සහ අන්තර්ජාතික පාර්ශවකරුවන් සමඟ සම්බන්ධීකරණය
- ප්‍රතිපත්ති අනුබලය
- අභියෝග සහ බාධක

මෙම විශ්ලේෂණයේ වලංගුතාව සහ විශ්වාසදායකත්වය ඉවැඩි කිරීම පිණිස දත්ත ත්‍රිකෝණකරණය (data triangulation) උපයෝගී කර ගන්නා ලදි. ස්ථාවර රටාවන් සහ අඩුලුහුඬුකම් හඳුනා ගැනීම පිණිස නොයෙකුත් ප්‍රභවයන් වෙතින් ලද නිරීක්ෂණ සංසන්දනය කිරීම මෙයට ඇතුලත් විය. වාර්ෂික වාර්තා, සංඛ්‍යාලේඛන වාර්තා, විගණකාධිපති වාර්තා ආදියෙන් ලබා ගත් දත්ත සහ ළමා ආරක්ෂක අධිකාරියේ සභාපතිවරයාගෙන් සහ අනෙකුත් පාර්ශවයන්ගෙන් ලබාගත් අන්තර්දෘෂ්ටින් විශ්ලේෂණය කිරීම තුලින්, ළමා ආරක්ෂක අධිකාරියේ කර්තව්‍ය ඉටු කිරීමේ කාර්ය සාධානයෙහි සඵලතාව පිළිබඳව පරිපූර්ණ ඇගයුමක් ඉදිරිපත් කිරීම මෙම විශ්ලේෂකයාගේ අරමුණ වේ.



[12] Stakeholder Consultation with Officials of the National Child Protection Authority on 30.10.2024

# 3. නිරීක්ෂණ

## 3.1. කර්තව්‍ය ඉටු කිරීමේ කාර්ය සාධනය

### 3.1.1. උපදේශාත්මක කාර්ය සාධනය

ළමා ආරක්ෂණය සහ අපයෝජනය වැළැක්වීම හා සම්බන්ධ කරුණු පිළිබඳව රජයට උපදෙස් ලබාදීමේ වැදගත් භූමිකාවක් ශ්‍රී ලංකාවේ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය ඉටු කරයි. ළමා ආරක්ෂක අධිකරිය පනත යටතේ ස්ථාපිත කරන ලද මෙම අධිකාරිය වෙත ළමයින් සුරක්ෂා කිරීම සඳහාවූ සර්වව්‍යාපී රාමුවක් සැකසීමට අත්‍යවශ්‍ය වන උපායමාර්ගික මඟ පෙන්වීම සහ ප්‍රතිපත්ති සම්පාදනය පැවරී ඇත.

පසුගිය දශකය තුල, නොයෙකුත් ආකාරයේ ළමා අපයෝජන පිළිබඳ වාර්තාවීම් වැඩිවීම මත ළමා ආරක්ෂණය සුරක්ෂිත කිරීම පිළිබඳ දැඩි අභියෝගයකට ශ්‍රී ලංකාවට මුහුණ දීමට සිදුවිය.මෙම ගැටළු තරණය කිරීම සඳහා, සමාජයේ බෙහෙවින් අවදානමට ලක්වන සාමාජිකයන් ආරක්ෂා කර ගැනීම පිණිස දැඩි ප්‍රතිපත්ති ප්‍රවර්ධනය කිරීම සඳහා රජයට අවශ්‍ය උපදෙස් ලබාදීමේ වැදගත් උපදේශාත්මක කාර්ය භාරය බෙහෙවින් ඉවහල් වේ.ළමා ආරක්ෂණය පිළිබඳව සාකල්‍ය (holistic) ප්‍රවේශයක් සහතික කිරීම තුලින් වැළැක්වීම සහ ආරක්ෂා කිරීම යන දෙයාකාරයේම ප්‍රතිපත්ති වර්ධනය කිරීම සඳහාවු අප රටේ හැකියාව කෙරෙහි ළමා ආරක්ෂක අධිකාරියේ උපදේශාත්මක කටයුතු වල සඵලතාවය සුවිශේෂ බලපෑමක් වන්නේය.

ළමා ආරක්ෂක අධිකාරියේ කර්තව්‍ය වල විස්තීර්ණතාව සැලකිල්ලට ගැනීමේදී, එහි උපදේශාත්මක කාර්ය භාරය ළමා ආරක්ෂණය සඳහාවූ සංකීර්ණ භූදර්ශනය තරණය කල හැකි ජාතික ප්‍රතිපත්ති සම්පාදනයට හේතුසාධක වේ. අධිකාරිය විසින් ප්‍රතිපත්ති සම්පාදනය සඳහා ආණ්ඩුවට මඟ පෙන්වීම පමණක් නොව, නොයෙකුත් අංශයන් සමඟින් සම්බන්ධීකරණය පිළිබඳවද වැදගත් කාර්ය භාරයක් ඉටු කරයි.

මෙම කණ්ඩයෙන් (section) , ළමා ආරක්ෂක අධිකාරිය විසින් ප්‍රතපත්ත සම්පාදනයට දායක වීම, එහි නිර්දේශ ක්‍රියාත්මක කිරීම, සහ පාර්ශවකරුවන් අතර සම්බන්ධීකරණය දියුණු කිරීම සඳහා පෙරමුණු කරගත් ප්‍රත්‍යුත්කර්ම කෙරෙහි අවධානය යොමු කරමින්, පසුගිය දසකය මුළුල්ලේ, අධිකාරියේ ප්‍රකාශිත කර්තව්‍ය සම්බන්ධයෙන් තම උපදේශාත්මක වගකීම ඉටු කිරීමෙහිලා වූ කාර්ය සාධනය පිළිබඳ ඇගයුමට ලක් කෙරේ.

ළමා ආරක්ෂක අධිකාරියේ උපදේශාත්මක කෘත්‍යයට පහත සඳහන්දෑ ද ඇතුලත්ය :

**14(අ) වගන්තිය**
ළමා අපචාර වැළැක්වීම සහ එවැනි අපචාරවලට ගොදුරුවූ ළමුන් පිළිබඳව ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරිමෙහි ලා ආණ්ඩුවට උපදෙස් දීම.

**14(ආ) වගන්තිය**
ළමා අපචාර වැළැක්වීම සඳහා ගත යුතු ක්‍රියා මාර්ග පිළිබඳව ආණ්ඩුවට උපදෙස් දීම.

**14(ඇ) වගන්තිය**
ළමා අපචාරවලට ගොදුරුවූවන් ආරක්ෂා කිරීම සඳහා ගත යුතු ක්‍රියා මාර්ග පිළිබඳව ආණ්ඩුවට උපදෙස් දීම.

**14:ඈ * වගන්තිය**
ළමා අපචාර වැළැක්වීම සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නීතිමය, පරිපාලනමය හෝ වෙනත් සංශෝධන නිර්දේශ කිරීම.

ප්‍රතිපත්ති සම්පාදනයට දායක වීම

ශ්‍රී ලංකාවේ ළමා අයිතිවාසිකම් සුරැකීමෙහි ලා, ළමා ආරක්ෂක අධිකාරියේ ප්‍රයත්නයේ ප්‍රධාන මෙවලමක් වනුයේ, ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය (13) ක්‍රියාත්මක කිරීම සඳහා සකසන ලද පස්-අවුරුදු (2020-2025) (14) කාර්ය සැලසුමයි. පස්-අවුරුදු කාර්ය සැලසුම වැඩිදියුණු කිරීම 2022 වර්ෂයේදී අවසන් විය (15). එකී සැලසුම ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීම පිණිස ළමා ආරක්ෂක අධිකාරිය විසින් ආරක්ෂක අමාත්‍යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය ඇතුළු නොයෙකුත් අමාත්‍යාංශ සමඟ පාර්ශවකරුවන් සඳහාවූ සාකච්ඡා පැවත්වීමට ක්‍රියාන්විතව පියවර ගෙන ඇත. එසේ වුවද, ළමා ආරක්ෂක අධිකාරියේ නිලධාරීන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදය පිළිබඳ කරුණු දක්වමින්, කොවිඩ්-19 වසංගතය සුවිශේෂ මූලංකයක් බවට දක්වා ඇත (16).

[13] News - COPE Committee Recommends for an Expeditious Implementation of the National Policy on Child Protection." Parliament.lk, 2021, parliament.lk/en/news-en/view/2057?category=33&tmpl=component&print=1. Accessed 09.10.2024.
[14] National Policy on Child Protection 2020
[15] Annual Report of the National Child Protection Authority, 2022.
[16] See Footnote 12

තවද, පොදු ව්‍යවසාය පිළිබඳ කාරක සභාවේ (COPE) සභාපති මහාචාර්ය චරිත හේරත්, ප්‍රසිද්ධියේම තම කලකිරීම ප්‍රකාශ කරමින්, ක්‍රියාවලිය ඉක්මන් කරන මෙන් ළමා ආරක්ෂක අධිකාරියට බල කර ඇත(17). මෙම ප්‍රමාදයන් නිසා ළමයින්ගේ ආරක්ෂණය සහ සුභසිද්ධිය කෙරෙහි බරපතළ ප්‍රතිවිපාක ගෙන දෙන්නක් විය හැකිය. මන්දගාමී ප්‍රගතියෙන් ප්‍රතිපත්තියේ විභව්‍ය :චදඑැබඑස්ක* ප්‍රතිලාභ ලුහුකොට සැලකීමේ අවදානම ඇති කරලන අතර, ළමා ආරක්ෂණය පිළිබඳ ගැටළු එලදායිව විසඳීමේ අධිකාරියේ හැකියාවට අවහිරයකි.

සුවිශේෂ ප්‍රමාදයන් තිබියදීත්, ජාතික ළමා ආරක්ෂක ප්‍රතිපත්තිය පිළිබඳ දැනුවත් කිරීම පතළ කිරීම සඳහාවූ වත්මන් පරිශ්‍රමයන් පිළිබඳව ළමාරක්ෂක අධිකාරියේ නිළධාරීන් කරුණු වාර්තා කර ඇත. ප්‍රතිපත්ති සම්පත් සංසදය විසින්, ක්‍ෂේත්‍ර චාරිකා සහ පොලිස් නිලධාරීන්, ළමාරක්ෂක අධිකාරියේ ක්‍ෂේත්‍ර සේවකයන්, අමාත්‍යාංශ නිලධාරීන් සහ පරිවාස නිලධාරීන්(18) ඇතුළු රාජ්‍ය සේවකයන් ඉලක්ක කර ගනිමින් දැනුවත් කිරීමේ වැඩ සටහන් සංවිධානය කර ඇත. කොවිඩ්-19 වසංගතය සහ දේශපාලන කැළඹීමෙන් අනතුරුව 2022 වර්ෂයේදී මුහුණ පෑමට සිදුවූ ආර්ථික අභියෝග ශමුවේ, දැනුවත් කිරීමේ වැඩ සටහන් 2022 දී නැවත ක්‍රියාත්මක වී ඇත. විශේෂයෙන්ම, ජාතික ළමා ආරක්ෂක ප්‍රතිපත්තිය පිළිබඳ තොරතුරු පතළ කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ පළාත් සභාවේ නිළධාරීන් 19 දෙනෙකු සම්පත් දායකයන් වශයෙන් පුහුණු කර ඇත(19).

ඉදිරි ගමනය සඳහා, තම පස්-අවුරුදු සැලැස්ම ක්‍රියාත්මක කිරීම පමණක් නොව, නිරන්තර නියාමන රාමුවක් ස්ථාපිත කිරීමද ළමා ආරක්ෂක අධිකාරියට අත්‍යවශ්‍ය කරුණකි. එවැනි යාන්ත්‍රණයක් මඟින්, ළමා ආරක්ෂක කමිටු වැනි ප්‍රත්‍යුත්ක්‍රම සජීවීව පවතිනු ඇති අතර, ප්‍රතිපත්ති නිර්දේශ තලයේ ප්‍රත්‍යක්ෂ දියුණුවට පෙරමග විවෘත කරන්නේය. මෙම ඉඩැස පිරවීම ශ්‍රී ලංකාවේ ළමා ආරක්ෂණ යාන්ත්‍රණය ශක්තිමත් කිරීමට ඉවහල් වනු ඇත.

## විවිධ-පාර්ශව සමඟ සම්බන්ධීකරණය

ක්‍රියාකාරිත්ව පාසල් ළමුන් ආරක්ෂක කමිටුවල පිරිහීම, පාසල්වල ළමයින්ගේ සුරක්ෂිතය පිළිබඳ සුවිශේෂ තර්ජනයක් එල්ල කරයි. අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් මුල පුරන ලද ළමා ආරක්ෂක කමිටු ස්ථාපිත කිරීමේ "සුරැකුම් පව්ව" වැඩසටහන(20) සුරක්ෂිත පාසල් පරිසරයක් නිර්මාණය කිරීම සඳහාවූ අදිටනක් වුවද, ක්‍රියාත්මක ළමා ආරක්ෂක කමිටුවල සංඛ්‍යාත්මක අඩුවීම එම අදිටන බෙලහීන කරයි.පාසල් ප්‍රජාව හවුල් කර ගැනීම, අපයෝජන වැලැක්වීම(21) සඳහාවූ මූල පිරිමට කාර්‍යශීලි සහ සහයෝගිතා අස්තයක් නිර්මානය කර දෙයි. පාසල්වල ක්‍රියාත්මකව තිබූ ළමා ආරක්ෂක කමිටුවල ප්‍රමාණය 2018 දී 3,165 සිට 2021 වන විට 2,392 දක්වා අඩුවී ඇත. දිවයින පුරා සියළුම පාසල් ආවරණය වන පරිදිවූ මෙම 35% සිට 23% දක්වාවූ අඩුවීම, විභව ලෙස ළමයින්ගේ ආරක්ෂණය සහ යහපත(22) අනතුරට ලක් කරයි. මෙම හීනවීමට සම්පත් නොමැතිවීම, දැනුවත්බවේ ඌණතාවය, හෝ ප්‍රජා සහභාගිත්වයේ ක්‍ෂයවීම ආදිය හේතු විය හැකිය. ළමයින්ගේ ආරක්ෂණය සහ සුභසිද්ධිය තහවුරු කිරීම පිණිස ළමා ආරක්ෂක කමිටු පුනර්වර්ථනය කර ශක්තිමත් කිරීම අත්‍යවශ්‍ය වේ.

ප්‍රමාණවත් පුහුණුව, සම්පත් සහ අඛණ්ඩ සහාය දැක්වීම මඟින් ළමා ආරක්ෂක අධිකාරිය විසින් ළමා ආරක්ෂණය පිළිබඳ ගැටළු එලදායීව විසඳීමට මෙම කමිටු බල ගැන්විය හැකිය. ඊටත් අමතරව, ළමා ආරක්ෂක අධිකාරියේ වැදගත්කම සහ ළමයින් ආරක්ෂණය කිරීම සම්බන්ධයෙන් වූ එහි භූමිකාව පිළිබඳව දැනුවත්භාවය ඉහළ නැංවීම, ප්‍රජා සහභාගිත්වයට අනුබල දීමට අනිවාර්‍යය වේ. මෙම ගැටළුව විසඳීමට අපොහොසත් වුවහොත්, ළමයින් අපයෝජනයට නිරාවරණය වීමේ අවදානම් තත්වය, නොසැලකිල්ල සහ උපයෝජනය (exploitation) වැඩිවීම ඇතුළු බරපතළ ආනුශංගිකයනට මුහුණ දීමට සිදුවනු ඇත.

ඊටත් අමතරව, පසුගිය දසකයට අධික කාලයක් පුරාවට, ළමා ආරක්ෂණය ප්‍රවර්ධනය සඳහා රජයේ ආයතන, අදාළ අමාත්‍යාංශ සහ වෙනත් පාර්ශවකරුවන් සමග සම්බන්ධීකරණයෙන් ළමා ආරක්ෂක අධිකාරිය වැදගත් ප්‍රත්‍යුත්කර්ම රාශියක් දියත් කර ඇත. එවන් ප්‍රයත්නයන් අතර, සුවිශේෂ වාතාවරණයන් හි ළමා ආරක්ෂණය පිළිබඳව ගත යුතු පියවර පිළිබඳව නියෝග සහ මාර්ගෝපදේශ නිකුත් කිරීමද සිදු කර ඇත.

අනතුරුදායක පසුතල වල සේවයේ නියුක්ත කිරීමෙන් ළමයින් ආරක්ෂණය කර ගැනීම සඳහා ළමා ආරක්ෂක අධිකාරිය විසින් කම්කරු සබඳතා සහ එලදායිතා වර්ධන අමත්‍යාංශයේ සහයෝගීතාව ඇතිව අන්තරායාකාර රැකියා රෙගුලාසි(23) (Hazardous Occupation Regulations) සැකසීම සැලකිය යුතු කර්තව්‍යයක්. මෙම රෙගුලාසිවල අරමුණ වනුයේ, උපද්‍රව සහ උපයෝජනය හීන කිරීම, අන්තරායාකාර කම්කරු පරිචයන්ගෙන් (Labour Practices)

[17] See Footnote 13
[18] See Footnote 12
[19] See Footnote 15
[20] Ministry of Education Circular No. 17/11
[21] Annual Report of the National Child Protection Authority, 2019
[22] "Child Sexual Abuse in Sri Lanka." Stopchildcruelty.com 2020
[23] The Gazette Extraordinary of the Democratic Socialist Republic of Sri Lanka No. 1667/41 published on 20.08.2010

ළමයින්ගේ ආරක්ෂාව සහතික කිරීමයි. ඊටත් අමතරව, අනිවාර්ය අධ්‍යාපනය සහතික කරන ලෙසටවූ නියෝගයෙන් පාසල් යැවීම අනිවාර්ය කිරීමෙන් අධ්‍යාපනය සඳහාවූ අයිතිවාසිකම සවිගැන්වෙන අතර, එමගින් ළමයින් උපයෝජනයට ලක් කිරීමේ හෝ බලහත්කාරයෙන් සෙවයේ නියුක්ත කිරීමේ අවදානම අඩුවේ. එසේ වුවත්, මෙම රෙගුලාසි ක්‍රියාත්මක කිරීම හෝ ඒවායේ සමස්ත සාර්ථකත්වය වාර්ෂික වාර්තාවල සංෂිප්තව දැක්වීමට අපොහොසත්වී ඇත. මෙම විස්තීර්ණ දත්ත සහ විශ්ලේෂන හීනතාවය නිසා ළමා ආරක්ෂණය සඳහාවූ මෙම ක්‍රියාමාර්ගවල ධනාත්මක බලපෑම ඇගයීමට දුෂ්කර වී ඇත(24).

ළමා ආරක්ෂක අධිකාරියේ මාර්ගපෝදේශ, දිවයින පුරා ස්ථාවර සහ ඉහළ ප්‍රමිතියෙන් යුතු ළමා සුරැකුම් පහසුකම් ප්‍රවර්ධනය දක්වා විහිදේ. ළමයින් සඳහා ආරක්ෂිත සහ පෝෂකර පරිසරයක් සහතික කිරීමට උපකාරී වන ක්‍රමවේද දිවා සුරැකුම් මාර්ගෝපදේශ 2019(25) (Daycare Guidelines) පොදු ළමා ආරක්ෂණ විෂය මාලාව(26) (The General Child Care Curriculum) සහ ශ්‍රී ලංකා ළමා සංවර්ධන මධ්‍යස්ථාන සඳහා ජාතික මාර්ගෝපදේශ සහ අවම ප්‍රමිති(27) (The National Guidelines & Maximum Standards for Child Development Centres in Sri Lanka) වැනි වැදගත් ලේඛනවලින් සම්පාදනය කෙරේ.

මෙම මාර්ගෝපදේශ සමගින්වූ දිවා සුරැකුම් මධ්‍යස්ථාන පහසුකම් පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක්, රට පුරා ළමා සුරැකුම් සේවාවන්හි ගුණාත්මකභාවය ඉවැඩි කිරීම සඳහාවූ අධිකාරියේ කැපවීම අවධාරණය කෙරේ.

එසේ වුවද, ඉහත සඳහන් ක්‍රියාදාම බලාත්මක කිරීම සහ එහි බලපෑම පිළිබඳව විස්තීර්ණ දත්ත සහ විශ්ලේෂන හීනවීම ඒවායේ ඵලදායිතාව පිළිබඳ විස්තීර්ණ ඇගයීමකට බාධාවකි. මෙම ප්‍රත්‍යුත්ක්‍රම වල ප්‍රතිඵල පිරිඇගයීම මගින්, ළමා ආරක්ෂක අධිකාරියට ඒවායේ ශක්තිය, දුර්වලතා සහ වැඩිදියුණුව සඳහාවූ ඉඩප්‍රස්ථා හඳුනාගත හැකිවනු ඇත. මෙම සාක්ෂිබර ප්‍රවේශය ළමා ආරක්ෂක අධිකාරියට තම උපායමාර්ග ප්‍රසාධනය (refine) බිරීම, සම්පත් ඵලදායී අයුරින් වෙන් කිරීම, සහ අත්‍යන්තව (ultimately) ශ්‍රී ලංකාවේ ළමා ආරක්ෂණය පිළිබඳව එහි බලපෑම ඉවැඩි කල හැකිය.

## ප්‍රධාන නිර්දේශ

**1** **ප්‍රතිපත්ති සම්පාදනය යුහුසුළු කිරීම:**
ක්‍රියාවලිය බලගැන්වීම අනුකූලනය සහ සීඝ්‍රවත් කිරීම සඳහා පස්-අවුරුදු කාර්ය සැලසුමේ එක් එක් අදියර සඳහා සුවිශේෂ කාලනිර්මිත ඉලක්ක නියම කිරීම.

**2** **නියාමන රාමු ඉවැඩි කිරීම:**
පස්-අවුරුදු සැලැස්මේ ප්‍රගතිය පිරිඇගයුම සඳහා විධිමත් නියාමන මූලලේඛ සහ වාර්තාකරණ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම. ආණ්ඩුව සහ පොදු පාර්ශවයන් වෙත විනිවිදාත්මක වාර්තා සැපයීම සහිත ත්‍රෛමාසික පිරිඇගයුම් අනිවාර්ය කිරීම.

**3** **සම්පත් වෙන්කිරීම ඉවැඩි කිරීම:**
කාර්ය සාධනයට ක්‍රියාත්මක සහාය දැක්වීම පිණිස මුදල් හා කාර්ය මණ්ඩල ඇතුළු ප්‍රමාණවත් සම්පත් වෙන්කිරීම තහවුරු කිරීම.

**4** **ඉලක්කගත සහාය සමග ළමා ආරක්ෂක කමිටු පුනර්වර්තනය කිරීම:**
ළමා ආරක්ෂක කමිටු ක්‍රියාත්මකව පැවතීම සහතික වීම සඳහා අඛණ්ඩ මූල්‍යමය සහ ප්‍රවර්ධනමය සහාය ලබාදීම. කමිටු සාමාජිකයන් වෙත විධිමත් පුහුණුව සහ සම්පත් සම්පාදනය ඔවුන්ගේ ඵලදායිතාව වර්ධනය කරනු ඇත.

**5** **පළාත් ප්‍රජාව සමග සම්බන්ධීකරණය වර්ධනය කිරීම:**
සහභාගිත්වය සහ දැනුවත්භාවය පවත්වාගෙන යාම සඳහා ප්‍රජාව වෙත සමීප වීමේ ප්‍රත්‍යුත්ක්‍රම ක්‍රියාත්මක කිරීම.ප්‍රජා හිමිකම සහ වගවීම සහතික වීම සඳහා පළාත් නායකයින් සහ පාර්ශවකරුවන් සම්බන්ධ කර ගැනීම.

[24] New Education Act for General Education in Sri Lanka: Final Report
[25] National Guidelines for Child Day Care Centres in Sri Lanka 2019
[26] Trainers Guide: General Child Care Course for Careers in Child Caregiving, 2019
[27] National Guidelines for Minimum Standards at Child Development Centres in Sri Lanka 2019

### 3.1.2. දැනුවත්බව සහ ශාස්ත්‍රඥානය

අපයෝජන වාර්තා නොකිරීම සහ සංස්කෘතිමය බාධාවන් නිසා, ළමා ආරක්ෂණ අභියෝග රැසකට මුහුණ දීමට සිදුව ඇති රටක, එම තත්වය වෙනස් කිරීම සඳහාවූ මූලික උපායමාර්ග වනුයේ මහජනතාව අතර දැනුවත් භාවය වැඩිකිරීම සහ ඉගැන්වීමයි. ළමයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ වැටහීම වර්ධනය කිරීම සහ විරෝධාකල්ප වැළැක්වීම ප්‍රවර්ධනය කිරීම මඟින්, ළමා අපයොජන සිද්ධීන් පිළිබඳව ඵලදායිව අවධානය යොමු කොට වලක්වා ගැනීම සඳහා ප්‍රජාව, පවුල් සහ දරුවන් බලගැන්වීමට ළමා ආරක්ෂක අධිකාරිය අපෙක්ෂා කරයි. එහි කර්තව්‍ය මඟින් ළමා අයිතිවාසිකම් සුරැකීම සහ සුභසිද්ධිය ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගත් පුළුල් ක්‍රියා සමුදායක් සම්පාදනය කර ඇත. මෙම කණ්ඩයෙන්, ශ්‍රී ලංකාව පුරාවටම ළමා ආරක්ෂණය ඉවැඩි කිරීම සඳහාවූ අධිකාරියේ වැඩසටහන් වලට ලඟාවීමේ හැකියාව, ස්ථාවරත්වය සහ බලපෑම යන කරුණු පිළිබඳව අවධානය යොමු කරමින්, ළමා ආරක්ෂක අධිකාරියේ දැනුවත් කිරීම් සහ අධ්‍යාපන කටයුතු වල ඵලදායිතාව විමර්ශනය කෙරේ.

ළමා ආරක්ෂක අධිකාරියේ දැනුවත් කිරීම් හා අධ්‍යාපන කටයුතු වලට පහත සඳහන්දෑ ඇතුලත්ය:

> 14(ඇ) වගන්තිය
> අපචාරවලින් ආරක්ෂා කරනු ලැබීමට ළමයින් සතු අයිතිවාසිකම් පිළිබඳව සහ ළමා අපචාර වැළැක්වීමේ ක්‍රම පිළිබඳව දැනුවත් කිරීම.

> 14(ජ) වගන්තිය
> ළමයින්ගේ සුරක්ෂිතභාවය සහ ළමයින්ගේ අයිතින් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ජනතාවට තොරතුරු සැපයීම සහ අධ්‍යාපනය ලබාදීම.

> 14(ඬ) වගන්තිය
> ළමා අපචාර පිළිබඳව වැඩමුළු, සම්මන්ත්‍රණ සහ සාකච්ඡා සංවිධානය කිරීම සහ පහසුකම් සැපයීම.

මෙම නෛතික ප්‍රතිපාදන මඟින්, "ආරක්ෂාවේ ඇරඹුම දැනුවත්භව" යන්න අවධාරණය කරමින් රට පුරා ප්‍රජාව සම්බන්ධ කර ගැනීම සම්බන්ධයෙන් වූ ළමා ආරක්ෂක අධිකාරියේ උපාය මාර්ගික ආයාසයට පදනම සපයයි.

මෙම ඉලක්ක කරාවූ ළමා ආරක්ෂක අධිකාරියේ කැපවීම, විරෝධාකල්ප වැළැක්වීමේ සංස්කෘතියක් ගොඩ නැගීම අරමුණු කරගත් නොයෙකුත් ප්‍රත්‍යුත්ක්‍රම මඟින් සාක්ෂාත් වේ.

ළමා ආරක්ෂක අධිකාරිය විසින් පුළුල් සමාජ සහභාගිත්වය දිරිගැන්වීම මඟින් දැනුවත්භව, අධ්‍යාපනය සහ සහයෝගිතාව අනකුලනය කරන සාකල්‍ය ප්‍රවේශයක් ප්‍රවර්ධනය කරන අතර, එමඟින් එහි උපාය මාර්ග මෙහෙයවන දැනුවත්භව පදනම් කරගත් ක්‍රියා රාමුවක් දිරිමත් කිරීම, ළමා ආරක්ෂණය පිළිබඳව අධිකාරියේ ප්‍රවේශය ගෙනහැර දක්වයි.

පාරශවකරුවන් සමඟවූ සහයෝගිතාව මත, අපචාරවල මූල හේතු පිළිබඳව සොයා බැලීම සඳහා තීරණාත්මක සාක්ෂි මත පදනම්වූ විසඳුම් වැඩිදියුණු කිරීමට ළමා ආරක්ෂක අධිකාරියට හැකියාව ලැබෙනු ඇත. තම වෙබ්අඩවි, ප්‍රකාශනයන් (28) සහ වෙනත් වේදිකා මඟින්, ළමයින් ආරක්ෂා කිරීම සඳහාවූ ප්‍රායෝගික දැනුම සහ මෙවලම් පිළිබඳව මහජනතාව සහ නොයෙකුත් පාර්ශවකරුවන් සවිමත් කිරීම අධිකාරියේ අරමුණ වී ඇත. අත්‍යවශ්‍ය තොරතුරු ක්ෂණයකින් ලබාගත හැකි බව සහතික වෙමින්, අපයෝජන හඳුනාගැනීම සහ ඊට ප්‍රතිචාර දැක්වීම සඳහාව පිවිසිය හැකි මාර්ගෝපදේශ මෙයට ඇතුලත්ය. විවිධ පාර්ශව සමග සම්බන්ධීකරණයේ වැදගත්කම හඳුනා ගනිමින්, ළමා උපයෝජන අවදානම අවම කිරීම සඳහා සංචාරක වැනි කර්මාන්ත සමඟ ළමා ආරක්ෂක අධිකාරිය සමීපව කටයුතු කරයි. පාර්ශවකරුවන් සම්බන්ධ කර ගැනීමෙන් සහ ඉහළ පරිචයන් බෙදා ගැනීම මඟින්, විවිධ තලයන්හිදී ළමයින්ට සුරක්ෂිත පරිසරයක් සැකසීම අධිකාරියේ අරමුණ වන අතර, එමඟින් ළමා ආරක්ෂණය පිළිබඳ එහි විස්තීර්ණ ප්‍රවේශය පිළිබිඹු වේ.

<u>මහජනයා දැනුවත් කිරීමේ වැඩ සටහන්</u>

ළමා ආරක්ෂක අධිකාරිය විසින් ජන පවුර වැඩසටහන සහ එහි මහජන දැනුවත් කිරීමේ ප්‍රචාරණය ක්‍රියාත්මක කිරීම, ශ්‍රී ලංකාවේ ළමා ආරක්ෂණය ශක්තිමත් කිරීම සඳහාවූ වැදගත් පියවරකි. මෙම ප්‍රත්‍යුත්ක්‍රමයේ අරමුණ වනුයේ, ප්‍රජා සහභාගිත්වය සහ දැනුවත්බව පිළිදැගුමෙන්, ළමයින් සඳහා ආරක්ෂිත පරිසරයක් නිර්මාණය කිරීමයි. මෙම වැඩසටහන මඟින්, සංක්‍රමණික කම්කරුවන්ගේ දරුවන් වැනි අවදානමයට භාජනය වියහැකි කණ්ඩායම් සඳහා දත්ත එක්රැස් කිරීම, ගම් මට්ටමේ යාන්ත්‍රණ, සහ ඉලක්කගත මැදිහත්වීම් අවධාරණය කරන අතර, ළමයින්ට මුහුණ දීමට සිදුව ඇති බහුවිධ අභියෝග තරණය කිරීම සඳහා විස්තීර්ණ ප්‍රවේශයක් ප්‍රදර්ශනය කරයි. එසේ වුවද, මෙම උපායමාර්ගවල දිගු-කාලීන බලපෑම සහ ළමා අපයෝජනය වැළැක්වීමේ එහි ඵලදායිතාව රඳා පවතිනුයේ සුනිත්‍ය පරිශ්‍රමයන්, ප්‍රමාණවත් සම්පත් වෙන් කිරීම, සහ ළමා ආරක්ෂක අධිකාරිය සහ වෙනත් අදාළ පාර්ශවකරුවන් අතරවූ ශක්තිමත් සම්බන්ධීකරණය මතය(29).

[28] Progress and Performance Report 2021 (page 79)
[29] See Footnote 21

__පාර්ශවකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන්__

අපයෝජනයට ලක්වූ, අවදානමට භාජනය වියහැකි සහ අතිශය අවදානමට විවෘත ළමයින්ට මානසික සෞඛ්‍ය සහ මනෝ සමාජයීය (Psychosocial) සහාය ලබාදීම සඳහා " දිරිය" වැඩසටහන ක්‍රියාත්මක කරමින් ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන, ප්‍රාථමික පාසල් ගුරුවරුන් සඳහා ධනාත්මක විනය, සහ සේවා නියුක්තිකයන්ගේ මනෝ සමාජයීය කළමණාකරනය පිළිබඳ ජාතික මාර්ගෝපදේශ සම්බන්ධයෙන් රජයේ නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් මෙහෙය වීමේ, සහ රැඳවුම් නිවාසවල, සහතික පාසල්වල සහ ළමා වර්ධන මධ්‍යස්ථානවල කාර්ය මණ්ඩල සහ ළමුන් සඳහා මානෝ සමාජයීය කළමණාකරණ සේවාවන් සහ පුහුණුවීම් වැඩසටහන් සම්පාදනය කරමින්, "සියපත සුරැකුම" (30) ව්‍යාපෘතිය තුලින් පාසල්වල සහ මුහුදුබඩ ප්‍රදේශවල දැනුවත් කිරීමේ වැඩසටහන් මෙහෙය වීමේ සහ පාසල් සිසුන්ගේ මානසික සෞඛ්‍යයට සහාය දීම සඳහා පාසල් උපදේශයකයන්ගේ හැකියාවන් ඉවැඩි කිරීමේ මනෝ සමාජයීය පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමෙහිලා අධිකාරිය සක්‍රියව ක්‍රියාත්මක වෙමින් පවතී (31). ළමා ආරක්ෂක අධිකාරිය විසින් ප්‍රවාහණ සහ මහාමාර්ග අමාත්‍යාංශයේ සහයෝගිතාව ඇතුව තම දියාමනය පාසල් ප්‍රවාහණ රථ රියදුරන් (32) දක්වා දිගු කිරීමට පියවර ගෙන ඇත.

ළමා ආරක්ෂක අධිකාරියේ පරිශ්‍රමය තුලට, පුහුණුකිරීම් සහ හැකියා-වර්ධන වැඩසටහන් මඟින් වෛද්‍ය වෘත්තීකයන්(33), ගුරුවරුන්(34) සහ නීතිය ක්‍රියාත්මක කිරීමේ සේවක මණ්ඩල (35) වැනි පාර්ශව බලගැන්වීම සඳහාවූ හැකියා වර්ධන වැඩසටහන්, ළමා ආරක්ෂණය ප්‍රවර්ධනය සඳහා පාර්ශවකරුවන් සහ ළමුන් යන දෙපිරිසම ඉලක්ක කරගත් දැනුවත් කිරිමේ ප්‍රචාරණයන් මෙහෙය වීම (36), ළමා ආරක්ෂණ පියවර ශක්තිමත් කරන නීති සහ ප්‍රතිපත්ති වෙනුවෙන් පෙනී සිටීම, සහ ක්ෂණික සෘජු දුරකථන මාර්ග, විශේෂ කාර්ය බයන් සහ පාසල් ආරක්ෂක කමිටු වැනි අතශවශ්‍ය යාන්ත්‍රණ පිහිටුවාලීම (37) යනාදියත් ඇතුලත්ය.

2015 (38) සිට 2018 (39) දක්වා සෞඛ්‍ය වෘත්තීකයන් සඳහා මෙයෙහවන ලද දැනුවත් කිරීමේ වැඩසටහන සම්බන්ධයෙන් වැදගත් නිරීක්ෂනයක් වනුයේ, ප්‍රතිලාභීන් සංඛ්‍යාවේ සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම කිරීම වන අතර, ළමා ආරක්ෂණය සඳහා සෞඛ්‍ය වෘත්තීකයන් පුහුණු කිරීම් වැඩි කිරීමේ අවශ්‍යතාවය පෙන්නුම් කරයි. 2019(40), 2020(41) සහ 2021(42) වර්ෂවල පුහුණු කිරීම් කටයුතු වල තියුණු පිරිහිමක් පෙන්නුම් කෙරේ. මෙයට, 2019 පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරය සහ කොවිඩ් 19 වසංගතය හේතු විය හැකි අතර, එමඟින් 2020 වර්ෂයේ ළමා ආරක්ෂක අධිකාරියේ මෙහෙයුම් අතහැරතම සම්පත් හදිසි අර්බුද සඳහා හැරවීම සිදුවිය.

2021 වර්ෂයේ සැලකිය යුතු පසුබැම් තුලින්, වසංගතය සහ බෝම්බ ප්‍රහාරය නිසා සිදුවූ බිඳ වැටීම් වලින් ප්‍රකෘතිමත් වීමේ වත්මන් අභියෝග පෙන්නුම් කරයි.

__වැඩසටහන් පිරිඇගයුම__

ළමා ආරක්ෂක අධිකාරිය විසින් පුළුල් පරාස්සයකින් යුතු වැඩසහන් ක්‍රියාත්මක කර ඇති නමුත්, නොයෙකුත් සාධක මත එහි දිගු-කාලීන බලපෑම පිළිබඳ විස්තීර්ණ ඇගයීමක් කිරීම අභියෝගයක් බවට පත්ව ඇත.

---

[30] See Footnote 21
[31] The NCPA offers various psychosocial services such as counselling, awareness programmes to children, parents along with trainings to schoolteachers, NCPA officials on providing said psychosocial services. Psychosocial services are also offered via the "1929" Child Helpline. The NCPA also prepares guidelines, curriculums on psychosocial services for the prevention of child abuse.
[32] See Footnote 12
[33] Trainings are conducted for nursing officers, doctors engaged in postgraduate medical degrees, family health services officers, public health inspectors, trainee dental officers.
[34] Trainings are conducted for teacher trainees of the National College of Education.
[35] Trainings are conducted for police officers and officers at the Police Training Academy.
[36] Programmes include awareness workshops to children and families at village level, tea estate communities, coastal communities and fishing communities
[37] See Footnote 12
[38] No. of health professionals who received trainings in 2015 is 620
[39] No. of health professionals who received trainings in 2018 is 2118
[40] No. of health professionals who received trainings in 2019 is 1770
[41] No. of health professionals who received trainings in 2020 is 117
[42] No. of health professionals who received trainings in 2021 is 48

වාර්ෂික වාර්තාවල, සුවිශේෂ වැඩසටහන්වල ප්‍රතිඵල සහ බලපෑම පිළිබඳ සැලකිය යුතු සවිස්තරාත්මක දත්ත හීනතාවක් පවතින අතර, එබැවින් මෙම ප්‍රත්‍යුත්ක්‍රම වල දිගු-කාලීන බලපෑම පිළිබඳව ඇගයීමේ දුෂ්කරතාවක් පැන නැගී ඇත. ළමා ආරක්ෂක අධිකාරියට මානව සහ මුල්‍ය සම්පත් සීමාවන්ට මුහුණ දීමට සිදුව ඇති අතර, එහෙයින් එකී වැඩසටහන් පිළිබඳව පරිපූර්ණ පසු විපරමේ තුලනීක්ෂණය සහ පිරිඇගයුම පිළිබඳ හැකියාවන්ට බාධා පමුණුවා ඇත (43). ළමා ආරක්ෂක අධිකාරියේ නිලධාරීන් විසින්, අධිකාරියේ වැඩසටහන් වල විෂයපථය සහ ඔවුන්ගේ වාර්තාගත ක්‍රියාකාරකම් වල ප්‍රමාණය අතර පවතින සුවිශේෂ අසමානකම් ඉසුමතු කර දක්වන ලදි. ළමා ආරක්ෂක අධිකාරිය, ළමා ආරක්ෂණ දැනුම සහ ළමා අපයෝජන හඳුනා ගැනීම ඉවැඩි කිරීම සඳහා ප්‍රජාමූලක කුසලතා පුහුණුව ඇතුළු, නොයෙකුත් ප්‍රත්‍යුත්ක්‍රම වල ක්‍රියාත්මකව නියැලී ඇති නමුත්, වත්මන් වාර්තාකරණ යාන්ත්‍රණයෙන් එම ප්‍රයත්නයන්හි පූර්ණ බලපෑම ප්‍රමාණවත් අයුරින් විදහා දැක්වීමට අපොහොසත් වී ඇත.

වාර්තා මගින් නිරතුරුවම ක්‍රියාත්මක කටයුතු විදහා දැක්වුවද, මෙම ප්‍රත්‍යුත්කර්මයන්වල සාර්ථකත්වයට සාපෙක්ෂ මිණුම කල හැකි සුවිශේෂ ප්‍රමිතික, මිණුම් ලකුණු හෝ ඉලක්ක සම්පාදනය ඉතා විරලය. සාර්ථකත්වය සඳහා පැහැදිලිව අර්ථ දක්වන ලද ඉලක්ක හෝ උපමානයන් නොමැතිව, මෙම වැඩසටහන් මගින් විසඳීමට අරමුණු කරන ලද ගැටළුවලට ඵලදායීව යොමුවී ඇත්තේ දැයි ඇගයීම දුෂ්කරය. වැඩිමනත්ව, මෙම වැඩසටහන්වල සෘජු ප්‍රතිඵල සහ බලපෑම් පිළිබඳව තොරතුරු හීනතාවය නිසා, සම්පත් ඵලදායිව උපයෝගී කරගෙන ඇත්තේද හෝ ළමා ආරක්ෂක අධිකාරියේ උපායමාර්ගවල ඵලදායිතාව සඳහා වෙනස්කම් හෝ දියුණු කිරීම් අවශ්‍යද යන්න තීරණය කිරීම අභියෝගාත්මක වී ඇත. වැඩිදුර විනිවිදභාවයෙන් යුතු සහ විස්තීර්ණ වාර්තාවලින් තොරව, ළමා ආරක්ෂක අධිකාරියේ බලපෑමේ සත්‍ය තත්වය වටහා ගැනීමට සහ එහි කාර්ය සාධනය සඳහා ආයතනය වගකීමට ග්‍රහණය කර ගැනීමට භාහිර පාර්ශව ප්‍රතිපත්ති සම්පාදකයන්, පරිත්‍යාගශීලීන් සහ මහජනතාව ඇතුළු භාහිර පාර්ශවකරුවන්ට දුෂ්කරය.

<u>වැඩසටහන් බාරදීම</u>

වැඩිමනත්ව, විගණකාධිපතිවරයාගේ වාර්තා මගින් බොහෝ ව්‍යාපෘතිවලට අදාල කළමණාකරණය සහ බලත්මක කිරීම පිළිබඳව බරපතළ අවධානය යොමු කර ඇත (44). ව්‍යාපෘති ඉලක්ක සපුරාලීමේ ප්‍රමාදය සහ අපෙක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට නොහැකි වීමෙන් අදහස් කෙරෙනුයේ ඵලරහිත ව්‍යාපෘති කළමණාකරණ පරිචයන්ය.මෙම ගැටළු සඳහා වන හේතු සාධක අතර, ප්‍රමාණවත් මානව සම්පත්, ආම්පන්න සහ යටිතල පහසුකම් හිඟය (45) ද ඇතුලත්ය.

මෙම පසුබෑම ප්‍රමාණවත් සම්පත් සහ යටිතල පහසුකම් හිඟයෙන් මතුවිය හැකි අතර, එමගින් කාලෝචිත අයුරින් බරපතල ළමා ආරක්ෂණ ගැටළු වලට විසඳුම් සෙවීමේ ළමා ආරක්ෂක අධිකාරියේ ප්‍රයත්නයන් හැල්ලුවට ලක් කරයි. වැඩිමනත්ව, ව්‍යාපෘති ප්‍රමුඛතා අව-පෙළගැස්මෙන්, අවස්ථාවන් මඟ හැරීමට, හදිසි අවශ්‍යතාවන් පිළිබඳව අවධානය වෙනතකට යොමු කිරීම සහ ආයතනයේ සහමූලික බලපෑම හීන කිරීමට ඉඩ සැලසී ඇත.මෙම ගැටළු විසඳා ගැනීම, වඩාත් ඵලදායි අයුරින් තම කර්තව්‍ය ඉටු කිරීමට ළමා ආරක්ෂක අධිකාරියට තීරණාත්මක වනු ඇත.

ළමා ආරක්ෂක අධිකාරියේ වැඩසටහන් වල බලපෑම ඉවැඩි කිරීම සඳහා, ව්‍යාපෘති කළමණාකරණ පරිචයන් ශක්තිමත් කිරීම, ප්‍රමාණවත් සම්පත් සහතික කිරීම, වැඩසටහන් වඩාත් හොඳින් නිරීක්ෂණය සහ පිරිඇගයුම සහ වැදගත් ප්‍රත්‍යුත්කර්ම වලට ප්‍රමුඛතාවය දීම අත්‍යවශ්‍ය වේ.

## <u>ප්‍රධාන නිර්දේශ</u>

**1**

**ප්‍රතිඵල පදනම් කරගත් වාර්තාකරණයක් හඳුන්වා දීම:**
සක්‍රියතා දත්ත සමගින් ප්‍රතිඵල ප්‍රමිතික ඇතුලත් කරමින් වාර්ෂික වාර්තාවල ආකෘතිය වෙනස් කිරීම. ඉලක්කගත ක්ෂේත්‍ර තුල ළමා අපයෝජන වාර්තාකරණයේ අනුපාතයන් වර්ධනය හෝ අපයෝජන සිද්ධීන් අඩුකිරීම වැනි සාර්ථකත්ව නිර්ණායකයන් ස්ථාපිත කිරීම.

**2**

**නම්‍යශීලී සහ අනුවර්ත්‍ය පුහුණු වැඩසහන් වර්ධනය කිරීම:**
අනාගත අර්බුදවල බලපෑම ලුහු කිරීම සඳහා නොයෙකුත් නිමැවුම් මගින් බෙදාහැරීමට අවසර දීම (උදා: මාර්ගස්ථ, දෙමුහුන්, පුද්ගලිකව).

**3**

**බලපෑම් ඇගයුම් මෙහෙයවීම:**
ප්‍රචාරණයන් සහ වැඩසටහන් වල දිගු කාලීන ඵලදායිතාව මිණීම සඳහා නිරන්තර බලපෑම් පිරිඇගයුම් බලාත්මක කිරීම.මෙම ඇගයුම් මගින්, හැසිරීම් චර්යා වෙනස්කම් විශ්ලේෂණය කල යුතු අතර, වැඩිදියුණු කල යුතු ක්ෂේත්‍රයන් හඳුනාගත යුතුය.

---

[43] See Footnote 12
[44] Annual Reports of the Auditor General 2020, 2021, 2022
[45] Annual Report of the Auditor General 2021

**4**

**විස්තීර්ණ පිරිඇගයුම් රාමුවක් බලාත්මක කිරීම:**
සමීක්ෂණ, නාභිගත කණ්ඩයම් සහ බලපෑම් ඇගයුම් උපයෝගී කර ගනිමින්, ළමා ආරක්ෂක අධිකාරියට චර්යාවන්, හැසිරීම් සහ දැනුවත්භාවයේ තලයන් වෙනස් කිරීම සඳහාවූ තම වැඩසටහන් වල ඵලදායිතාව අගය කල හැකිය.දත්ත මත දිවෙන මෙම ප්‍රවේශයෙන්, ළමා ආරක්ෂක අධිකාරියට වැඩිදියුණු කලයුතු ක්ෂේත්‍ර හඳුනාගැනීම, සම්පත් වෙන්කිරීම සුහළුල ගැන්වීම, සහ තම වටිනාකම ප්‍රතිපත්ති සම්පාදකයන් සහ පාර්ශවකරුවන් වෙත ප්‍රදර්ශනය කිරීමට අවස්ථාව උදාවනු ඇත.

**5**

**ව්‍යාපෘති කළමනාකරණ පරිචයන් සවිමත් කිරීම:**
පැහැදිලි කාල නිර්ණයන්, පැවරෙන වගවීම, සහ අතුරු ව්‍යාපෘති සමාලෝචන ඇතුලත් දැඩි ව්‍යාපෘති කළමනාකරණ මුලලේඛ උපයොගී කර ගැනිම. සැලසුම් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා ළමා ආරක්ෂක අධිකාරිය විසින් ව්‍යාපෘති කළමනාකරණ මෙවලම් සහ ක්‍රමවේදයන් උපයෝගී කර ගත යුතුය.

**6**

**සම්පත් ඉඩැස පිළිබඳ අවධානය:**
ආණ්ඩුවේ සහයෝගය පැතීම මගින් හෝ රාජ්‍ය නොවන ආයතන සහ ජාත්‍යන්තර සංවිධාන සමග සම්බන්ධීකරණය ගවේෂණය කිරීම තුලින් මානව සම්පත් සහ යටිතල පහසුකම් ධාරිතාවය වැඩි කිරීම. ළමා ආරක්ෂණ අභියෝග නිරන්තුරුවම වඩාත් වැඩි ගම්බද ප්‍රදේශ වල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමට අවධානය යොමු කිරීම.

**7**

**සපුරාගත යුතු ඉලක්ක සහිතව ප්‍රචාරණ අවකාශය ඉවැඩි කිරීම:**
ගම්බද සහ පහසුකම් නොමැති ප්‍රදේශ ඇතුළුව, සුවිශේෂ ප්‍රජාවට මුහුණ දීමට සිදුව ඇති අසමසම අභියෝග විමසුමට ලක් කරන ප්‍රචාරණ වර්ධනය කිරීම. සහභාගිත්වය ඉවැඩි කර ගැනීම පිණිස ප්‍රදේශයේ භාෂාව, සංස්කෘතියට අදාල සන්නිවේදනය සහ විශ්වාසදායක ප්‍රාදේශීය තැනැත්තන් උපයෝගී කර ගැනීම.

**8**

**විවිධ ක්ෂේත්‍රීය හවුල්කරුවන් සමගින් සම්බන්ධීකරණය:**
ළමා ආරක්ෂණ අධ්‍යාපනයේ පුළුල් ළඟාවක් සහතික කර ගැනීම පිණිස අධ්‍යාපනික, සෞඛ්‍ය සහ සමාජ සේවා වැනි ක්ෂේත්‍ර හවුල් කර ගැනීම. ප්‍රජා සංවිධාන සමගින් හවුල් වීම තුලින් දැනුවත්භාවය බෙදාහැරීම වර්ධනය කර ගැනීමට සහ ප්‍රචාරණයේ ඵලදායිතාව රඳා පවත්වා ගැනීමට හැකි වනු ඇත.

### 3.1.3. සහයෝගීතාව සහ සමුපදේශ

ළමා අපයෝජන වැළක්වීමේ සහ ළමයින් සුරක්ෂා කිරීමේ ළමා ආරක්ෂක අධිකාරියේ මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා ඵලදායි සහයෝගිතාව සහ සමුපදේශ තීරණාත්මක සාධකයකි. ළමා ආරක්ෂණය පිළිබඳ වගකිව යුතු ප්‍රධාන කායක් වශයෙන්, ළමයින් සුරැකීම සඳහා, එක්සත්, විවිධ-ක්ෂේත්‍ර ප්‍රවේශයක් නිර්මාණය කිරීම සඳහා - ආණ්ඩුවේ අමාත්‍යාංශ, පළාත් සභා, පළාත් පාලන ආයතන, සහ රාජ්‍ය සහ පෞද්ගලික සංවිධාන - වැනි පුළුල් පාර්ශවකරුවන්ගේ පරාශයක් එක් කර ගැනීමේ කාර්යය ළමා ආරක්ෂක අධිකාරිය වෙත පැවරී ඇත. මෙවන් ආස්ථිතයන් සම්බන්ධ කර ගැනීමෙන් ළමා ආරක්ෂක අධිකාරිය අපෙක්ෂා කරනුයේ අපයෝජන වැළැක්වීමේ පියවර වර්ධනය කිරීම පමණක් නොව සමාජයේ නොයෙකුත් ස්ථිරයන් හරහා එම පියවර ස්ථිරසාරව ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාම සාක්ෂාත් කිරීමයි.

ප්‍රමාණුකූල සක්‍රියතා බැඳියාවන් මඟින් බොහෝ විට බහු-ක්ෂේ ත්‍ර සහයෝගය අවැසි විවිධ මුහුණුවරින් යුතු ළමා අපයෝජන පිළිබඳව යොමු වීම සඳහාවූ ළමා ආරක්ෂක අධිකාරියේ කැපවීම විදහා පාන්නේය. මෙම කණ්ඩයේදී, සහයෝගිතා ජාලයක් ගොඩ නැගීම සහ උසුලා ගැනීමේදී ළමා ආරක්ෂක අධිකාරියේ කාර්ය සාධනය මෙන්ම ළමා ආරක්ෂණ උපායමාර්ග සංවර්ධනය සහ බලගැන්ම සඳහා අදාල පාර්ශවයන්ගේ සමුපදේශ ලබා ගැනීමේ සාර්ථකත්වය ඇගයිමට ලක් කෙරේ.

ළමා ආරක්ෂක අධිකාරියේ සහයෝගීතා සහ සමුපදේශ කාර්ය සාධනයට පහත සඳහන්දෑ ඇතුලත්ය.

**14(ඉ) වගන්තිය**
ළමා අපචාර වැළැක්වීමේ කාර්යය සඳහා සහ එවැනි අපචාරවලට ගොදුරුවූවන් ආරක්ෂා කිරීම සහ ඔවුන්ගේ අයිතීන් රැකගැනීම සඳහා අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග ගැනීම සහ උචිත අවස්ථාවලදී එම කාර්යය සඳහා අදාළ අමාත්‍යාංශවල, පළාත් සභාවල, පළාත් පාලන ආයතනවල, දිසා සහ ප්‍රාදේශීය ලේකම්වරුන්ගෙන් සහ රජයේ සහ පෞද්ගලික අංශයේ සංවිධානවල උපදෙස් විමසීම.

**14(ඕ) වගන්තිය**
ළමා අපචාරවලට එරෙහිව කරනු ලබන දැඩි ව්‍යාපාර සම්බන්ධීකරණය සම්බන්ධයෙන් පළාත් සභාවලට, පළාත් පාලන ආයතනවලට සහ රාජ්‍ය නොවන සංවිධානවලට උපදෙස් දීම සහ සහාය වීම.

**14(ට) වගන්තිය**
ළමා අපචාරවලට ඇති ඉඩ ප්‍රස්ථා අවම කිරීම පිණිස සංචාරක කටයුතු හා සම්බන්ධ සියලු අංශ සමග සංවාදයෙහි යෙදීම.

### සම්බන්ධීකරණ පරිශ්‍රමයන්

ළමා ආරක්ෂක අධිකාරිය විවිධ මාර්ග ඔස්සේ නොයෙකුත් පාර්ශවකරුවන් සමඟින් සක්‍රිය සහයෝගිතාව ගොඩ නගමින් සිටී.මෙම සංවාදයේදී අනාවරණය වූ සැලකිය යුතුකරුණක් වන්නේ, ළමා ආරක්ෂක අධිකාරිය විසින් සිවිල් සමාජ සංවිධාන ඇඳා ගැනීම සඳහා ත්‍රෛමාසික සිවිල් සමාජ සංවිධාන උපචාරලයන් (forums) සංවිධානය කරනු ලබන බවත් (46), එසේ වුවද ළමයින්ගේ ආරක්ෂණය ගැන කටයුතු කරන දේශීය සිවිල් සමාජ සංවිධාන ඇතුලත් කර ගැනීමට අපොහොසත් වී ඇති බවත්ය. වැඩිමනත්ව, ළමා ආරක්ෂණය සම්බන්ධයෙන් බහු-ක්ෂේත්‍රයිය ප්‍රවේශය සහතික වෙමින් අධිකරණ අමාත්‍යාංශය, ආරක්ෂක අමාත්‍යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය ඇතුළු නොයෙකුත් අමාත්‍යාංශවල නියෝජිතයන්ද ඇතුළු අධ්‍යක්ෂක මණ්ඩල මාසික රැස්වීම් පැවැත්වේ. තවද, ළමා ආරක්ෂණය සම්බන්ධයෙන්වූ ප්‍රතිපත්ති සාකච්ඡාවලට සහ ව්‍යවස්ථාපිත කාර්යවලියට දායක වෙමින්, ළමා ආරක්ෂක අධිකාරිය පාර්ලිමේන්තුවේ ආංශික කමිටු රැස්වීම්වලට සක්‍රියව සහභාගී වේ.

සංචාරක ක්ෂේත්‍රය තුල පැන නගින බරපතළ ළමා ආරක්ෂණ ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය ඇතුළු වැදගත් පාර්ශවකරුවන එක් කර ගනිමින්, ළමා ආරක්ෂක අධිකාරිය විසින් පුරෝගාමී උපචාරලයක් ස්ථාපිත කර ඇත. අවදානමට ලක්විය හැකි ජනගහණය සුරැකීමේ රෙගුලාසි පිළිබඳ දැඩි පාලනයක් සහ බලාත්මක කිරීම සඳහා ළමා ආරක්ෂක අධිකාරිය සහ පරිවාස සහ ළමා සුරැකුම් සේවා දෙපාර්තමේන්තුව වැනි රජයේ ආයතන සමඟ සහයෝගිතා පරිශ්‍රමයක් අත්‍යවශ්‍ය වේ (47). ළමා ආරක්ෂක අධිකාරිය විසින් ළමයින් හොරට විකිණීමේ ජාවාරම මැඩලීම සඳහා (48) හොටල් හිමිකරුවන්, ප්‍රජා සාමාජිකයන්, සහ නවාතැන්හල් හිමියන් (49) ඉලක්ක කර ගනිමින් මුහුදුබඩ දිස්ත්‍රික්කවල දැනුවත් කිරීමේ වැඩසටහන් දියත් කර ඇත. ළමා හොර ජාවරම වළක්වමින් ඊට විසඳුම් සෙවීම සඳහා, බහු-පාර්ශවකරුවන් අතර සම්බන්ධීකරණය Save The Children සංවිධානය වැදගත් භූමිකාවක් ඉටු කර ඇත (50). මෙම සම්බන්ධීකරණ ප්‍රවේශයේ අරමුණ වනුයේ, ළමා වින්දිතයන් හඳුනා ගැනීම, සුරැකීම සහ විශේෂඥයින් වෙත යොමු කිරීම ඉවැඩි කිරීමයි.

පාර්ශවකරුවන්ගේ සමුපදේශයේදී, බහුවිධ ක්ෂෙත්‍ර පැමිණිලි යාන්ත්‍රණයක් වන "1929" ළමා ආරක්ෂණය පිළිබඳ ඍජු දුරකථන සේවාවෙහි භූමිකාව ඉස්මතු කර දැක්වින. ඍජු දුරකථන සේවකයන් විසින් ලැබෙන පැමිණිලි එකෙනෙහිම ඵලදායිව අදාළ බලධාරීන් වෙත යොමු කල හැකිය. තවද, මේ වන විට ළමා ආරක්ෂක අධිකාරිය ශ්‍රී ලංකා ටෙලිකොම් සමඟින් සහයෝගිත්වයෙන් දත්ත කළමණාකරණය සහ විශ්ලේෂණය අනුකූලනය කිරීම සඳහා ආයතනික දත්ත සංචිතයක් වර්ධනය කිරීමේ නිරතවී ඇත (51).

### දත්ත බෙදාගැනීම

ඉහත සඳහන් පරිදි, ළමා අපයෝජනයට සම්බන්ධ දත්ත සම්බන්ධීකරණය ළමා ආරක්ෂක අධිකාරියේ කර්තව්‍යයන්ට ඇතුලත්ය. එසේ වුවද, ළමා ආරක්ෂණය සඳහා මීටත් වඩා විස්තීර්ණ සහ සම්බන්ධීකරණ ප්‍රවේශයක අවශ්‍යතාව වැඩි වැඩියෙන් ඉස්මතු වී ඇත (52). දත්ත-බෙදාහැරීමේ පද්ධතියක් ස්ථාපනය කර ඇති නමුත්, එහි සංකීර්ණතාවය එහි භාවිතයට බාධාවක් වී ඇති බව විගණකාධිපතිවරයාගේ වාර්තාවේ ඉස්මතු කර දක්වා ඇත (53). සම්බන්ධීකරණයේ සහ දත්ත බෙදා ගැනීමේ ඌණතාවය අනිසි ප්‍රතිවිපාකවලට මග පාදයි. උදාහරණයක් ලෙස, පළාත් පාලන ආයතන විසින් ක්‍රියාත්මක කරන අස්ථාවර උපායමාර්ග නිසා වෙනස් වෙනස් ප්‍රදේශවල ළමා ආරක්ෂණය සමාන නොවන තත්වයක් උද්ගත විය හැකිය. විධිමත් අන්තර්-නියෝජන කමිටුවක සහ ප්‍රමිතිගත දත්ත-බෙදාගැනීමේ මුලලේඛයක් නොමැති වීම මෙම ගැටළුව තවත් උග්‍ර කරවන අතර, එයින් ඵලදායී තොරතුරු බෙදා ගැනීමට සහ ළමා ආරක්ෂණ ගැටළුවලට ප්‍රතිචාර දැක්වීමට බාධා පමුණුවයි.තවද, අදාළ නියෝජිතායතන සඳහාවූ අනුකලක දත්ත බෙදාගැනීමේ පද්ධතියක් නොමැති වීම, කාලානුරූප සහ ඵලදායී තොරතුරු හුවමාරුවට අවහිරයක් වන අතර, නඩු හඹා යාමට සහ ළමා ආරක්ෂණයේ

[46] See Footnote 12
[47] An Assessment of Child Rights Risks in Sri Lanka's Accommodation and Tourism Sector – Save the Children (page 38)
[48] See Footnote 12
[49] Annual report of the National Child Protection Authority, 2020
[50] Enhancing collaboration among law enforcement, juvenile justice, child protection services, care institutions, and civil society organisations is vital to combat child trafficking.
[51] See Footnote 15
[52] The UNICEF report found that there is little to no data sharing on the following indicators children in conflict with the law, diversion and sentencing measures; and found that there is a lack of routine monitoring of children in detention centres, crimes against children, children in administrative detention and child protection.
[53] 2020

නැඹුරුව හඳුනා ගැනීමට උගහට වේ (54). මෙම අභියෝග තරණය සඳහා නියෝජිතායතන සමඟ වැඩිතර සම්බන්ධීකරණය, ප්‍රමිතිගත මූලලේඛ වර්ධනය, සහ ඵලදායී දත්ත බෙදා ගැනීම සහ සම්බන්ධීකරණයට පහසුකම සලසන අනුකලක දත්ත බෙදාගැනීමේ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම උපයෝගී කර ගන්නාවූ වඩාත් විස්තීර්ණ ප්‍රවේශයක් අවශ්‍ය වේ. ළමා ආරක්ෂණ ක්‍රියාමාර්ග විස්තීර්ණ වනවා පමණක් නොව, ශ්‍රී ලංකාව පුරා ළමයින්ගේ සුරැකුම පිළිබඳ විකාශය වන අවශ්‍යතාවන්ට සහ අභියෝග වලට ප්‍රතිචාර දක්වන්නක බවට සහතික වීම සඳහා ඉහතකී පියවර අත්‍යාවශ්‍ය වේ.

යුනිසෙෆ් ආයතනය (55) විසින් හරියාකාරව පෙන්වා දී ඇති පරිදි, මෙම සම්බන්ධීකරණ අඩුපාඩු වලට පිළියම් යෙදීමේ දැඩි අවශ්‍යතාවක් පවතින අතර, එමඟින් ළමා ආරක්ෂණය පිළිබඳ ළමා ආරක්ෂක අධිකාරියේ භූමිකාව සුවිශේෂව ඉවැඩි කල හැකිය. විධිමත් අන්තර්-නියෝජිතායතන කමිටු පිහිටුවීම, ප්‍රමිතිගත දත්ත-බෙදාගැනීමේ මූලලේඛ ක්‍රියාත්මක කිරීම, සහ අනුකලක තොරතුරු තාක්ෂණික පද්ධතියක් වවර්ධනය කිරීම යනාදිය, සියලුම අදාළ පාර්ශවකරුවන් අතර වඩාත් ඵලදායි සංවාදයකට සහ සහයෝගීතාවට ඉවහල් වනු ඇත. ළමා ආරක්ෂණ ක්‍රියාමාර්ග විස්තීර්ණ වනවා පමණක් නොව, ශ්‍රී ලංකාව පුරා ළමයින්ගේ සුරැකුම පිළිබඳ විකාශය වන අවශ්‍යතාවන්ට සහ අභියෝග වලට ප්‍රතිචාර දක්වන්නක් බවට සහතික වීම සඳහා මෙම පියවර අත්‍යාවශ්‍ය වේ.

## ප්‍රධාන නිර්දේශ

**1** උපායමාර්ගික සන්ධාන පිහිටුවීම:
විශේෂයෙන්ම සංචාරක ක්ෂේත්‍රයේ ළමා උපයෝජනය වළක්වාලීම සඳහා, ව්‍යාපාර පාර්ශවයන් සමඟින් විධිමත් හවුල් ව්‍යාපාර ස්ථාපිත කිරීම. ළමා ආරක්ෂණය සඳහා විස්තීර්ණ සහධාරී ජාලයක් ගොඩ නැගීම සඳහා පෞද්ගලික අංශයේ ආයතන සහ රාජ්‍ය නොවන සංවිධාන යොදා ගැනීම.

**2** අන්තර්-අමාත්‍යාංශ කාර්ය බලකායන් පිහිටුවීම:
බලගතු ළමා ආරක්ෂණ ගැටළු නිරාකරණය සඳහා ප්‍රධාන අමාත්‍යාංශ සමඟින් සහයෝගිතා කාර්ය බලකායන් පිහිටුවීම. ඃමෙම කාර්ය බලකායන් විසින් සහයෝගිතා මැදිහත්වීම් සහ සියලු ක්ෂේත්‍රයන්හි ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම අනුකූලනය සඳහා පහසුකම් සැපයිය හැකිය.

**3** ඃමධ්‍යගත, අන්තර්බලැති (interoperable) දත්ත බෙදාගැනීමේ තලයක් වර්ධනය කිරීම:
අදාළ රජයේ නියෝජිතයාතන, රාජ්‍ය නොවන සංවිධාන සහ ළමා ආරක්ෂණයේ නියුතු වෙනත් පාර්ශවකරුවන් අතර බාධා රහිත තොරතුරු හුවමාරුවට පහසුකම් සැලසීම. මෙම තලය තුලින් යථාකාල දත්ත බෙදාගැනීම, සම්බන්ධීකරණය වර්ධනය සහ ළමා ආරක්ෂණ ක්‍රියාමාර්ගවල ඵලදායිතාව ඉවැඩි කල හැකිය.

### 3.1.4. නියාමනය සහ ක්‍රියාත්මක කිරීම

ළමා ආරක්ෂණය පිළිබඳ නීති නියාමනය සහ ක්‍රියාත්මක කිරීමේ තීරණාත්මක වගකීම ළමා ආරක්ෂක අධිකාරිය වෙත පැවරී ඇත. මෙම කටයුත්ත මඟින්, ළමා අපයෝජනය වැළැක්වීම සහ පිළියම් යෙදීම සඳහා සකසන ලද නීති රාමු ඵලදායීව බලගැන්වීම පමණක් නොව, රට පුරා ස්ථාවරව පවත්වාගෙන යාමද සහතික කරයි. අවදියෙන් යුතු නියාමනය මඟින් ළමා ආරක්ෂක අධිකාරිය අරමුණ වනුයේ, ක්‍රියාත්මක කිරීමේ ඇති ඉඩැස් හඳුනා ගැනීම, නීතියට අනුගත වීම ඉවැඩි කිරීම, සහ නීතියට අනුව හිමිකම් ඇති ආරක්ෂණය ළමයින්ට ලැබෙන බව සහතික වීම ආදියයි.

මෙම කණ්ඩය මඟින්, ළමා ආරක්ෂක අධිකාරිය විසින් නීතියට අනුගතවීම, නීතිය කඩකිරීම පිළිබඳ පිළියම් සෙවීම, සහ අන්තරායාකාර අවස්ථාවලදී ළමයින්ගේ සුභසිද්ධිය සුරැකීම ආදිය කෙරෙහි අවධානය යොමු කරමින්, අධිකාරියේ නියාමනයේ සහ ක්‍රියාත්මක කිරීමේ භූමිකාවේ කාර්ය සාධනය පිළිබඳව විශ්ලේෂණය කෙරේ.

ළමා ආරක්ෂක අධිකාරියේ නියාමන සහ ක්‍රියාත්මක කිරීමේ කර්තව්‍යයන්ට පහත සඳහන්දෑ ඇතුලත්ය:

**14(ඇ) වගන්තිය**
සියලු ආකාර ළමා අපචාර වලට අදාළ නීති ක්‍රියාත්මක කිරීම සහ නියාමනය කිරීම.

**14(ඈ) වගන්තිය**
ළමා අපචාර සහ සම්බන්ධ සියලු විමර්ශන සහ අපරාධ නඩු කටයුතුවල ප්‍රගතිය නියාමනය කිරීම.

**14(ඒ) වගන්තිය**
අපරාධ පිළිබඳ විමර්ශනවලට සහ අපරාධ නඩු කටයුතුවලට සම්බන්ධ ළමයින්ගේ ආරක්ෂාව සහ රැකවරණය සඳහා, අවශ්‍ය අවස්ථාවල දී උචිත පියවර ගැනීම.

**14(ග) වගන්තිය**
අදාළ අමාත්‍යාංශ හා වෙනත් ආයතනයන්ගේ උපදෙස් විමසා ළමුන් සඳහා ළමා රැකවරණ සේවා සපයන සියලු ආගමික සහ පුණ්‍ය ආයතන අධීක්ෂණය කිරීම සහ ඒ පිළිබඳව නියාමනය කිරීම.

---

[54] Hamilton, Prof. Dame Carolyn, and Dr. Amelia Smith. An Assessment of Routine Data Collection Gaps in the Justice for Children Sector in Sri Lanka and Recommendations on Improving Systems and Addressing Data Gaps. UNICEF Sri Lanka, Oct. 2023.
[55] Ibid


## විමර්ශනවල ප්‍රගතිය නියාමනය කිරීම

2021 වර්ෂයේදී අධිකරණ අමාත්‍යාංශය සහ ළමා ආරක්ෂක අධිකාරිය විසින් නීති ප්‍රතිසංස්කරණ වාර්තා පහක් පිළිබඳව සාකච්ඡා කරන ලදි (56). මෙම ප්‍රතිසංස්කරණවල අරමුණ වූයේ ළමා-හිතෛෂී අධිකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම, දෘෂ්‍ය සාක්ෂි සඳහාවූ පරිපාටිය, "ළමයා" යන්න නිර්වචනය කිරීම සඳහා ස්වදේශිය නීතිය ජාත්‍යන්තර නීතිය සමඟ අනුබන්ධනය කිරීම, ළමයින්ට අදාළ පොලිස් විමර්ශන සඳහා මාර්ගෝපදේශ හඳුන්වා දීම, සහ ළමා අපයෝජන සහ ළමා වරදකරුවන් සම්බන්ධයෙන් විනිශ්චයකාරවරුන් සඳහා දඬුවම් පමුණුවීමේ මාර්ගෝපදේශ වර්ධනය (57) වැනි තීරණාත්මක තලයන්ට පිළියම් යෙදීමයි. මෙම ප්‍රත්‍යුත්ක්‍රම මඟින්, අපරාධ විමර්ශනවලට සහ නඩු කටයුතුවලට සම්බන්ධ ළමයින්ගේ යහපත සුරැකීම සඳහා ධනාත්මක පියවර ක්‍රියාත්මක කිරීමෙහිලා ළමා ආරක්ෂක අධිකාරියේ කැපවීම ඉස්මතු කර දක්වයි.

2010 වර්ෂයේදී, ළමා ආරක්ෂක අධිකාරිය විසින් පැය 24 පුරා ක්‍රියාත්මක"1929" ගාස්තු රහිත ළමා-උපකාරී දුරකථන පහසුකම අරඹන ලදි (58). මෙම සේවාව මඟින් ළමා අපයෝජන සිද්ධීන් වාර්තා වීම වැඩි වීමට සහ තනි පුද්ගලයන්ට උදව් ඉල්ලා සිටීමට සුරක්ෂිත සහ පහසුවෙන් ළඟාවිය හැකි තලයක් සඳහා පහසුකම් සපයා ඇත.

ළමා ආරක්ෂක අධිකාරියේ ළමා උපකාර දුරකථන පහසුකම නිසා ළමා අපයෝජන සිද්ධීන් වාර්තා වීම සුවිශේෂිව ඉහළ ගොස් ඇත. 2010 වර්ෂයේ එය ඇරඹි අවස්ථාවේ පටන්, වාර්තාවූ පැමිණිලි සංඛ්‍යාව ක්‍රමිකව ඉහළ ගොස් ඇත. 2010 වර්ෂයේදී ළමාරක්ෂක අධිකාරියට පැමිණිලි 3,892 ක් ලැබී තිබුනි. එසේ වුවද, 2010 වර්ෂයට සාපෙක්ෂව, 2011 වර්ෂයේදී ලැබුනු පැමිණිලි ප්‍රමාණය ආසන්න වශයෙන් 56% කින් වැඩිවී ඇත. 2011 වර්ෂයට සාපෙක්ෂව 2015 දී ලැබුණු පැමිණිලි ප්‍රමාණය ආසන්න වශයෙන් 77% කින් වැඩිවී ඇත. 2015 වර්ෂයට සාපෙක්ෂව, 2022 වර්ෂයේදී පැමිණිලි සංඛ්‍යාව ආසන්න වශයෙන් 2% කින් පමණ සුළු වශයෙන් අඩුවූ අතර, නඩු 10,497 වාර්තා වී ඇත (59).

### "1929" ඇමතුම් අංකය හරහා ලැබුණු පැමිණිලි සංඛ්‍යාව




[56] See Footnote 12
[57] See Footnote 28 (page 37, 38)
[58] The "1929" ChildLine responds not only to the emergency needs of children, but also links them to appropriate services ensuring their long-term care and rehabilitation.
[59] See Footnote 2

"1929" ළමා දුරකථනය හරහා ලද පැමිණිලි සංඛ්‍යාව මෙම සංඛ්‍යාලේඛන දිරි ගන්වන්නක් වන නමුත්, ළමා ආරක්ෂක අධිකාරියේ වෙබ් අඩවියේ සහ 2022 වාර්ෂික වාර්තාවේ වාර්තා කර ඇති නඩු සංඛ්‍යාව පිළිබඳව විෂමතාවක් හටගෙන ඇත.වෙබ් අඩවියේ සංඛ්‍යානයේ නඩු 10,497 ක් වාර්තා කරන අතර, වාර්ෂික වාර්තාවේ දක්වා ඇත්තේ "1929" උපකාරී දුරකථනය හරහා පැමිණිලි 9,574 ක් ලැබුනු බවයි (60). පැමිණිලි 923 ක් සම්බන්ධයෙන්වූ මෙම විෂමතාවෙන්, ළමා ආරක්ෂක අධිකාරිය විසින් බෙදාගන්නා ලද තොරතුරුවල නිරවද්‍යතාවය සහ ස්ථාවරත්වය පිළිබඳව අවධානය යොමුවී ඇත.

ළමා අපයෝජනවලට සම්බන්ධ සියලු විමර්ශන සහ අපරාධමය නඩුවල ප්‍රගතිය නියාමනය කිරීමේ කර්තව්‍යය ළමා ආරක්ෂක අධිකාරිය වෙත පැවරී ඇත. මෙම වගකීමට අදාළ බලාධිකාර වෙත යොමු කරන ලද නඩු පිළිබඳව පසු විපරමෙහි වැදගත්කම පිළිබඳව අවධාරණයද ඇඳෙයි. එසේ වුවද, සීමිත සම්පත් හේතුවෙන් මෙම නඩු සම්බන්ධ ඵලදායී නියාමනය සහ පසු විපරම පිළිබඳ අභියෝගවලට මුහුණ දීමට තමන්ට සිදුව ඇති බව ළමා ආරක්ෂක අධිකාරියේ නිලධාරීන් ඉස්මතු කර දක්වා ඇති අතර, එමඟින් ළමා ආරක්ෂණ පියවර වල පූර්ණ ඵලදායිතාව විභව ලෙස අසීරුවට පත් කර ඇත (61).

<u>දෘෂ්‍ය සාක්ෂි ඒකකය</u>

1999 අංක 32 දරණ සාක්ෂි (විශේෂ විධිවිධාන) පනත මඟින්, ළමා වින්දිතයන්ට නඩුවලදී සුරක්ෂිතව සහ අප්‍රසන්නතාවයෙන් තොර වාතාවරණයකදී සාක්ෂි දීමට අවස්ථාව සලසමින්, අපචාර පිළිබඳ ළමා වින්දිතයන්ගේ සාක්ෂි සහ ප්‍රකාශ වීඩියෝගත කිරීමට ළමා ආරක්ෂක අධිකාරියට බලය පවරා ඇත (62). එසේ වුවත්, දෘෂ්‍ය සාක්ෂි ඒකකවල සිමිත උපයෝජ්‍යතාවය දැනට බස්නාහිර පළාතට පමණක්, එනම් කොළඹ ජාතික ළමා ආරක්ෂක අධිකාරියට (63) සීමාවී ඇති අතර, 2021 වර්ෂයේදී දෘෂ්‍ය සාක්ෂි ඒකකයක් රාගම (64) ළමා පියසෙහි65 ස්ථාපිත කර ඇත. එමගින් අනෙකුත් පළාත්වල ළමා වින්දියන්ට සුවිශේෂ අභියෝගයක් එල්ල කරයි. බොහෝ විට සාක්ෂි දීම සඳහා මෙම ළමයින්ට බොහෝ දුරක් ගමන් කල යුතුව ඇති අතර, එමඟින් අනවශ්‍ය දුෂ්කරතා සහ පීඩාවන් ඇති කරයි. පළාත් 9 ක දෘෂ්‍ය සාක්ෂි ඒකක ස්ථාපිත කිරීම (66) සඳහා 2021 වර්ෂයේදී කැබිනට් අනුමැතිය ලැබුනු නමුත්, ප්‍රමාණවත් සම්පත් නොමැතිවීම සහ පුහුණුවලත් කාර්ය මණ්ඩල ඌණතාවය (67) නිසා එය ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයක් පවතින බව ළමා ආරක්ෂක අධිකාරියේ නිළධාරීන් කරුණු දක්වා ඇත.

වාර්තා කර ඇති ළමා අපයෝජන නඩු පිළිබඳ අපගේ විශ්ලේෂනය සහ තදනන්තර දෘෂ්‍ය සාක්ෂි උපයෝජනය අතර විෂමතාවක් පවතී. පසුගිය වසර කිහිපය පුරාවට වාර්තාවූ නඩු සංඛ්‍යාව අන්‍යෝන්‍යව ස්ථාවරව පැවත ඇති නමුත්, දෘෂ්‍ය සාක්ෂි මෙහෙයවන ලද නඩුවල අනුපාතය සැලකිය යුතු අන්දමේ පහළ අගයක පවතී.උදාහරණයක් ලෙස, 2015 වර්ෂයේදී වාර්තාවූ නඩු 10,732 ක් අතුරින්, දෘෂ්‍ය සාක්ෂි මෙහෙයවීමට යෙදී ඇත්තේ 2% ක වඩා අඩු නඩු ප්‍රමාණයකි. විශ්ලේෂණයට භාජනයවූ අවුරුදු පුරාවටම මෙම නැඹුරුව එලෙසින්ම පවතින අතර, ළමා අපයෝජන විමර්ශන සහ නඩු සඳහා දෘෂ්‍ය සාක්ෂි ඵලදායීව උපයෝජනය කිරීමේ නිබැඳි අභියෝගයක් පෙන්නුම් කරයි.

දෘෂ්‍ය සාක්ෂි පටිගත කිරීම සඳහා යොදවා ඇති මානව සම්පත්ද සීමිතය. 2015 සිට 2020 දක්වා ළමාරක්ෂක අධිකාරියට සිටියේ එක් දෘෂ්‍ය සාක්ෂි පටිගත කිරීමේ සහායකයකු පමණක් වන අතර, වීඩියෝ පටිගත කිරීම් ධාරිතාව හීන විය. 2021 සහ 2022 වන විට පුහුණුවලත් නිලධාරින්ගේ සංඛායව 3 දක්වා ඉහළ ගිය නමුත්, එය අවශ්‍යතාවයට වඩා අඩු ප්‍රමාණයකි. ළමා ආරක්ෂක අධිකාරියේ සේවක මූළයේ පුරප්පාඩු හතක් පවතී(68). ධාරිතාවේ මෙම ඉහළ යාම 2022 වර්ෂයේදී දෘෂ්‍ය සාක්ෂි සහිත නඩු සංඛ්‍යාවේ සැලකිය යුතු ඉහළ යාමක් පෙන්නුම් කල අතර, එකතුව නඩු 197 ත් දෘෂ්‍ය සාක්ෂ මඟින් මෙහෙයවා ඇත (69).

---

[60] See Footnote 15
[61] See Footnote 12
[62] The Video Evidence Units were established in an effort to reduce the traumatisation and revictimization of children in the Court process. This unit allows for the child's evidence to be recorded at the unit instead of Court.
[63] See Footnote 12
[64] "Lama Piyasa" was designed as part of the Creating Safe Communities for children project of the Sri Lanka College of Paediatricians and Plan Sri Lanka and opened in 2015. This safe house accommodates child victims up to the age of 17 years.
[65] National Guideline for the Management of Child Abuse and Neglect: A Multi-Sectoral Approach. 2014. (Page 26)
[66] See Footnote 21
[67] See Footnote 12
[68] Annual Report of the National Child Protection Authority 2021
[69] See Footnote 21

## <u>මනෝ සමාජයීය සහාය</u>

අමතරව, ළමා අපයෝජනයට ගොදුරුවූ ළමා වින්දිතයන්ට අත්‍යවශ්‍ය මනෝ සමාජයීය සහාය ලබාදීමේදී ළමා ආරක්ෂක අධිකාරිය වැදගත් කාර්ය භාරයක් ඉටු කරයි. "1929" ළමා උපකාරී දුරකථන පහසුකම, දිස්ත්‍රික් මනෝ සමාජයීය නිළධාරීන්, දිස්ත්‍රික් ළමා ආරක්ෂක නිළධාරීන්, සහ පළාත් ළමා ආරක්ෂක නිලධාරීන් ඇතුළු විවිධ මාර්ගයන් ඔස්සේ මෙම සහාය ලබා දෙනු ලබයි (70). ළමා ආරක්ෂක අධිකාරිය විසින් දිස්ත්‍රික් මනෝ සමාජයීය නිළධාරීන් සමඟින් තනි සහ සමූහ සුපරීක්ෂණ සැසිද පවත්වමින්, එම නිලධාරීන්ගේ නිපුණතාව සහ දැනුම වර්ධනය කිරීමද සිදුකිරීමේ යෙදී සිටී.

ළමා ආරක්ෂක අධිකාරිය විසින් සම්පාදනය කරන ප්‍රධාන මනෝ සමාජයීය මැදිහත්වීම් වලට, ආරක්ෂණය සහ සහාය අවැසි ළමයින් හඳුනා ගැනීම සඳහාවූ ඇගයීම්, සාධනීය මානසික සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා මාර්ගෝපදේශ සහ ඉගැන්වීම් සම්පාදනය, අපයෝජනයට ලක්වූ, අපයෝනයට ලක්වීමේ අවදානමට මුහුණපා සිටින හෝ මානසික සෞඛ්‍ය අභියෝගවලට මුහුණපා සිටින ළමුන් සඳහා උපදේශන සේවා සැපයීම සහ ළමයින්ගේ දෙමාපියන්ගේ සහ භාරකරුවන්ගේ ළමයින් ඇතිදැඩි කිරීමේ පරිචයන් ඉවැඩි කිරීම සඳහා සහ ළමයින්ගේ සුභසිද්ධිය ප්‍රවර්ධනය කිරීම සඳහා සහාය දැක්වීමද (71) ඇතුලත්ය. ළමුන්ගේ මනෝ සමාජයීය ප්‍රථමාධාර සඳහාවූ ත්‍රෛභාෂා ගුරුපොත හඳුන්වාදීම (72), මුහුදුබඩ ප්‍රදේශවල මනෝ සමාජයීය වැඩසටහන් පැවැත්වීම (73), සහ රැඳවුම් නිවාසවල සහ ළමා සුරැකුම් ආයතනවල කාර්ය මණ්ඩලය සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම යනාදිය ළමා ආරක්ෂක අධිකාරියේ ප්‍රධාන ප්‍රත්‍යුත්ක්‍රමවලට ඇතුලත්ය.

මනෝ සමාජයීය සහාය ලබාදීමේ සුවිශේෂ ධනාත්මක බලපෑම හඳුනාගත් ළමා ආරක්ෂක අධිකාරියේ නිළධාරීන්, ළමා අපයෝජන වින්දිතයන්ට විශේෂිත සුරැකුම් සැපයීමට හැකියාව ඇති පුහුණුවලත් වෘත්තීකයන් සංඛ්‍යාව වැඩි කිරීමේ හදිසි අවශ්‍යතාවය (74) අවධාරණය කර සිටියෝය. මනෝ සමාජයීය සහාය සම්පාදකයන් පුහුණුව සහ ධාරිතා වර්ධනය සඳහා ආයෝජනය කිරීම මඟින්, අපයෝජනයෙන් සහ සිත් කම්පනයෙන් පීඩාවට පත් ළමුන්ගේ සංකීර්ණ අවශ්‍යතාවන්ට පිළියම් යෙදීම සඳහාවූ ළමා ආරක්ෂක අධිකාරියේ හැකියාව ඉවැඩි කර ගත හැකිය. 2022 වාර්තාවෙන් ළමා ආරක්ෂක අධිකාරියේ මනෝ සමාජයීය නිලධාරීන්ගේ බරපතළ අඩුවක් ඉස්මතු කර දක්වයි. කැපවීමෙන් යුතු මනෝ සමාජයීය නිළධාරියකු නොමැති වීම සහ පළාත්බද මනෝ සමාජයීය නිලධාරී තනතුරු ආසන්න වශයෙන් තුනෙන් දෙකක් දක්වා අඩු කිරීම, මෙම ඉඩැස සපුරාලීමේ හදිසි අවශ්‍යතාවය ඉස්මතු කර දක්වයි (75).

## <u>සයිබර් ප්‍රවීක්ෂණ</u> (Surveillance) <u>ඒකකය</u>

2021 වර්ෂයේදී, ළමයින් මාර්ගගත ප්‍රචණ්ඩත්වයෙන් රැකගැනීම සහ අන්තර්ජාලය ඔස්සේ ළමා අපයෝජනයට ගොදුරුවූ ළමයින්ගේ අයිතිවාසිකම් සුරැකීම පිණිස ළමා ආරක්ෂක අධිකාරියේ සයිබර් ප්‍රවීක්ෂණ ඒකකය (76) ස්ථාපිත කරන ලදි. ළමුන්ට එරෙහි නැගී එන මාර්ගගත ලිංගික සහ ලිංගභේදය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වයේ පරිමාව මැඩලීම සඳහා, 2024 වර්ෂයේදී, ළමා ආරක්ෂක අධිකාරිය අන්තර්ජල මුරකා පදනම (Internet Watch Foundation (IWF) සමඟ සම්බන්ධීකරණයෙන්, මාර්ගගත ළමා ලිංගික අපයෝජන වාර්තා කිරීමට පහසුකම් සැලසීම පිණිස කැපවූ ද්වාරයක් (Portal) එළි දක්වන ලදි (77). මෙම ප්‍රත්‍යුත්කර්මය මඟින් මාර්ගගත ළමා ලිංගික අපයෝජන සංකල්පරූප (imagery) පිළිබඳව තනි පුද්ගලයන්ට නිර්ණාමිකව පැමිණිලි කිරීමේ අවස්ථාව උදා කරන ලද අතර, එමඟින් එවන් හිංසනික සංයුතයන් ඉවත් කිරීම සඳහා ඉක්මන් පියවර ගැනීමට IWF හට හැකියාව ලැබෙන්නේය (78).

විශේෂයෙන් මානව සම්පත් සහ අරමුදල් වැනි සම්පත් හීනතාවය නිසා, රට පුරා දෘෂ්‍ය සාක්ෂි ඒකක දියුණු කිරීම වැනි ප්‍රධාන ප්‍රත්‍යුත්ක්‍රම ඵලදායීව ක්‍රියාත්මක කිරීමට බාධාවී ඇත.තවද, දැඩි නියාමන සහ විශ්ලේෂණ යාන්ත්‍රණයක් නොමැති වීම නිසා අධිකාරියේ මැදිහත්වීමේ බලපෑම සහ දියුණු කල යුතු ක්ෂේත්‍ර හඳුනාගැනීම ද ගැටළුවක් ව පවතී. ළමා ආරක්ෂණය ඵලදායීව සහතික වීම පිණිස සම්පත් වෙන්කිරීම වැඩිකිරීම, ධාරිතා වර්ධනය ශක්තිමත් කිරීම, සහ අදාළ පාර්ශවකරුවන් සමඟින්වූ සම්බන්ධීකරණය ඉවැඩි කිරීම මඟින් මෙම අභියෝග ජයගත යුතුව ඇත.

---

[70] See Footnote 31
[71] Ibid.
[72] See Footnote 21
[73] Annual Report of the National Child Protection Authority 2018
[74] See Footnote 12
[75] See Footnote 15
[76] See Footnote 21
[77] The NCPA launched a portal in collaboration with the Internet Watch Foundation to report on cases of child online sexual abuse. Complaints can be made anonymously and is available in Sinhala, English and Tamil: https://report.iwf.org.uk/lk_en
[78] Ibid.

## ප්‍රධාන නිර්දේශ

**1** දෘෂ්‍ය සාක්ෂි ඒකක ජාලය විස්තීරණය කිරීම:
ළමා වින්දිතයන්ට දෘෂ්‍ය සාක්ෂි ඒකකයේ වැදගත් සේවාව සඳහා සාධාරණ සහ සමාන ප්‍රවේශය සහතික කිරීම පිණිස, පළාත් 9 හිම අතිරේක දෘෂ්‍ය සාක්ෂි ඒකක පිහිටුවීම සඳහා ළමා ආරක්ෂක අධිකාරිය හඬ නැගිය යුතුය.

**2** සම්පත් වෙන්කිරීම සහ ධාරිතා වැඩිකිරීම හා ශක්තිමත් කිරීම:
කාර්ය මණ්ඩල බඳාව ගැනීම්, පුහුණුව ලබාදීම සහ යටිතල පහසුකම් දියුණු කිරීමට අරමුදල් ලබාදීම ඇතුළු ළමා ආරක්ෂක අධිකාරිය වෙත ප්‍රමාණවත් සම්පත් වෙන් කිරීම කෙරෙහි ආණ්ඩුව සහ අදාළ පාර්ශවකරුවන් ප්‍රමුඛතාවය දිය යුතුය.

**3** දත්ත කළමනාකරනය සහ විශ්ලේෂණය විස්තීර්ණ කිරීම:
ළමා ආරක්ෂක අධිකාරියට නැඹුරුතා සහ ඉඩැස් හඳුනා ගැනීමට සහ සාක්ෂි මත පදනම්වූ තීරණ ගැනීම් දැනුම් දීම සඳහා පහසුකම් සැලසීම පිණිස ශක්තිමත් දත්ත කළමනාකරණ පද්ධති සහ විශ්ලේෂණ මෙවලම් සඳහා ආයෝජනය කල යුතුය.

**4** හවුල්කාරිත්වයන් සහ සම්බන්ධීකරණයන් ශක්තිමත් කිරීම:
සම්බන්ධීකරණය පුළුල් කිරීම, අත්දැකීම් බෙදාහදා ගැනීම සහ සම්පත් උත්තෝලනය ආදිය සඳහා ආණ්ඩුවේ නියෝජිතායතන, රාජ්‍ය නොවන සංවිධාන සහ ජාත්‍යන්තර සංවිධාන සමග සම්බන්ධීකරණය ශක්තිමත් කල යුතුය.

**5** විස්තීර්ණ මහජන දැනුවත් කිරීම් ප්‍රචාරණයන් ක්‍රියාත්මක කිරීම:
ළමා අපයෝජන, එයින් වැළකීම සහ පැමිණිලි කිරීමේ යාන්ත්‍රණ පිළිබඳව මහජනයා දැනුවත් කිරීම පිණිස ඉලක්කගත මහජන දැනුවත් කිරීම් ප්‍රචාරණයක් එළි දැක්විය යුතුය.

**6** නවෝත්පාදන තාක්ෂණය පිළිබඳ ගවේෂනය:
ළමා ආරක්ෂණ සේවාවන්හි ඵලදායිතාව සඳහා මාර්ගගත පැමිණිලි තලයන්, ජංගම යෙදුම්, සහ දත්ත විශ්ලේෂණ සඳහාවූ කෘතිම බුද්ධි මෙවලම් වැනි තාක්ෂණයන් උපයෝගී කරගත යුතුය.

**7** නිරන්තර විශ්ලේෂණ සහ නියාමනය:
ළමා ආරක්ෂක අධිකාරියේ වැඩසටහන් සහ මැදිහත්වීම් වල බලපෑම, වැඩිදියුණු කල යුතු ක්ෂේත්‍ර හඳුනා ගැනිම සහ අනාගත උපායමාර්ග පිළිබඳව දැනුම් දීම අැගයීම පිණිස නිරන්තර විශ්ලේෂණ සහ නියාමන යාන්ත්‍රණ ක්‍රියාත්මක කල යුතුය.

**8** මනෝ සමාජයීය සහාය සේවා විස්තීර්ණය:
ළමා වින්දිතයන්ට සහ ප්‍රවර්තකයන් හට ප්‍රමාණවත් සහාය සහතික කිරීම පිණිස, විශේෂයෙන්ම ගම්බද ප්‍රදේශවල පුහුණුවලත් මනෝ සමාජයීය වෘත්තිකයන්ගේ සංඛ්‍යාව වැඩි කල යුතුය.

### 3.1.5. පර්යේෂණ සහ දත්ත කළමනාකරණය

ළමා අපයෝජන මැඩලීම සඳහා ඵලදායී උපායමාර්ග වර්ධනය කිරීමේදී, පර්යේෂණ සහ දත්ත පිළිබඳව දැඩි පදනමක් අවශ්‍ය වේ. එමගින්, තීක්ෂණ අන්තර්දෘෂ්ඨිය ග්‍රහණය කර ගැනීමට, නැඹුරුතා සහ උත්පාදනය වන ගැටළු හඳුනා ගැනීමට ළමා ආරක්ෂක අධිකාරියට හැකියාව ලැබෙන අතර, ඒ සියල්ලම ප්‍රකාශිත ප්‍රතිපත්ති සහ මැදිහත් වීම් හැඩ ගැස්වීමට ඉවහල් වන්නේය.

ළමා ආරක්ෂක අධිකාරියේ පර්යේෂණ සහ දත්ත කළමනාකරණ කර්තව්‍යයට පහත සඳහන්දෑ ඇතුලත්ය:

> 14(ක) වගන්තිය
> ළමා අපචාර සම්බන්ධව ජාතික දත්ත පදනමක් සකස් කිරීම සහ එය පවත්වාගෙන යාම.

<u>දත්ත එක්රැස් කිරීම</u>

යුනිසෙෆ් ආයතනය විසින් මෑතකදී සිදුකල ඇගයුමක් මඟින්, වත්මන් දත්ත එක්රැස් කිරීමේ සහ වාර්තාකරණ පරිචයන්හි සීමිත බව (79) පෙන්වා දී ඇත. මේ වන විට ළමා ආරක්ෂක අධිකාරිය දත්ත සඳහා මූලික වශයෙන් රඳා පවතින්නේ "1929" ළමා ආරක්ෂණ සෘජු දුරකථන සම්බන්ධතාවය මත වන අතර, එමගින් ලැබෙන පැමිණිලි කෙලින්ම දිස්ත්‍රික් ළමා ආරක්ෂක නිලධාරීන් (80) වෙත වාර්තා කරනු ලැබේ. මෙම ප්‍රවේශයෙන් ශ්‍රී ලංකාවේ ළමා අපයෝජනයේ සැබෑ විෂය ප්‍රමාණය අවතක්සේරු කිරීමක් වනුයේ, මෙම මාර්ග ඔස්සේ වාර්තා නොවන සිදුවීම් ඉන් බැහැර වීමේ හේතුවෙනි. ළමා ආරක්ෂක අධිකාරිය සහ පොලිසිය ළමා ආරක්ෂක දත්ත සඳහා දත්ත පදනමක් උපයෝගි කර ගන්නා අතර, ඵලදායි තොරතුරු එක්රැස් කිරීමේ සහ බෙදාගැනීමේ එහි විභවය සම්පූර්ණ වශයෙන් සාක්ෂාත් කරගෙන නොමැත (81).ආයතන දෙක අතර තොරතුරු ස්වයංක්‍රියව හුවමාරුවීමේ යාන්ත්‍රණයක් පැවතියදීත්, මාසික වාර්තාවල කායික අත්සනෙහි අවශ්‍යතාවය වැනි අතින් සිදුකරන දත්ත ඇතුලත් කිරීමේ ක්‍රියාවලිය මත විශ්වාසය තැබීම නිසා, කාලීන සහ නිරවද්‍ය දත්ත එක්රැස් කිරීමට බාධා පමුණුවයි.

[79] See Footnote 54
[80] Ibid
[81] Ibid

## දත්ත කළමනාකරණය

2023 වර්ෂයේදී, යුනිසෙෆ් ආයතනය මඟින් ශ්‍රී ලංකාවේ ළමා ආරක්ෂක ක්ෂේත්‍රයන්හි සමස්ථ පරිණතය පිළිබඳව ඇගයීමක් (82) කරන ලදි. මෙම ඇගයුම සඳහා විවිධ පාර්ශවකරුවන් හරහා දත්ත කළමනාකරණයේ පරිණතයේ තලය ඇගයීම සඳහාවූ සමීක්ෂන ප්‍රතිචාර උපයෝගී කර ගන්නා ලදි. <u>ප්‍රධාන ක්ෂේත්‍ර හතරක් සඳහා ළමා ආරක්ෂක අධිකාරියට ආසන්න වශයෙන් 40% ක ලකුණු අනුපාතයක් අත්විය:</u>

අ) දත්ත යටිතල පහසුකම්
ආ) දත්ත ප්‍රමිතිකරණය
ඇ) දත්ත සම්ප්‍රේෂණය
ඈ) දත්ත උපයෝගීතාව, ඉල්ලුම සහ ප්‍රචාරනය (83)

සැලකිය යුතු කරුණක් වනුයේ, දත්ත ප්‍රමිතිකරණය සඳහා ළමා ආරක්ෂක අධිකාරියට හිමි වූයේ විශේෂිතවම අඩු ලකුණු ප්‍රමාණයක් (22%) වීම සහ එමඟින් ළමා ආරක්ෂණ දත්ත එක්රැස් කරන්නේ සහ වර්ගීකරණය කරන්නේ කෙසේද යන්න පිළිබඳ සමරූපතාවක් නොමති වීම (84)(disparity) ඉස්මතු වීමයි. මෙම අසමානතාවයෙන් ළමා ආරක්ෂක අධිකාරිය තුල දත්ත එක්රැස් කිරීම සහ වර්ගීකරණය පිළිබඳව ස්ථිරභාවයක් නොමැති බව ඉස්මතු කෙරන අතර, එමඟින් නියෝජිතයාතන අතර අවසන්නිවේදනයට දායක වන අතර, ඵලදායී නඩු/පැමිණිලි කළමනාකරණයට බාධා පමුණුවීම හෝ රටේ විවිධ දිසාවන් හරහා ළමා අපයෝජන නඩු මෙහෙයන්නේ කෙසේද යන්න පිළිබඳව අස්ථිරභාවයක් ඇති කරන්නේය. ඊට ප්‍රතිවිරුද්ධ වශයෙන්, පොලිසිය විසින් ඉහළ සමස්ත පරිණත තලයක් පෙන්නුම් කරමින් ලකුණු 57% හිමිකර ගෙන ඇති අතර, විශ්ලේෂණයට බඳුන්වූ සියළු ක්ෂේත්‍රයන් හි ස්ථිරසාරව ළමා ආරක්ෂක අධිකාරිය අභිබවා ගොස් ඇත (85).

මීට පෙර දැක්වූ පරිදි, ළමා ආරක්ෂක අධිකාරියේ සංඛ්‍යාලේඛනමය වාර්තා සම්පාදනය කෙරෙනුයේ අධිකාරියට "1929" සෘජු දුරකථනය හරහා ලැබෙන පැමිණිලි සංඛ්‍යාව වාර්තා කිරීමටය. <u>වටිනා දත්ත සම්පාදනය කරන නමුත්, ළමා ආරක්ෂක අධිකාරිය විසින් පළ කරනු ලබන සංඛ්‍යාලේඛනමය වාර්තා මඟින් අස්ථාවරභාවය සහ විමර්ශනය කරන ලද නඩු/පැමිණිලි සංයාව සහ පිළිවෙලින් ඒවායේ ප්‍රතිඵල වැනි අතශවශ්‍ය උපමානයන්හි අඩුවක් පෙන්නුම් කරයි.</u>

දත්ත වර්ගීකරණය ප්‍රමිතිගත කිරීම, දත්ත ප්‍රදානයන් පුළුල් කිරීම, දත්ත එක්රැස් කිරීම විස්තිරණය කිරීම, ගැඹුරු විශ්ලේෂණ පැවැත්වීම, සහ වෙනත් නියෝජිතයාතන සමඟින් සම්බන්ධීකරණය ආදිය මඟින්, ළමා ආරක්ෂක අධිකාරියට එහි සංඛ්‍යාලේඛනමය වාර්තාවල ප්‍රමිතිය සහ ඵලදායිතාව වර්ධනය කල හැකිය.එමඟින් අධිකාරියේ කාර්ය සාධනය පිලිබඳ වඩාත් නිරවද්‍ය ඇගයිමත් කල හැකි වනු අතර, ශ්‍රී ලංකාවේ ළමුන් ඵලදායි අයුරින් ආරක්ෂණය කිරීම සඳහා අවැසි වැඩිදියුණු කල යුතු ක්ෂේත්‍රයන් හඳුනාගත හැකිය.

සංඛ්‍යාලේඛනමය වාර්තාවලට අමතරව, ළමා ආරක්ෂක අධිකාරියේ වාර්ෂික වාර්තා මඟින්ද සුවිශේෂ අඩුලුහුඩුකම් පෙන්නුම් කරන අතර, එමඟින් අධිකාරියේ කාර්ය සාධනය සහ එහි බලපෑම් ඇගයීමේදී එහි ඵලදායිතාවට බාධා පමුණුවයි. මූලිකම අඩුපාඩුවක් වනුයේ පැහැදිලිව නිර්ණය කරන ලද ඉලක්ක සහ අරමුණු නොමැති වීම වන අතර, එමඟින් අධිකාරියේ ප්‍රගතිය සහ එහි ඵලදායිතාව ඇගයීමට බාධාවකි. සුවිශේෂ ඉලක්ක සහ අපෙක්ෂිත ප්‍රතිඵල හඳුනා නොගෙන, ළමා ආරක්ෂක අධිකාරියේ ප්‍රගිතය සහ සාර්ථකත්වය නිර්ණය කිරීම අභියෝගයකි.  තවද, ළමා ආරක්ෂක අධිකාරියේ සංඛ්‍යාලේඛන වල දැක්වෙන සහ එහි 2022 වාර්ෂික වාර්තාවේ ලේඛනගතව ඇති වාර්තාවූ නඩු සංඛ්‍යාව පිළිබඳ විෂමතාවය මඟින් අධිකාරිය විසින් බෙදාහරිනු ලබන තොරතුරුවල නිරවද්‍යතාවය සහ ස්ථිරත්වය පිළිබඳව සැකයක් මතුවේ. සංඛ්‍යාලේඛන අනුව 2021 වර්ෂයේදී "1929" සෘජු දුරකථනය මාර්ගයෙන් ලැබුණු පැමණිලි සංඛ්‍යාව 10,497 ක් වශයෙන් දක්වා තිබියදී, වාර්ෂික වාර්තාවේ දක්වා ඇත්තේ "1929" දුරකථනය ඔස්සේ ලැබුනු පැමිණිලි සංඛයාව 9,574 ක් වශයෙනි (86).

මෙම අස්ථාවරභාවය මඟින්, දියුණු දත්ත කළමනාකරණ පරිචයන් සහ වාර්තා කිරීමේදී විනිවිද භාවයේ අවශ්‍යතාව ඉස්මතු කර දක්වයි. ළමා ආරක්ෂක අධිකාරියේ වාර්ෂික වාර්තාවල සහ සංඛ්‍යාලේඛණවල විශ්වසනීයත්වය සහ උපයෝගිතාව විස්තීර්ණ කිරීම සඳහා, මෙම අඩුපාඩු සපුරාලීම සහ දැඩි ඉලක්ක නිර්ණය, කාර්ය සාධන මිණුම්, සහ දත්තවල ප්‍රමිතිය සහතික වීම අත්‍යවශ්‍ය වේ.මෙම වාර්තාවන් තුල ප්‍රධාන කාර්ය සාධන දර්ශකයන් නොමැති වීමෙන් සුවිශේෂ මිණුම් ලකුණුවලට සාපෙක්ෂව ළමා ආරක්ෂක අධිකාරියේ ප්‍රගතිය සහ ඵලදායිතාව ඇගයීම තවදුරටත් ව්‍යාකූල කරන අතර, අධිකාරියේ මැදිහත්වීම් ඵලදායකද හෝ සම්පත් සුභවාදීව උපයෝගී කරගෙන ඇත්තේද

---

[82] Ibid
[83] Ibid
[84]  Ibid
[85] Ibid
[86] See Footnote 15

යන්න තීරණය කිරීම අභියෝගයකි. සම්පත් වෙන්කිරීම, තීරණ ගැනීමේ ක්‍රියාවලිය සහ වගවීමේ යාන්ත්‍රණ පිළිබඳ තොරතුරු හීන වීමද මෙයට ඇතුලත් වේ.

ප්‍රමිතිගත දත්ත එක්රැස් කිරීමේ මුලලේඛ වල හීනතාව සහ දැඩි දත්ත නියාමන රාමුවක් නොමැති වීමෙන්, සාක්ෂි මත පදනම්වූ තීරණ ගැනීම සඳහා උපායමාර්ගිකව දත්ත උපයෝගී කර ගැනීම සීමිතවී ඇත. ළමා අපයෝජන වින්දිතයන් පිළිබඳ දත්ත අත්පත් කර ගැනීමට වෙහෙස වුවද, නීතිය සමඟ පිළිගැටුමට අසුවී ඇති ළමුන් පිළිබඳ තොරතුරු නියාමනයේ සැලකිය යුතු ඉඩැසක් පවතී. සම්බන්ධීකරණ කායක් වශයෙන්වූ ළමාරක්ෂක අධිකාරියේ විභව භූමිකාවක් පැවරී තිබියදීත්, මෙම ගැටළු විසඳා ගැනීමට අන්තර්-නියෝජිතයාතන සහයෝගිතාව සඳහා ඵලදායී පහසුකම් සලසා නොමැත.

සෘජු දුරකථන මාර්ගය ඔස්සේ ලැබුනු ළමා අපචාර පැමිණිලි සංඛ්‍යාව, එහි ස්වභාවය සහ දිස්ත්‍රික්ක අනුව වර්ගීකරණය කර, වාර්ෂික සංඛ්‍යාලේඛනමය වාර්තා ළමාරක්ෂක අධිකාරිය විසින් පළ කර ඇත. මෙම වාර්තා මඟින් වටිනා අන්තර්දෘෂ්ටියක් ලබා දෙන නමුත්, ළමා ආරක්ෂක අධිකාරියේ සමස්ත ඵලදායිතාව පිළිබඳව විස්තීර්ණ විශ්ලේෂණයක් ඉදිරිපත් නොකිරීම අඩුවක්ව පවතී.

## ළමා අපයෝජන වාර්තාකරණය

වාර්තාවීමේ හීනතාවය නිසා, ශ්‍රී ලංකාවේ ළමා අපයෝජනයට ලක්වන ළමයින්ගේ නියම අනුපාතය තීරණය කිරීම දුෂ්කර වන අතර, ලබාගත හැකි දත්ත අනුව මැවෙන චිත්‍රය අනතුරුදායකය. 2012-2022 කාලය සඳහාවූ ළමාරක්ෂක අධිකාරියේ සංඛ්‍යාලේඛන වාර්තාවල ප්‍රධාන අනාවරණය මගින්, සාමාන්‍යයෙන් වසරකට 1,990 ක් පමණ වන සහ මුළුමනින්ම 23,884 ක් වන පැමිණිලි අනුව වැඩි වශයෙන් නිරන්තරයෙන්ම වාර්තා වන අපයෝජනයක් වශයෙන් ළමයින් කෲරත්වයට භාජනය කිරීම (87) පිළිබඳ ඒකාකාරී කෲරත්ව රටාවක් හඳුනාගෙන ඇත.

2020 වර්ෂය වන විට රටේ ළමා ජනගහණය 7,330,059 ක්ව තිබූ අවදියේදී, ළමා ආරක්ෂක අධිකාරියට ළමා අපයෝජන පැමිණිලි 8,165 ක් ලැබී තිබූ අතර, එය ආසන්න වශයෙන් ළමා ජනගහණයෙන් 0.11% ක නියෝජනයකි (88). 2021 වර්ෂය වන විටදී ළමා ජනගහණය 7,389,000 ක් වන විට, ලැබුණු පැමිණිලි සංඛ්‍යාව 11,187 ක් දක්වා ඉහළ ගිය අතර එය ළමා ජනගහණයෙන් 0.15% ක නියෝජනයකි (89). මෙම ඉහළ යාමට කොවිඩ් 19 අගුලුවැටීම හේතුවක් වශයෙන් දැක්විය හැකි අතර, එමඟින් ඉහළ ගිය පීඩනය සහ ගෘහස්ථ ආතතිය නිසා ළමා අපයෝජන ඇවිස්සුනා විය හැකිය. මෙම සංඛ්‍යාවලින් පෙන්නුම් කෙරෙනුයේ සැබෑ නඩුවල ඉතා කුඩා ප්‍රමාණයක් වුවද, එමඟින් රටේ පවතින ළමා අපයෝජනය පිළිබඳව අනතුරුදායත්වය ඉස්මතු කර දක්වයි. මෙම සංඛ්‍යාලේඛන වලින් ගැටළුවේ සැබෑ ප්‍රමාණය අවතක්සේරුවක් බවට වටහා ගැනීම ඉතා වැදගත් වනුයේ, පවතින බිය, ඇතිවිය හැකි කැලල සහ දැනුවත්බවේ හීනතාවය නිසා අපයෝජන සිද්ධීන් බොහෝමයක් වාර්තාගත නොවන නිසාය(90).

## පළාත් විෂමතාවය

පැමිණිලි කිරීමේ ක්‍රියාවලිය පිළිබඳව පළාත් අතර පවතින දැනුවත්බවේ අසමානතාවයේ ප්‍රතිඵලයක් වශයෙන් ළමා අපයෝජන පැමිණිලි වාර්තා වීමේදී පළාත් අතර විෂමතාවයක් පවතී. "1929" දුරකථන මාර්ගය ඔස්සේ ළමා ආරක්ෂක අධිකාරියට ලැබෙන ළමා අපයෝජන පැමිණිලි ගත් කළ නිරන්තරයෙන්ම කොළඹ දිස්ත්‍රික්කය දිස්ත්‍රික් ලැයිස්තුවේ ඉහළම ස්ථානය අත්කර ගෙන සිටී. කාලයත් සමඟ මෙම රටාව තීව්‍ර වී අතර, ලැබුණු සමස්ථ පැමිණිලිවලින් කොළඹ දිස්ත්‍රික්යේ පංගුව 2014 දී 13.58% සිට 2021 වන විට 19.44% දක්වා ඉහළ ගොස් ඇත (91). මෙම විෂමතාව පිළිබඳ සක්‍රිය අවධානය යොමු කිරීමෙන් සහ අඩු වාර්තාකරණ අනුපාතයක් පවතින පළාත්වලට ලඟාවීමේ සහ දැනුවත් කිරීමේ ප්‍රචාරණය සඳහා ප්‍රමුඛත්වය දීමෙන්, සියලුම ළමුන්ට, ඔවුන්ගේ භූගෝලීය නිවේෂණය ගැන නොසලකා ආරක්ෂණය සහ යුක්තිය සඳහා සමාන ප්‍රවේශයක් සහතික කිරීමට ළමා ආරක්ෂක අධිකාරියට හැකිවනු ඇත.

ළමා ආරක්ෂක අධිකාරියේ කාර්ය සාධනය නිරවද්‍යව ඇගයීම සඳහා විමර්ශනය කරන ලද පැමිණිලි සංඛ්‍යාව, ඒවායේ නිරීක්ෂණ සහ ගන්නා ලද පියවරත අන්තරායකාරී අවස්ථාවලින් මුදවා ගන්නා ලද ළමුන්ගේ සංඛ්‍යාවත අපරාධකරුවන්ට දඬුවම් පමුණුවීමේ අනුපාතයත සහ වයස, ලිංගිකත්වය, අපරාධකරුගේ පැතිකඩ (profile) , සහ වින්දිතයා සහ අපරාධකරුවා අතර ඥාතිත්වය/සබැඳියාව ආදිය ඇතුළු විමර්ශනයේ ප්‍රතිඵල සම්බන්ධයෙන්වූ අසමුහස්ථ (disaggregated) දත්ත (92) එක්රැස් කිරීම අත්‍යවශ්‍ය වේ.

මීටත් අමතරව ළමා ආරක්ෂක අධිකාරිය වෙත පැවරී ඇති කර්තව්‍යයක් වනුයේ:

---

[87] See Footnote 10
[88] Statistics for Child and Women Centred Development (Page 32)
[89] See footnote 2
[90] Sathiadas, M.G., Viswalingam, A. & Vijayaratnam, K. Child abuse and neglect in the Jaffna district of Sri Lanka – a study on knowledge attitude practices and behavior of health care professionals.
[91] Colombo district consistently records the highest number of complaints, averaging around 1,418.6 cases per year, followed closely by Gampaha and Kurunegala districts. In contrast, Mannar district reports the lowest number of cases.
[92] See Footnote 2

**14(ච) වගන්තිය**

**ළමා අපචාර හා ළමයින් ආරක්ෂා කිරීම හා සම්බන්ධ පර්යේෂණ පැවැත්වීම, ප්‍රවර්ධනය කිරීම හා සම්බන්ධීකරණ කිරීම ය.**

පර්යේෂණ සඳහා ආයෝජනය කිරීමෙන් විකාෂනය වන අභියෝග සහ ළමා ආරක්ෂණය පිළිබඳ ඉඩප්‍රස්ථා සම්බන්ධයෙන් වටිනා අන්තර්දෘෂ්ඨියක් ලබා ගැනීමට ළමා ආරක්ෂක අධිකාරියට හැකි වන අතර, එමගින් තම උපායමාර්ග ප්‍රසාදනය කිරීමට, වැඩසටහන් බෙදා හැරීම දියුණු කිරීමට, සහ අත්‍යන්තව ළමයින්ගේ අයිතීන් සහ යහපත සුරැකීම සඳහාවූ එහි පරිශ්‍රමයන් ශක්තිමත් කර ගැනීමට හැකි වනු ඇත.

<u>පර්යේෂණ ප්‍රසිද්ධ කිරීම</u>

ළමා ආරක්ෂක අධිකාරිය විසින් පාසල්වල ළමා විනය පිළිබඳ විධික්‍රමයන්(93) පිළිබඳ අධ්‍යයනය වැනි පර්යේෂණ මුලපිරීම් සමහරක් ගෙන ඇති අතර, ළමා ආරක්ෂණ සංග්‍රහය(94) (Child Protection Journal) පළ කිරීම වටිනා පියවරක් වන නමුත්, ළමා ආරක්ෂක අධිකාරියේ වෙබ්අඩවියෙන් එය ලබා ගැනීමේ අවස්ථාව සීමිතය. අධිකාරියේ වැඩසටහන් වල බලපෑම දියුණු කිරීම සඳහාවූ ඵලදායිතාව ඇගයීම සඳහා වඩාත් විස්තීර්ණ සහ නොනැවතී ඉදිරියට යන පර්යේෂණවල අවශ්‍යතාවය පැන නැගී ඇත. උදාහරණයක් වශයෙන්, ඉහතකී සංග්‍රහය නිත්‍යව පළ කිරීම මගින් පර්යේෂණ නිරීක්ෂණ පතළ කිරීමට, විශ්ෂ්ය පරිචයන් බෙදා ගැනීම සහ ළමා ආරක්ෂණ ක්ෂේත්‍රය තුල තීරණාත්මක සාකච්ඡා පෙළඹවීමට වේදිකාවක් සැකසේ.

විස්තීර්ණ දත්ත පදනමක් පවත්වාගෙන යාම මගින්, ළමා ආරක්ෂක අධිකාරිය විසින්, නඩු/පැමිණිලි නිරවද්‍යව නියාමනය කිරීමට, විනිවිදභාවය ඉවැඩි කිරීමට සහ දත්ත මත පදනම්වූ තීරණ ගැනීමට සහාය දීම ආදිය සඳහා පහසුකම් සැලසිය යුතුය. මෙම දත්ත මගින් නොයෙකුත් ආකාරයේ අපයෝජනයන්හි පැවැත්ම හඳුනා ගැනීමට උපකාර කිරීම පමණක් නොව, වත්කම් වෙන් කිරීම සහ ඉලක්කගත අපයෝජන වලක්වාලීමේ උපායමාර්ග වර්ධනය පිළිබඳවද දැනුවත් විය හැකිය. ඊටත් අමතරව, පර්යේෂනවලට මුලපිරීම මගින් ළමා ආරක්ෂක අධිකාරියට, ළමා අපයෝජනවල මූලාශ්‍රය පිළිබඳව තම දැනුම පුළුල් කර ගැනීමටත්, පවත්නා පියවරවල ඵලදායිතාව ඇගයීමට, සහ වැඩිදුර අවධානය යොමු කල යුතු ක්ෂේත්‍ර හඳුනා ගැනීමට හැකි වේ. මෙම කණ්ඩය මගින් ළමා ආරක්ෂක අධිකාරිය විසින් එක්රැස් කරන ලද දත්තවල විෂය ප්‍රමාණය, නිරවද්‍යතාව සහ උපයෝගිතාව මෙන්ම ජාතික ළමා ආරක්ෂණ උපායමාර්ග කෙරහිවූ පර්යේෂණ ක්‍රියාදාමය මතවූ අධිකාරියේ බලපෑම ආදිය ඇගයීම මගින් පර්යේෂන සහ දත්ත කළමනාකරණය සඳහාවූ එහි පරිශ්‍රමය පිළිබඳව විශ්ලේෂනකයක් කෙරේ.

## ප්‍රධාන නිර්දේශ

**1**

**දත්ත එක්රැස් කිරීමේ මාර්ග ඉවැඩි කිරීම:**
සමකාමී ළමා ආරක්ෂණ සංවිධානවල, පාසල්වල, රෝහල්වල සහ ස්වාධීන සමාජ සේවාවන් හි වාර්තා ඇතුළත් කල යුතුය. මෙම පුළුල් ප්‍රවේශය මගින්, නානාප්‍රකාර තලයන් හරහාවූ ළමා අපයෝජන සිද්ධීන් පිළිබඳව වඩාත් විස්තීර්ණ දැක්මක් උකහා ගැනීමට ළමා ආරක්ෂක අධිකාරියට හැකියාව ලැබේ. සමස්ත නිරවද්‍යතාව සහ ළමා ආරක්ෂණ පැමිණිලි ලුහුබැඳීමේ විනිවිද භාවය දියුණු කිරීම සඳහා මෙම අතිරේක ප්‍රභව මධ්‍යගත බහුවිධ-සමුද්දේෂ දත්ත පද්නමකට අනුකලනය කල යුතුය.

**2**

**ප්‍රමිතිගත දත්ත වර්ගීකරණ රාමුවක් ක්‍රියාත්මක කිරීම:**
ළමා ආරක්ෂණය සඳහාවූ විශ්ෂ්ය පරිචයන් සමඟින් එකාබද්ධ වීම.මෙම රාමුව මඟින්, අපයෝජන වර්ග සඳහා ස්ථාවර වර්ගීකරණ, පැමිණිලිවල තත්වය, සහ ඒකරූපී දත්ත නිවේශනය සහ යළි-සොයා ගැනීම සඳහා සහාය වන ප්‍රතිඵල පැහැදිලිව නිර්වචනය කල යුතුය.

[93] The study revealed that although school counsellors are present in the system, the training and awareness of their mandate is questionable. Adequately trained school counsellors should be available at all schools.
[94] On the NCPA website, only the 2019 volume of the Child Protection Journal is available.

3 වාර්ෂික සහ සංඛ්‍යාලේඛන වාර්තා විස්තීර්ණය කිරීම:
විමර්ශන ප්‍රතිඵල, දඬුවම් පමුණුවීම්, මුදවා ගැනීම් සහ මැදිහත්වීම් අනුපාතයන් පිළිබඳ අසමුහස්ථ තොරතුරු ඇතුලත් කල යුතුය.වාර්තා මගින් වඩාත් නිරවද්‍ය පළාත් සංසන්ධනය සඳහා දිස්ත්‍රික්ක ළමා ජනගහනයෙන් සාමාන්‍යකරණය කරන ලද දත්ත සැපයීම මගින් පළාත් විෂමතා පිළිබඳවද අවධානය යොමු කල යුතුය. ප්‍රධාන කාර්ය සාධන ප්‍රදර්ශකයන් හඳුන්වා දීම මගින් පාර්ශවකරුවන් හට ප්‍රගතිය ඇගයීම සහ ඉලක්කගත වැඩිදියුණු කල යුතු ක්ෂේත්‍ර හඳුනාගත හැකිය.

4 ළමා ආරක්ෂක අධිකාරිය තුල කැපවීමෙන් යුතු පර්යේෂන ඒකක පිහිටුවීම:
නැඹුරුතා, පළාත් විවිධත්වයන්, සහ ළමා අපයෝජනවල මූලාශ්‍රය කෙරෙහි අවධානය යොමු කරන වාර්ෂික අධ්‍යයනයන් පැවැත්වීම. විශාල පරිමාණයේ පර්යේෂණ ව්‍යාපෘති පැවැත්වීමට සහ ලොව විශ්ෂ්ඨතම පරිචයන් උත්තෝලනය කිරීම සඳහා අධ්‍යාපනික ආයතන සහ යුනිසෙෆ් වැනි ජාත්‍යන්තර සංවිධාන සමග ඒකාබද්ධ විය යුතුය. සාක්ෂිමත පදනම්වූ ප්‍රතිපත්තිමය හැඩ ගැසීම් සහ මැදිහත්වීමේ වැඩසටහන් සහතික වීම සඳහා මෙම අනාවරණයන් වාර්ෂික සැලසුම් චක්‍රයට ඇතුලත් කරගත යුතුය.

5 සම්පත් වෙන්කිරීමේ විනිවිද භාවය ඉවැඩි කිරීම:
වැඩසටහන් සහ පළාත් අනුව වියදම් දැක්වෙන සවිස්තරාත්මක අයවැය ප්‍රභේදනයන් වාර්ෂික වාර්තා තුලට ඇතුලත් කල යුතුය. මෙමගින්, වාර්තාවී ඇති අපයෝජනවල පැවැත්ම සහ පළාත් අවශ්‍යතාවයන් මත පදනම්වූ අධි-අවදානම් ප්‍රදේශ සඳහාවූ වත්කම් සම්පාදනයට ප්‍රමුඛත්වය ඉස්මතු විය යුතුය. ප්‍රධාන ළමා ආරක්ෂණ වැඩසටහන් සඳහා විගණන ක්‍රියාවලියක් හඳුන්වා දීමෙන්, සම්පත් ඵලදායීව උපයෝගී කර ගැනීම තහවුරු කරගත හැකිය.

6 මධ්‍යගත නඩු කළමනාකරණ පද්ධතියක් වර්ධනය කිරීම:
තත්කාලීන තොරතුරු බෙදා ගැනීම ප්‍රවර්ධනය සඳහා, නීතිය බලාත්මක කරන නිලධාරීන්/ආයතන, සෞඛ්‍ය සේවා සම්පාදකයන් සහ සමාජ සේවා ඇතුළු අදාළ පාර්ශවකරුවන්ට ප්‍රවේශ වීමේ හැකියාව සහතික කල යුතුය. සම්බන්ධීකරණ ක්‍රියාවන්හි අවශ්‍යතාවය සහිත පුද්ගලිකත්වය සමතුලිත කරන පැහැදිලි දත්ත-බෙදාගැනීමේ මූලලේඛ ස්ථාපිත කල යුතුය. දත්ත පරිහරණ ප්‍රමිතීන් ගැනවූ නිරන්තර බහු-නියෝජිතායතන පුහුණුව මගින්, ළමා ආරක්ෂණ නඩු කළමනාකරණයේ දී ස්ථාවරත්වයට, ඵලදායී සම්බන්ධීකරණයට සහාය දැක්විය හැකිය.

### 3.1.6. පැමිණිලි හසුරුවීම සහ යොමු කිරීම්

ළමා අපයෝජන සිද්ධීන් පිළිබඳව මහජනතාවට පැමිණිලි කිරීම සඳහා සම්බන්ධ කර ගත හැකි ඒකකය වශයෙන් ළමා ආරක්ෂක අධිකාරිය තීරණාත්මක සන්ධිස්ථානයකි. පැමිණිලි භාර ගැනීමෙන්, එම පැමිණිලි නිසි බලධාරීන් වෙත යොමු කිරීමෙන්, අපයෝජන චෝදනා විගසින් සහ ඵලදායීව විමර්ශයනට ලක් කිරීම ළමා ආරක්ෂක අධිකාරිය සහතික කරයි. මෙම කාර්ය භාරය, යම් තැනැත්තකුට අවාදානමට මුහුණ දිය හැකි ළමුන් සම්බන්ධයෙන් උපකාර සහ ආරක්ෂාව ඉල්ලා සිටීමට සුරක්ෂිත සහ ලඟාවිය හැකි මාර්ගයක් වශයෙන් අත්‍යවශ්‍ය වේ.

පැමිණිලි හසුරුවීමේ සහ යොමු කිරීමේ ළමා ආරක්ෂක අධිකාරියේ භූමිකාවට හසුවන කර්තව්‍යය තුලට, වාර්තාවල සත්‍යතාවය ඇගයීම, නීතිය බලාත්මක කරන සහ ළමා ආරක්ෂණ සේවා සමග සම්බන්ධීකරණය, සහ සුදුසු පියවර ගැනීම සහතික වීම යනාදිය ඇතුලත් වේ. මෙම ක්‍රියාවලිය මගින් ක්ෂණික මැදිහත්වීම පහසු කරනවා පමණක් නොව, ප්‍රජාව අතර විශ්වාසය ගොඩ නැගීම, ළමා අපයෝජන සිද්ධීන් පිළිබඳව වාර්තා කිරීමට වැඩි පිරිසක් දිරිමත් කිරීමට ද උපකාරී වේ. මෙම කණ්ඩයේදී, ළමා ආරක්ෂක අධිකාරිය විසින් පැමිණිලි කළමනාකරණය කිරීමේ කාර්ය සාධනය සහ වාර්තාවූ පැමිණිලි සම්බන්ධයෙන් විමර්ශනය කිරීම තහවුරු කිරීම සඳහා වෙනත් බලධාරීන් සමග සම්බන්ධීකරණයේදී අධිකාරියේ ඵලදායිතාව විමර්ශනයට භාජනය කෙරෙන අතර, ළමා අපයෝජන සිද්ධීන් පිළිබඳව තත්කාලීන සහ සුදුසු ප්‍රතිචාර දැක්වීමේදී මුහුණ දෙන මොනයම් හෝ අභියෝග සහ සාර්ථකත්වයන් ඉස්මතු කර දැක්වේ.

පැමිණිලි හසුරුවීම සහ යොමු කිරීම සම්බන්ධයෙන් ළමා ආරක්ෂක අධිකාරියට පැවරී ඇති කර්තව්‍යයක් වනුයේ :

> 14(ඖ) වගන්තිය
> ළමා අපචාර පිළිබඳ මහජන පැමිණිලි භාර ගැනීම සහ අවශ්‍ය අවස්ථාවල දී ඒ පැමිණිලි නිසි බලධාරීන් වෙත යොමු කිරීමයි.

මෙම වගකීම ඵලදායීව ඉටු කිරීම සඳහා, ළමා ආරක්ෂක අධිකාරිය විසින්, දින 7 /පැය 24 පුරාවටම සක්‍රිය "1929" ළමා උපකාරී සෘජු දුරකථන මාර්ගය(95), විශේෂ පොලිස් ඒකකය(96), සහ ළමුන්ට එරෙහි මාර්ගගත ලිංගික ප්‍රචණ්ඩත්වය විමර්ශනය කිරීම සඳහා ළමා ආරක්ෂක අධිකාරියේ වෙබ් අඩවියේ විවෘතව පවතින IWF ද්වාරය(97) ඇතුළු යාන්ත්‍රණ රාශියක් ස්ථාපිත කර ඇත. වැඩිමනත්ව, පැමිණිලි සෘජුවම ළමා ආරක්ෂක අධිකාරියේ ප්‍රධාන කාර්යාලය වෙත හෝ සෑම දිස්ත්‍රික්කයකමඑක් එක් ප්‍රාදේශීය මහලේකම් කාර්යලවල පිහිටා ඇති ළමා ආරක්ෂක අධිකාරියේ කාර්යාලවට ඉදිරිපත් කල හැකිය.

<u>පැමිණිලි යොමු කිරීම</u>

අපයෝජන සිද්ධීන්, ළමුන් නොසලකා හැරීම සහ උපයෝගිතාව පිළිබඳව පැමිණිලි කිරීම සඳහා " 1929" ළමා සෘජු දුරකථනය මාර්ගයෙන්, රහස්‍යගත වේදිකාවක් සම්පාදනය කර ඇත. එවන් පැමිණිලි හසුරුවීම සහ ඒවා නිසි බලධාරීන් වෙත යොමු කිරීම සහතික කිරීම සඳහා සෘජු දුරකථන මාර්ග කාර්ය මණ්ඩලය පුහුණු කර ඇත. ළමා ආරක්ෂක අධිකාරිය තුල පිහිටුවා ඇති විශේෂ පොලිස් ඒකකය විසින්, යොමු කිරීමේ ක්‍රියාවලියට සහ වාර්තාවූ පැමිණිලි/නඩු සම්බන්ධයෙන් නොපමාව විමර්ශන කිරීම සහතික කිරීම පිණිස ප්‍රාදේශීය පොලිස් ස්ථාන සමඟ ඒ සම්බන්ධයෙන් විමසිලිමත්ව කටයුතු කිරීම සහ සුපරීක්ෂණය කිරීම සිදු කරයි.

මෙම යාන්ත්‍රණවල අරමුණ වී ඇත්තේ, ළමුන් විසින් ළමා අපයෝජන පිළිබඳව පැමිණිලි කිරීමට සුරක්ෂිත සහ ලඟාවිය හැකි මාර්ගයක් සම්පාදනය කිරීම සහ වාර්තාවූ නඩු/පැමිණිලි නොපමාව විමර්ශනය වීම සහතික වීම සඳහාවූ ළමා ආරක්ෂක අධිකාරියේ කැපවීම ශක්තිමත් කිරීමයි. එසේ වුවද, ළමා අපයෝජන මැඩලීමේ ඵලදායිතාව හීන කරන බාධකයක් වී ඇත්තේ යුක්තිය ඉටුවීමේ ප්‍රමාදයයි. ළමා ආරක්ෂක අධිකාරියේ සහ වෙනත් අදාළ නියෝජිතයාතනවල ඒකාබද්ධ පරිශ්‍රමයන් කොතෙකුදු වුවද, අධිකරණ පද්ධතිය තුල ළමා අපයොයෝජන නඩු විශාල ප්‍රමාණයක් අවසන් නොවී ගොඩ ගැසී ඇත.

<u>පැමිණිලි විසඳීම</u>

2022 වර්ෂයේ ශ්‍රී ලංකාවේ "ඩෙයිලි මිරර්" පුවත්පතෙන් වාර්තා කර තිබුනේ, 2011 සිට 2021(99) අතර කාලයේදී ළමා අපයෝජනය පිළිබඳ පැමිණිලි 47,136 ක් එම වසර අවසානය වන විට නොවිසඳී පැවති බවයි. 2022 වර්ෂය වන විටදී, ළමා ආරක්ෂක අධිකාරියේ විශේෂ විමර්ශන අංශය විසින් ගොනු කරන ලද නඩු 257 ක් මහාධිකාරණය හමුවේ විනිශ්චය නොවී පැවති අතර, තවත් නඩු 423 රට පුරා නොයෙකුත් මහේස්ත්‍රාත් අධිකරණවල නොවිසඳී පැවතිනි(100). මෙම ප්‍රමාදයට හේතුව වශයෙන් ළමාරක්ෂක අධිකාරියේ හිටපු සභාපති උදයකුමාර අමරසිංහ මහතා දක්වා සිටියේ, අධිකරණ වෛද්‍ය වාර්තා, DNA වාර්තා, සහ අනෙකුත් අත්‍යවශ්‍ය තාක්ෂනික ලේඛන(101) ලබා ගැනීමේදී නීතිපති දේපාර්තමේන්තුවට මුහුණු දීමට සිදුව ඇති අභියෝගය යි. ළමා ආරක්ෂක අධිකාරියේ 2020 සහ 2021 ක්‍රියාත්මක සැලසුමේ, අධිකාරියේ හරයාත්මක කාර්ය සාධනය වන පැමිණිලි විසඳීම පිළිබඳව ප්‍රමුඛතාවය දීමට අපොහොස්තවී ඇත(102). විශේෂඥයන් සහ දත්ත පදනම් වැඩි දියුණු කිරීම සඳහා සැලකිය යුතු අරමුදල් වියදම් කර ඇති නමුත්, පැමිණිලි හසුරුවීමේ ඵලදායී පද්ධතියක් ක්‍රියාත්මක කිරීම කළ නොහැකිව ළමා ආරක්ෂක අධිකාරිය අසීරුතාවට පත්වී ඇති බවක් පෙනී යයි.

නොවිසඳී ගොඩගැසී ඇති 47,136 ක් වන මෙම නඩු තොගය පිළිබඳව පාර්ශවකරුවන්ගේ සමුපදේශයේදී(103) සාකච්ඡා කර ඇත. මෙම නඩු තොගය විමර්ශනය කොට විසඳා ඇති බවට ළමා ආරක්ෂක අධිකාරියේ නිලධාරීන් හැගවූ නමුත්, එම කියමන සනාථ කිරීම සඳහා ප්‍රත්‍යක්ෂ සාක්ෂි නොමැත. මෙම සමුපදේශයේදී හෙළිවූයේ, ළමා ආරක්ෂක අධිකාරියේ වත්මන් පරිචය වී ඇත්තේ, ළමයකුගේ ආරක්ෂාව තහවුරු කිරීම සහතික වීම සඳහා පසු විපරමක් නොමැති වුවද, යම් පැමිණිල්ලක්/නඩුවක් නිසි බලධාරීන් වෙත යොමු කල පමණින් එය විසඳී ඇති බවට සැලකීම බවයි. මෙම පිවිසුම, විමර්ශන අධීක්ෂණය සහ නියාමනය, ළමුන් සඳහා පූර්ණ ආරක්ෂණය සුරක්ෂිත කිරීම සඳහාවූ අධිකාරියට පැවරී ඇති කර්තව්‍ය සමඟ නොපෑහේ.

[95] See Footnote 58
[96] The Special Police Unit of the National Child Protection Authority was established to fulfil the specific mandates of Section 14(g) and (k) of the NCPA Act, which involve monitoring child abuse laws and addressing public complaints. The Unit is responsible for forwarding child abuse complaints received through the 1929 helpline to relevant police stations. Within 48 hours, the Unit follows up with these stations to inquire about the actions taken and provides further guidance, as necessary.
[97] See Footnote 75
[98] Wickramasinghe, K "Legal crisis hindering justice for Sri Lanka's vulnerable children?" Published 21.02.2024
[99] 100,592 complaints reported to the NCPA from 2011 to 2021
[100] See Footnote 96
[101] See Footnote 96
[102] See Footnote 45
[103] See Footnote 12

වැඩිමනත්ව, පසුගිය දසකයකට අධික කාලය පුරාවමට, විගණකාධිපතිවරයාගේ වාර්තා මඟින් ඉස්මතු කර දක්වා ඇත්තේ, විසඳා ඇති පැමිණිලිවල සමස්ථ සංඛ්‍යාව සහ නිසි බලධාරීන් වෙත ලැබී ඇති සමස්ථ පැමිණිලි සංඛ්‍යාව අතර සැලකිය යුතු විෂමතා පවතින බවයි. නොවිසඳී පවතින පැමිණිලි සංඛ්‍යාව සැලකිය යුතු අයුරින් ඉහළ ගොස් තිබෙන නමුත්, පැමිණිලි විසඳීමේ අනුපාතිකය පවතින්නේ අඩු මට්ටමකය.වාර්තා මඟින්, පැමිණිලි සම්බන්ධයෙන් පසු විපරමෙහි අඩුවක්, සීමිත විමර්ශන ක්‍රියාකාරකම්, සහ ප්‍රශ්න විසඳීමේ කාර්යාවලියේ මන්දගාමිත්වය හඳුනාගෙන ඇත. මෙයින් පැමිණිලි හසුරවීමේ පද්ධතික ගැටළුවක් පෙන්නුම් කරන අතර, එයට වහාම පිළියම් යෙදිය යුතුව පවතී.

මෙම ප්‍රමාදයන් නිසා ළමා වින්දිතයන්ට සහ ඔවුන්ගේ පවුල්වල අයට අතිශය සෘනාත්මක බලපෑම්වලට මුහුණ දීමට සිදුව ඇත. නිරන්තරව ගොඩ ගැසී ඇති ළමා අපයෝජන නඩු මඟින්, මෙම නඩු විසඳීම යුහුසුළු කිරීම සඳහා අධිකරණ පද්ධතියේ ප්‍රතිසංස්කරණ වල හදිසි අවශ්‍යතාවය ඉස්මතු කර දක්වයි. ළමා අපයෝජන වින්දිතයන් සඳහා කාලීන යුක්තිය ඉටුවීම සහතික වීම සඳහා අධිකරණමය කටයුතු සඳහා ප්‍රමාණවත් සම්පත් ආයෝජනය, නීති ක්‍රියාමාර්ගයන්හි ඵලදායිතාව වර්ධනය, සහ නීතිපති දෙපාර්තමේන්තුව මුහුණ දෙන අභියෝගිවල පිළියම් යෙදීම අත්‍යවශ්‍ය වේ.එවන් ප්‍රතිසංස්කරණ මඟින් නඩු විසඳීම යුහුසුළු කිරීම පමණක් නොව, ළමා අපයෝජන සමනය කිරීම සඳහාවූ ළමා ආරක්ෂක අධිකාරියේ සමස්ත ඵලදායිතාව කෙරෙහිද දායක වනු ඇත.

පැමිණිලි විසඳීමේ ඵලදායිතාව සහතික කිරීම සඳහා, පැමිණිලි විමර්ශන යාන්ත්‍රණය ශක්තිමත් කිරීම, විසඳුම් මාර්ග යුහුසුළු කිරීම, සහ පැමිණිලිකරුවන් වෙත කාලීන ප්‍රතිපෝෂණ (feedbacks) සැපයීම ආදිය නොවැලැක්විය හැකි කටයුතු බවට පත්ව ඇත.ඊටත් අමතරව, මොනයම් හෝ අඩුපාඩුවක් හඳුනා ගෙන ඊට පිළියම් යෙදීම සඳහා පැමිණිලි නිරන්තරයෙන් නියාමනය කිරිමේ සහ විශ්ලේෂණය කිරීමේ ක්‍රියාවලියක් අත්‍යවශ්‍ය වේ.

## ප්‍රධාන නිර්දේශ

**1**

**ළමා ආරක්ෂක අධිකාරිය තුල කැපවීමෙන් යුතු කාර්ය සාධක බලකායක් පිහිටුවීම:**
නොවිසඳී පවතින නඩු පිළබඳ නීතිමය ක්‍රියාමාර්ගවලට ප්‍රමුඛතාවය දීම සහයුහුසුළු කිරීම සඳහා, අධිකරණය සහ නීතිය බලාත්මක කිරීමේ ආයතන සමඟින් සම්බන්ධීකරණයෙන් කටයුතු කල යුතුය. පැමිණිලි හසුරුවීම අනුකලය කිරීම සඳහා සඳහා අවශ්‍යතාව සහ දරුණුකම පදනම් කර ගත් පැමිණිලි වර්ගීකරණ සමේෂණීය පද්ධතියක් භාවිතා කිරීම සහ විමර්ශන සහ යොමු කිරීම් යුහුසුළු කිරීම සඳහා අතිරේක සම්පත් වෙන් කිරීම් කල යුතුය.

**2**

**ළමා අපචාර නඩු සඳහා ඵලදායිතා පූර්ණ අධිකරණමය ක්‍රියාවලියක් සඳහා පෙනී සිටීම:**
ලුහුබැඳීමේ වේගවත් බවකින් යුතු අධිකරණ ආකෘතියකින් මෙය සිදු කල හැකිය. මේ සඳහා පවතින අධිකරණ ව්‍යුහය තුල ළමා අපයෝජන නඩු සඳහා විශේෂිත අධිකරණ පිහිටුවීම එකට වෙලී පවතී. ඊටත් අමතරව, ළමා අපයෝජන නඩු සඳහා වෛද්‍ය සහ ව්‍යවහාර ලේඛන පිරිසැකසුම අනුකලනය සඳහා නීතිපති දෙපාර්තමෙන්තුවට සම්පත් වෙන් කිරීම මඟින් ළමා ආරක්ෂක අධිකාරියේ යොමු කිරීම් කාර්යාවලියට වඩාත් ඵලදායී සහයෝගයක් ලබා දීම.

**3**

**ළමා ආරක්ෂක අධිකාරියේ පැමිණිලි හසුරවීමේ ක්‍රියාවලිය ඉවැඩි කිරිම:**
ලැබුනු විගසේ සිට විසඳුම් තුලින් එක් එක් පැමිණිල්ලෙහි වත්මන් තත්වය නියාමනය කෙරෙන තත්කාලීන ලුහුබැඳීමේ හැකියාව සහිත මධ්‍යගත පද්ධතියක් ක්‍රියාත්මක කල යුතුය. විමර්ශනයේ සෑම තලයකදීම වගවීම සහතික කෙරෙන පැහැදිලි පසුවිපරම් මූලලේඛ වර්ධනය කිරීම. පැමිණිලි කළමනාකරණය සඳහාවූ නිරන්තර නියාමනය සහ විශ්ලේෂනය සමඟින් වූ, ඵලදායී පැමණිලි කළමනාකරණය සඳහා ළමා ආරක්ෂක අධිකාරියේ කාර්ය මණ්ඩලයට විස්තීර්ණ පුහුණුව ලබාදීම තුලින්, සෑම පැමිණිල්ලක් සඳහාම ප්‍රමාණවත් සහ ක්ෂණික අවධානය යොමු කිරීමේ අධිකාරියේ හැකියාව ශක්තිමත් කෙරෙනු ඇත.

4 යොමු කිරීමේ සහ විමර්ශනය කිරීමේ යාන්ත්‍රණය වැඩි දියුණු කිරීම:
ස්වයංක්‍රියව යොමුකිරීම් ලුහුබැඳීම සහ නඩු යාවත්කාලීන කිරීම සඳහා ඩිජිටල් මෙවලම් සංකලනය කල යුතුය. ළමා ආරක්ෂක අධිකාරිය සහ හවුල්කාර නියෝජිතයාතන විසින් ගනු ලබන ක්‍රියාවලි වල කාලීනත්වය සහ ප්‍රමිතිය විශ්ලේෂණය කිරීම සඳහා පැමිණිලි විමර්ශන සහ යොමු කිරීම් සඳහා ප්‍රධාන කාර්යා සාධන දර්ශකයන් සථාපිත කිරීම. කම්පන-දැනුවත් සන්නිවේදනය පිළිබඳව සෘජු දුරකථන මාර්ග කාර්ය මණ්ඩලය සහ පොලිස් ඒකකයන්හි කාර්යා මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන් මෙහෙයවීම තුලින්, වින්දිතයන් සහ ඔවුන්ගේ පවුලේ අය අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවය වඩාත් සහතික කෙරෙනු ඇත.

5 ːපැමිණිලි විසඳීම කෙරෙහි යොමුවූ නිශ්චිත අරමුණු සහ මිණිය හැකි ප්‍රතිඵල සහිත වාර්ෂික ක්‍රියා සැලසුමක් වර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම:
මෙම කාර්ය සඳහා උපායමාර්ගිකව මුදල් සහ සම්පත් වෙන් කිරීම මගින්, දත්ත පද්ධති පුළුල් කිරීම සහ සමූපදේශ යෙදවුම් සෘජුවම පැමිණිලි හසුරුවීමේ ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම සඳහා දායක වන බව සහතික කල යුතුය. වාර්ෂික කාර්ය සාධන සමාලෝචන මගින්, අරමුදල් සහ පරිශ්‍රමයන් පැමිණිලි විසඳීම සහ වින්දිතයන් සඳහාවූ උපකාරක සේවා සඳහා සුහදායීව උපයෝගී කරගෙන ඇත්තේ දැයි විශ්ලේෂණය කල යුතුය.

## 3.1.7. ජාත්‍යන්තර සම්බන්ධීකරණය

ළමා අපයෝජනය නිරතුරුවම දේශ සීමා අභිබවා යන ලෝකව්‍යප්ත ගැටළුවක් වන බැවින්, ජාත්‍යන්තර සම්බන්ධීකරණය ළමා ආරක්ෂක අධිකාරියේ කර්තව්‍යයේ වැදගත් ලක්ෂයකි. විදේශීය රජයන් සහ ජාත්‍යන්තර සංවිධාන සමගින් සම්බන්ධීකරණය වෙමින් තොරතුරු හුවමාරු කර ගැනීම තුලින්, ළමා ආරක්ෂක අධිකාරියට සෑම ආකාරයකම ළමා අපචෝජන අනාවරණය, වළක්වාලීම සහ ප්‍රතිචාර දැක්වීම සඳහාවූ තම හැකියාව පුළුල් කරගත හැකිය. මෙම සම්බන්ධීකරණය මගින්, ළමුන් කොහේ කොතැනක සිටියත් ඔවුන්ට ආරක්ෂණය ලැබෙන බව සහතික කිරීම සඳහා හොර ජාවාරම්, මාර්ගගත උපයෝජනය සහ ජාත්‍යන්තර කුලවැද්දුම් (adoption) ගැටළු වැනි දේශසීමා ඉක්මවා ගිය අභියෝග තරණය කිරීමට හැකිවේ.

ළමා ආරක්ෂක අධිකාරියේ ජාත්‍යන්තර සම්බන්ධීකරණ කටයුතුවලට ඇතුලත් වන කර්තව්‍යයක් වනුයේ :

> 14(ණ) වගන්තිය:
> සියලු ආකාර ළමා අපචාර අනාවරණය කර ගැනීම හා වැළැක්වීම සම්බන්ධයෙන් විදේශ ආණ්ඩු සහ අන්තර් ජාතික සංවිධාන සමඟ සබම්න්ධීකරණයෙන් කටයුතු කිරීම සහ තොරතුරු හුවමාරු කර ගැනීම ය.

ජාත්‍යන්තර සම්බන්ධීකරණය වර්ධනය කර ගැනීමේ ළමා ආරක්ෂක අධිකාරියේ අරමුණු වනුයේ, ඉහළ පරිචයන් බෙදාහදා ගැනීම, විමර්ශන හැකියාවන් පුළුල් කර ගැනීම, සහ ළමා ආරක්ෂණය පිළිබඳ ලෝකව්‍යප්ත ප්‍රමිතීන් හා ඒකාබද්ධ වීමයි. මෙම සම්බන්ධීකරණ හරහා ළමාරක්ෂක අධිකාරියට ජාත්‍යන්තර උපචාරලවලට (forum) සහභාගී වීමට, ලෝකව්‍යප්ත උපායමාර්ග සංවර්ධනයට දායක වීමට, සහ නවෝත්පාදන විසඳුම් ක්‍රම ශ්‍රී ලංකාව වෙත ගෙන ඒමට අවස්ථාව උදා වන්නේය. මෙම කණ්ඩයෙන්, ජාත්‍යන්තර සම්බන්ධීකරණ ගොඩ නැගීම සහ පවත්වාගෙන යාම පිළිබඳව ළමා ආරක්ෂක අධිකාරියේ ඵලදායිතාව, ලෝකව්‍යප්ත නවෝත්පාදන පිළිබඳ එහි සහභාගිත්වය, සහ රටේ ළමා ආරක්ෂක යාන්ත්‍රණය පුළුල් කිරීම කෙරෙහි මෙම සම්බන්ධීකරණවල බලපෑම ඇගයීමට ලක් කෙරේ.

<u>බහුවිධ-පාර්ශවකරුවන් සමග හවුල්කාරිත්වය</u>

ජාත්‍යන්තර සම්බන්ධීකරණය සහ දැනුවත්කම බෙදාහදා ගැනීම සඳහා, ළමා ආරක්ෂක අධිකාරිය ජාත්‍යන්තර සංවිධාන සමඟ නොයෙකුත් සාකච්ඡාවන් වල නිරතවී සිටී. 2020 වර්ෂයේදී, ළමාරක්ෂක අධිකාරියේ, Max Planck Foundation සහ ශ්‍රී ලංකාවේ විනිසුරුවරුන්ගේ ආයත Sri Lanka Judges' Institute නයෝනියෝජිතයන් සහභාගීවූ වටමේස සාකච්ඡාවක් සංවිධානය කිරීම සුවිශේෂ වැදගත් සිද්ධියකි. මෙම නිල සාකච්ඡාවේදී, අභියෝග ජයගැනීම සහ අධිකරණ පද්ධතිමය සමගින්වූ ළමයින්ගේ අන්තර්ක්‍රියාවන්ට (interactions) ‍ෟම්බන්ධිත විශිෂ්ඨ පරිචයන් හඳුනා ගැනීම කෙරෙහි අවධානය යොමු විය. මෙම සාකච්ඡාව මගින්, ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතිය සඳහා විස්තිර්ණ විශිෂ්ඨ පරිචය මාර්ගෝපදේශ වර්ධනය කිරීම අරමුණු කරගත් සැලසුම් කල සමූපදේශ පහෙන් පළමුවැන්න සලකුණු විය(104).

[104] The virtual discussion was held on 26th August 2020 and included 5 consultations.

ළමා ආරක්ෂක අධිකාරියේ නිළධාරීන් විසින්, මගින් ළමා ආරක්ෂණ ක්ෂේත්‍රයේ කටයුතුවල නියැලී සිටින ප්‍රමුඛ පෙළේ රාජ්‍ය නොවන සංවිධාන සමඟින්වූ අධිකාරියේ සම්බන්ධීකරණ කටයුතු අවධාරණය කරන ලදි. සංවාද, දැනුවත්බව බෙදාහදා ගැනීම සහ ඒකාබද්ධ මෙහෙයුම් සඳහා පහසුකම් සැලසීම පිණිස ළමා ආරක්ෂක අධිකාරිය විසින් නිරතුරුවම ත්‍රෛමාසික ජාත්‍යන්තර නොවන සංවිධාන වල උපචරාලයන් සංවිධානය කරනු ලැබේ. මෙම සම්බන්ධීකරණ ප්‍රවේශය World Vision, SAARC Development Fund, Child Fund, UNICEF, Save The Children (105), Internet Watch Foundation (106) වැනි සංවිධාන සමඟින්වූ ළමා ආරක්ෂක අධිකාරියේ හවුල්කාරත්වයන්(107) සාක්ෂි දරයි. ළමා ආරක්ෂක අධිකාරිය විසින් විදේශීය ළමා ආරක්ෂණ සංවිධාන සමඟින්වූ සම්බන්ධීකරණය ඉස්මතු කර දක්වන අතර, සැලකිය යුතු කරුණක් වනුයේ දේශීය බිම් මට්ටමේ සංවිධාන හවුල් කර ගැනීමේ පවතින හීනතාවය මඟින් ළමා ආරක්ෂක අධිකාරිය සහ භූමියේ සෘජුවම කටයුතු කරන අය අතර අවසම්බන්ධයක් නිර්මාණයවී තිබීමයි.

පාර්ශවකරුවන්ගේ සමුපදේශයේදී (108), මාර්ගගත ළමා ලිංගික උපයෝජනය මැඩලීම සහ මාර්ගගත සුපරික්ෂාව සම්බන්ධයෙන්වූ නීතිය බලාත්මක කිරීමේ නියෝජිතායතන වල හැකියාවන් ශක්තිමත් කිරීමේ අරමුණින් මාර්ගගත සුපරීක්ෂණ ක්ෂේත්‍රය පිළිබඳව ජාත්‍යන්තර පොලීසිය INTERPOL විසින් පවත්වන ලද ධාරිතා ගොඩ නැගීමේ වැඩසටහන ද ඇගයුමට ලක්විය.

එපරිද්දෙන්ම, ළමා හොර ජාවරම වැළැක්වීම සහ ඊට පිළියම් යෙදීම පිණිස, ආණ්ඩුවේ සහ සංචාරක ක්ෂේත්‍රයේ ප්‍රධාන කාරකයන් එකමුතු කිරීමේ බහු-පාර්ශවකරුවන් සම්බන්ධීකරණය සඳහාවූ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරිම සඳහා Save The Children පදනම මූලිකත්වය ගෙන ඇත. මෙම සම්බන්ධීකරණ ප්‍රවේශයේ අරමුණ වනුයේ, හොර ජාවරමට හසුවූ ළමුන් හඳුනා ගැනීමේ, වළක්වාලීමේ සහ යොමු කිරීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීමයි.(109)

අවාසනාවකට, ලොව පුරා අධිකරණමය බලය පිළිබඳ විශ්ෂය පරිචයන් බෙදාහදා ගැනීම සහ එවන් වැඩසටහන් වල සහ හවුල්කාරිත්වයන් හි බලපෑම පිළිබඳව ලබාගත හැති තොරතුරු සීමිතය. මෙම නවෝත්පාදනයන් හි ඵලදායිතාව හොඳින් වටහා ගැනීම පිණිස, තම පරිශ්‍රමයන් සහ එහි ප්‍රතිඵල පිළිබඳව වඩාත් විස්තරාත්මක තොරතුරු බෙදාහදා ගැනීම පිළිබඳව ළමා ආරක්ෂක අධිකාරිය සැලකිල්ල යොමු කල යුතුය.

## ප්‍රධාන නිර්දේශ

**1 විනිවිදභාවය සහ වාර්තාකරණය ඉවැඩි කිරීම:**
සුවිශේෂ අරමුණු, ප්‍රතිඵල සහ උගත් පාඩම් ඇතුළු, ජාත්‍යන්තර සම්බන්ධීකරණයන් ලුහුබැඳීම සහ වාර්තාකරණය සඳහා විස්තීර්ණ පද්ධතියක් ළමා ආරක්ෂක අධිකාරිය විසින් වර්ධනය කල යුතුය. විනිවිදභාවය සහ වගවීම වැඩි කිරීම සඳහා මෙම තොරතුරු ප්‍රසිද්ධියේ ලබාගැනීමේ හැකියාව පැවතිය යුතුය.

**2 ධාරිතා ගොඩ නැගීම ශක්තිමත් කිරීම:**
ජාත්‍යන්තර කතිකාවත් නිපුණතාවය, ව්‍යාපෘති කළමනාකරණය, සහ දත්ත විශ්ලේෂණය වැනි ක්ෂේත්‍ර වෙත අවධානය යොමු කරන ළමා ආරක්ෂක අධිකාරියේ කාර්ය මණ්ඩලයේ ධාරිතා වර්ධන වැඩසටහන් සඳහා ආයෝජනය කල යුතුය.

**3 දත්ත බෙදාහදා ගැනීම සහ ශාස්ත්‍රඥාණය කළමනාකරණයට ප්‍රමුඛතාව දීම:**
ජාත්‍යන්තර හවුල්කරුවන් සමඟින් තොරතුරු බෙදා ගැනීම සහ මැදිහත්වීමේ බලපෑම් ලුහුබැඳීමට පහසුකම් සැලසීම සඳහා දැඩි දත්ත බෙදාහදා ගැනීමේ සහ ශාස්ත්‍රඥාණය කළමනාකරණය කිරීමේ පද්ධතියක් වර්ධනය කල යුතුය.

**4 ශක්තිමත් හවුල්කාරිත්වයන් දිරිගැන්වීම:**
ප්‍රවීණතා, සම්පත් සහ ජාලකර්ම උත්තෝලනය කිරීම සඳහා දේශිය සහ ජාත්‍යන්තර සංවිධාන, රජයන් සහ රාජ්‍ය නොවන සංවිධාන සමඟ හවුල්කාරිත්වය ශක්තිමත් කිරීමට සක්‍රියව ඉදිරිපත් විය යුතයග

[105] Key stakeholders include the Ministries of Women and Child Development, Education, Justice, Health, Mass Media, Defence, Tourism, Social Protection, Youth and Sports, Foreign Affairs, and Foreign Employment, as well as the Departments of Police, Labor, Probation and Child Care Services, the Children's Secretariat, and the State Ministries of Pre-Schools, School Infrastructure, Skills Development, and Vocational Education.
[106] See Footnote 12
[107] See Footnote 75
[108] See Footnote 12
[109] See Footnote 50

**5** ෘසම්පත් වෙන්කිරීම වැඩිකර ගැනීම සඳහා හඬ නැගීම:
ළමාරක්ෂක අධිකාරියේ ජාත්‍යන්තර බැඳියාවන් සහ ධාරිතා ගොඩ නැගීමේ පරිශ්‍රමයට සහාය වීම පිණිස අරමුදල් වැඩකර ගැනීමට හඬ නැගිය යුතුය.

**6** උත්තෝලන තාක්ෂණය:
විද්‍යුත් සාකච්ඡා, මාර්ගගත තල සහ දත්ත බෙදා ගැනීමේ මෙවලම් අත්කර ගැනීම වැනි ජාත්‍යන්තර සම්බන්ධීකරණ සඳහා පහසුකම් සැලසීම පිණිස තාක්ෂණය උපයෝගී කරගත යුතුය.

### 3.1.8. අවදානමට භාජනය වියහැකි කණ්ඩායම් සඳහාවූ සහාය

අවාදනමට භාජනය විය හැකි කණ්ඩායම් සඳහා සහාය දැක්වීමේ ළමා ආරක්ෂක අධිකාරියේ කැපවීමට, මානසික සහ කායික සෞඛ්‍ය සේවා, අධ්‍යාපනික අවකාශ, සහ ප්‍රජා සහායක පද්ධති ඇතුලත් විස්තීර්ණ උපායමාර්ග සඳහා පෙනී සිටීම ඇතුලත් වේ (110). ක්ෂණික සහ දිගු-කාලීන අවශ්‍යතාවන් කෙරෙහි අවධානය යොමු කිරීම මඟින්, ප්‍රචණ්ඩත්වයට සහ අස්ථාවරත්වයට නිරාවරණයවී ඇති ළමුන්ගේ සුවවීමේ කාර්යවලියට පහසුකම් සැලසීම සහ ළමුන්ගේ ප්‍රත්‍යස්ථිය (resilience) ප්‍රවර්ධනය කිරීම ළමා ආරක්ෂක අධිකාරියේ අරමුණ වේ. මෙම කණ්ඩය මඟින්, සන්නද්ධ ගැටුම්වල බලපෑමට පාත්‍රවූ ළමුන් ආරක්ෂණය කිරීම සහ ඔවුන් නැවත සමාජයට ඇතුළු කර ගැනීම සඳහා ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම සහ ක්‍රියාත්මක කිරීම, ඔවුන්ගේ ප්‍රතිසාධනය (recovery) සහ අනාගත පෙරදක්නුව (future) (prospects) පිළිබඳව මෙම වැඩසටහන් වල ඵලදායිතාව ආදිය පිළිබඳව ළමා ආරක්ෂක අධිකාරියේ ප්‍රත්‍යුත්ක්‍රම ඇගයීමට ලක් කෙරේ.

අවදානමට භාජනය වියහැකි කණ්ඩායම් සඳහා ළමා ආරක්ෂක අධිකාරියට පැවරී ඇති කර්තව්‍යයක් වනුයේ :

14(එ) වගන්තිය
සන්නද්ධ ගැටුම්වල බලපෑමට පාත්‍රවූ ළමයින් සම්බන්ධ මානුෂිකව සැලකිල්ලට ගත යුතු කරුණු පිළිබඳව යොමුවීම සහ ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම සහ ඔවුන්ගේ මානසික සහ ශාරීරික සුභසිද්ධිය සදහා පියවර ඇතුළුව එවැනි ළමයින්ගේ ආරක්ෂාව සහ ඔවුන් සමාජයට නැවත ඇතුළු කර ගැනීම ය.

<u>පශ්චාත්-යුධ ගැටුම් ප්‍රදේශවල ළමුන් සඳහා සහාය</u>

දශක තුනකට අධික කාලයක් ශ්‍රී ලංකා රජය සහ දෙමළ ඊලාම් කොටි විමුක්ති සංවිධානය (LTTE) අතර පැවති සිවිල් යුද්ධයෙන් තදින් බලපෑමට ලක්වූ ළමුන් ශ්‍රී ලංකාවේ ඉතාමත් අනදානමට භාජනය විය හැකි කණ්ඩායම නියෝජනය කරයි (112). ජනවාර්ගික ආතතියේ ගැලී සිටි මෙම ගැටුම නිසා උතුරේ සහ නැගෙනහිර ප්‍රදේශවල ළමුන්ට ප්‍රචණ්ඩත්වයට, අවතැන්වීමට සහ සමහරුන්ට බලහත්කාරී බඳවා ගැනීම්වලට මුහුණ දීමට සිදුවිය (113). මෙම ළමුන්ට විඳින්නට සිදුවූ කම්පනය, හානිය සහ අස්ථාවරභාවය මඟින්, මානසික සෞඛ්‍ය සුරැකුම, අධ්‍යාපනය සහ නැවත සමාජයට ඇතුළු කර ගැනීමේ පියවර කෙරහි අවධානය යොමු කරන විස්තීර්ණ සහාය දැක්වීමේ පද්ධතියක අවශ්‍යතාවය ඉස්මතු කර දක්වයි.

සන්නද්ධ ගැටුම්වල බලපෑමට පාත්‍රවූ ළමයින් සම්බන්ධ මානුෂික සැලකිල්ල පිළිබඳව යොමුවීමේ කර්තව්‍ය පැවරී ඇති ළමා ආරක්ෂක අධිකාරිය විසින්, යුද්ධයෙන් පීඩාවට පත් අවදානමට භාජනය වියහැකි ළමුන්ට සහාය වීම සඳහා සක්‍රියව නියැලී ඇත. 2012 වර්ෂයේදී, ළමා ආරක්ෂක අධිකාරිය විසින් නැගෙනහිර පළාතේ කැපකාර දෙමාපියන (foster parents) සහ ඥාතීන් සමඟ ජීවත්වන අනාථ දරුවන්ට උපකාර කිරීම සඳහාවූ කිරීම සඳහාවූ වැඩසටහනක් දියත් කරන ලදි. මෙම වැඩසටහන් මඟින් කිලිනොච්චිය, මුලතිව් සහ වවුනියාව වැනි දිස්ත්‍රික්කවල ළමුන් සඳහා අත්‍යවශ්‍ය පාසල් සැපයුම් ලබා දෙන ලදි (114)

මෙම ළමයින්ට මුහුණ දීමට සිදුව ඇති අද්විතීය අභියෝග සැලකිල්ලට ගැනීමේදී, ඔවුන්ගේ මානුෂිකත්වය සැලකිල්ලට ගැනීම, ඔවුන්ගේ ආරක්ෂණය, සුභසිද්ධිය සහ සාර්ථකව නැවත සමාජයට ඇතුළුවීම තහවුරු කිරීම සඳහා පියවර නිර්දේශ කිරීමේ කර්තව්‍ය ළමා ආරක්ෂක අධිකාරිය වෙත පැවරී ඇත. ගැටුම්කාරි වාතාවරණයක ජීවත් වන ළමයින්, බොහෝ විට කම්පනයට, හානියට සහ භේදනයට ලක්වන අතර, එබැවින් ඔවුන්ගේ ආරක්ෂණය සහ අයිතීන් පිළිබඳ සංවේදය යළි පිහිටුවීම සඳහා ඉලක්කගත මැදිහත්වීමක් අවශ්‍ය වේ.

පාර්ශවකරුවන්ගේ සමූපදේශීයේදී, ළමා ආරක්ෂක අධිකාරිය විසින් යුද්ධයෙන් පීඩාවට පත් ප්‍රදේශවල ළමයින් සඳහා මනෝ සමාජයීය සහාය, සුභසාධන ආධාර සහ අධ්‍යාපනය සඳහා අරමුදල් පිරිනැමීම සිදුකර ඇති බව ඉස්මතු විය. එම සමූපදේශයේදී, මෙම අවදානමට භාජනය වියහැකි ළමුන්ට ඵලදායිවීව සහාය දැක්වීම සහ සුරක්ෂිත කිරීම සඳහා ළමා

[110] Annual Report of the National Child Protection Authority 2015
[111] This programme targeted six hundred orphaned children living with foster parents and relations in the Northern Province. Previously the Surathma programme launched by the NCPA targeted 200 orphans providing welfare assistance.
[112]Despite the end of the war, a significant portion of the Tamil population remains displaced. While political and civil rights issues have decreased, incidents of torture and enforced disappearances continue to occur.
[113] The study revealed the devastating impact of war on children. Children accounted for 20% of landmine victims, 38% of amputees, 36% of stunted children in war-affected regions, and 50% of displaced children living in camps.
[114] Ibid

ආරක්ෂක අධිකාරිය තුල සම්පත් සහ සේවකයන් වැඩිකිරීමේ තීරණාත්මක අවශ්‍යතාවය කෙරෙහි අවධානය යොමු කරන ලදි (115).

අවදානමට භාජනය වියහැකි ළමුන්ට සහාය දීමේ ළමා ආරක්ෂක අධිකාරියේ බලපෑම නිවැරදිව ඇගයීම සඳහා, වාර්ෂික වාර්තා වඩාත් විනිවිදභාවයෙන් යුක්ත වීම තීරණාත්මක වේ. මෙම විනිවිදභාවයට, යුධ වින්දිත ළමුන්ගේ අයිතිවාසිකම් දාරණය කිරීමට අධිකාරිය විසින් ගන්නා ලද සුවශේෂ පියවර පිළිබඳ විස්තරාත්මක තොරතුරු ඇතුලත් විය යුතුය.අමතරව, මිණිය හැකි ප්‍රතිඵල සහ බලපෑම් ඇගයීම් ඇතුළු මෙම වැඩසටහන් වල ඵලදායිතාව පිළිබඳව අන්තර්දෘෂ්ටි මෙම වාර්තා මඟින් සැපයිය යුතුය. එවන් විස්තීර්ණ තොරතුරු සැපයීම මඟින්, ළමා ආරක්ෂක අධිකාරියට ළමා ආරක්ෂණය පිළිබඳ එහි කැපවීම ප්‍රදර්ශනය කල හැකි අතර, අධිකාරියේ කාර්යා සාධනය පිළිබඳව විශ්ලේෂණය කිරීමට පාර්ශවකරුවන්ට හැකියාව ලැබේ.

## <u>දුබලතා සහිත ළමුන් සඳහා සහාය</u>

දුබලතා (disabilities) සහිත ළමුන්ට අපකීර්තිය, වෙනස්කමට භාජනය වීම, සහ සමාජ අගතීන් තුලින් මතුවන විශාල අභියෝග රැසකට මුහුණ පෑමට සිදුවේ. දුබලතාවලින් තොර තම සම්යුරන් සමඟ සංසන්ධනය කිරීමේදී මෙම පිරිසට, ප්‍රචණ්ඩත්වයට, නොසැලකිල්ලට, අපයෝජනයට සහ උපයෝජනයට මුහුණ දීමේ වඩාත් අනතුරුදායක අවදානමක් පවතී (116). සීමිත පර්යේෂණ, ලබාගත හැකි අධ්‍යයනයන් තුලින්, ඔවුන් යොවුන් වියට පත්වීමේදී කායික, චිත්තවේගී සහ ලිංගික ප්‍රචණ්ඩත්වයට පාත්‍ර වීමේ උත්සන්න වන අවදානම ඉස්මතු කර දක්වයි. 2012 වර්ෂයේ අධ්‍යයනයක් මඟින්, වයස අවුරුදු 5-19 ත් අතර ළමුන්ගෙන් 1.67% ක් දුබලතා සහිව ජීවත් වන බව අනාවරණය කර ඇත (117).

මෙම අන්තරායන්ට පිළියම් වශයෙන් ළමා ආරක්ෂක අධිකාරිය විසින්, අදෘශ්‍යමාන දුබලතා සහිත ළමුන් හඳුනා ගැනීම සඳහා ක්‍රමවේදයක් වර්ධනය කර ඇත (118). මෙම මෙවලමේ අරමුණ වී ඇත්තේ, විශේෂයෙන්ම දුබලතාවයේ තත්වය විගසින් නොපෙනෙන දුබලතා සහිත ළමුන් හොඳින් හඳුනා ගෙන සහාය දැක්වීම සඳහා ළමා ආරක්ෂණ නිලධාරීන් සහ ප්‍රජාවන් බලගැන්වීමයි. හඳුනා ගැනීම සහ වටහා ගැනීම වැඩිදියුණු කිරීමෙන්, වඩාත් ඵලදායී වළක්වාලීමේ සහ මැදිහත්වීමේ උපාය මාර්ගවලට සහ අත්‍යන්තව දුබලතා සහිත ළමුන්ගේ අයිතීන් සහ සුභසිද්ධිය සුරක්ෂිත කිරීම සඳවා මෙම ක්‍රමවේදය දායක වනු ඇත. දුබලතා සහිත ළමින්ගේ අයිතීන් සුරක්ෂිත කිරීම සඳහා මාර්ගෝපදේශ සම්පාදනය මඟින් ළමා ආරක්ෂක අධිකාරිය විසින් ප්‍රශංසනීය පියවරක් ගෙන ඇති නමුත්, මෙම මාර්ගෝපදේශ ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේදී සුවිශේෂ ශාස්ත්‍රඥාණ ඉඩැසක් පවතින්නේය. අත්පොතෙහි මූලධර්ම ප්‍රත්‍යක්ෂ ප්‍රතිඵලයක් වශයෙන් හැරවීම සඳහා, ළමා ආරක්ෂක අධිකාරියේ සුවිශේෂ උපායමාර්ග සහ ගන්නා ලද පියවර පිළිබඳ ගැඹුරින් අධ්‍යයනය කල යුතුය. වැඩිමනත්ව, දුබලතා සහිත ළමයින් මුහුණ දෙන අභියෝග ජයගැනිම සඳහා මාර්ගෝපදේශයේ ඵලදායිතාව මිණීම සඳහා එහි බලපෑම ඇගයිය යුතුවේ.ප්‍රතිඵල සහ උගත් පාඩම් විශ්ලේෂනය මඟින්, ළමා ආරක්ෂක අධිකාරියට තම ප්‍රවේශය ප්‍රසාධනය කරමින් වැඩිදියුණු කල යුතු ක්ෂේත්‍ර හඳුනාගත හැකිය. දුබලතා සහිත අවදානමට භාජනය වියහැකි ළමුන්ට විස්තීර්ණ සහාය දැක්වීම සහතික වීම සඳහා, මාර්ගෝපදේශයේ අනුබලය සහ ළමා ආරක්ෂක අධිකාරිය විසින් ක්‍රියාත්මක කර ඇති වෙනත් උපායමාර්ග පිළිබඳව වැඩිදුර තොරතුරු බෙදා ගැනීම අනිවාර්ය වේ. මෙම විනිවිදභාවය මඟින් වගවීම ඉවැඩි කරනවා පමණක් නොව, පාර්ශවකරුවන් අතර වැඩිදුර ක්‍රියාකාරකම් සහ සම්බන්ධීකරණය දිරි ගන්වනු ඇත.

## ප්‍රධාන නිර්දේශ

1. **ළඟාවීම සහ ප්‍රවේශය ඉවැඩි කිරීම:** දුරබැහැර සහ කොන්කරන ලද ප්‍රදේශවල අවදානමට භාජනය වියහැකි ළමුන් හඳුනා ගැනීම සහ ඔවුන් වෙත ළඟාවීම සඳහා ළඟාවීමේ පරිශ්‍රම වැඩි කිරීම. සේවාවන් සඳහා පහසුකම් සැපයීමට පළාත් ප්‍රජාව, රාජ්‍ය නොවන සංවිධාන සහ රාජ්‍ය ආයතන සමඟ ශක්තිමත් හවුල්කාරිත්වයක් ස්ථාපිත කල යුතුය.

2. **මනෝ සමාජයීය සහාය සේවා ශක්තිමත් කිරීම:** කම්පනය සහ හානියට පත් ළමුන්ට එයින් මිදීම සඳහා සහාය වීම සඳහා උපදේශන සහ ප්‍රජාපාදක මැදිහත්වීම් ඇතුළු විස්තීර්ණ මනෝ සමාජයීය සහාය ලබාදිය යුතුය.

3. **දිගු-කාලීන සහාය සහතික වීම:** ශිෂ්‍යත්ව වැඩසටහන්, වෘත්තීය පුහුණුව සහ ජීවනෝපාය ප්‍රත්‍යුත්ක්‍රම වැනි ඉදිරියට දිවෙන සහාය සැපයීමේ සුනිත්‍ය යාන්ත්‍රණයක් වර්ධනය කල යුතුවේ.

4. **ණියාමනය සහ විශ්ලේෂණය ශක්තිමත් කිරීම:** ප්‍රගතිය ලුහුබැඳීම, බලපෑම් මිණුම්කරණය, සහ දියුණු කල යුතු ක්ෂේත්‍ර හඳුනා ගැනීම සඳහා දැඩි නියාමන සහ විශ්ලේෂන පද්ධතියක් ක්‍රියාත්මක කල යුතුවේ.

[115] See Footnote 12.
[116] Children with Disabilities | UN Special Representative of the Secretary-General on Violence Against Children
[117] Lack of data on disability, pervasive stigma, widespread lack of awareness, and poverty create countless barriers to equality and accessibility for children with disabilities.
[118] This guide bridges the knowledge gap for both professionals working with children with disabilities and the general public.

**5** ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණය සඳහා පෙනී සිටීම: යුක්තිය සඳහා ප්‍රවේශය, වන්දි සහ සමාජ සේවා ඇතුළු සන්නද්ධ ගැටුම් නිසා බලපෑමට ලක්වූ ළමුන්ගේ අයිතීන් සහ සුභසිද්ධියට ප්‍රමුඛතාව දෙන ප්‍රතිපත්ති සකස් කිරීමට ළමා ආරක්ෂක අධිකාරිය පෙනී සිටිය යුතුය.

**6** ජාත්‍යන්තර සම්බන්ධීකරණ දිරිමත් කිරීම: සම්පත් ජංගනනය විශිෂ්ඨ පරිචයන් බෙදා ගැනීම, සන්නද්ධ ගැටුම් නිසා බලපෑමට ලක්වූ ළමන්ගේ අයිතීන් වෙනුවෙන් පෙනී සිටීම සඳහා ජාත්‍යන්තර සංවිධාන සමඟ හවුල්කාරිත්වයන් ශක්තිමත් කල යුතුය.

**7** දත්ත එක්රැස් කිරීම සහ විශ්ලේෂණය: රටේ පවතින දුබලතාවන් පිළිබඳ නිරවද්‍ය සහ යාවත්කාලීන දත්ත එක්රැස් කර ගැනීම සඳහා විස්තීර්ණ පර්යේෂණ පැවැත්වීම. දුබලතා සහිත ළමුන්ගේ විශේෂ අවශ්‍යතාවන් සහ අවදානම් හඳුනා ගැනීම පිණිස දත්ත විශ්ලේෂණය කල යුතු වේ.

**8** දැනුවත්බව සහ සංවේදීකරණය: දුබලතාව පිළිබඳ මිත්‍යාවන් සහ දුර්මත දුරුකරලීම සඳහා ඉලක්කගත දැනුවත් කිරීමේ ප්‍රචාරණ ක්‍රියාත්මක කිරීම. ඇතුලත් පරිචයන් සහ ළමා ආරක්ෂණය පිළිබඳව වෘත්තීකයන්, අධ්‍යාපනවේදීන් සහ ප්‍රජා සාමාජිකයන් පුහුණු කල යුතු වේ.

**9** බලපෑම් ඇගයීම: වැඩිදියුණු කල යුතු ක්ෂේත්‍ර හඳුනා ගැනීම පිණිස ළමා ආරක්ෂක අධිකාරියේ ප්‍රත්‍යුත්ක්‍රම සහ වැඩසටහන් නිරන්තරයෙන් ඇගයීමට ලක් කල යුතුය.

### 3.1.9. අනෙකුත් තීරණාත්මක අවශ්‍යතාවන් පිළිබඳ ළමා ආරක්ෂක අධිකාරියේ ප්‍රතිචාරවය

<u>කොවිඩ් 19 වසංගතය හමුවේ ළමා ආරක්ෂක අධිකාරියේ ප්‍රතිචාරවය</u>

ශ්‍රී ලංකාවේ පළමු කොවිඩ්-19 රෝගියකු වාර්තාවී හුදෙක් මාසයක් පමණක් ගෙවී ගොස් තිබියදී, 2020 අප්‍රේල් මාසයේදී, “1929” ළමා දුරකථන මාර්ගයට වාර්තාවූ ළමා කෘෘරත්ව පැමිණිලි වල සැලකිය යුතු වැඩිවීමක් පිළිබඳව යුනිසෙෆ් ආයතනය සහ ළමා ආරක්ෂක අධිකාරිය බරපතළ සැලකිල්ල යොමු කරන ලදි(119).මෙම තර්ජනාත්මක රටාව 2020 මාර්තු මාසයේදී රටපුරා පනවන ලද ඇඳිරි නීතිය සමඟ සමපාත (coincided) විය. අගුලු දැමීම පැනවීමට අනතුරුව ගතවූ සති තුනක කාලය තුලදී, සියලුම වාර්තාවූ ළමා ආරක්ෂණ පැමිණිලි අතරෙන්, ළමා කෘෘරත්ව පැමිණිලි අනුපාතය 10% සිට 40%(120) දක්වා ඉහළ ගොස් තිබුණි. වැඩිමනත්ව, රට අගුලු දමා තිබූ කාලයේ ළමයින් වැඩි කාලයක් මාර්ගගත සම්බන්ධතා සමඟ රැඳී සිටි බැවින්, ළමුන්ට එරෙහි මාර්ගගත ප්‍රචණ්ඩත්ව ක්‍රියාවලි වැඩිවීමක් ළමා ආරක්ෂක අධිකාරියේ සයිබර් අපරාධ ඒකකය විසින් නිරීක්ෂණය කරන ලදි(121).

වසංගත කාලය පුරාවටම අත්‍යවශ්‍ය ළමා ආරක්ෂණ සේවා පවත්වාගෙන යාමේදී ළමා ආරක්ෂක අධිකාරිය විශ්ෂ්ඨ කැපවීමක් ප්‍රදර්ශනය කලේය. රටපුරා ඇඳිරි නීතිය ක්‍රියාත්මකව පැවති නමුදු, අවශ්‍යතාවන් ඇති ළමුන් සඳහා සහාය නිරන්තරයෙන්ම ලැබීම සහතික වෙමින්(122), “1929” ළමා දුරකථන මාර්ගය, සම්පූර්ණ කාර්ය මණ්ඩලය සහිතව ක්‍රියාකාරීව පැවතියේය. ළමා ආරක්ෂක අධිකාරියේ හිටපු සභාපතිවරයකු විසින් ඉස්මතු කර දැක්වූ පරිදි, මෙම නොසැලෙන කැපවීම, එකී අභියෝගාත්මක කාලයේදී අවදානමට භාජනය වියහැකි ළමුන් ආරක්ෂණය කර ගැනීම(123) සඳහා තීරණාත්මක සාධකයක් විය.

ළමා ආරක්ෂක අධිකාරිය විසින් අවදානමට භාජනය වියහැකි ළමුන්ට සහාය වීමේ පියවරක් වශයෙන්, ඔවුන්ගේ විශේෂිත අවශ්‍යතාවන් හඳුනා ගැනීම පිණිස සීඝ්‍රව අවශ්‍යතා ඇගයීමේ (Rapid Needs Assessment) වැඩසටහනක් පවත්වන ලදි. එසේ නමුත්, ඉලක්කගත මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීමේ මෙම ඇගයීමේ(124) බලපෑම පිළිබඳව සවිස්තරාත්මක තොරතුරු වාර්ෂික වාර්තාවල දක්නට නැත.

---

[119] UNICEF has reported a significant global increase in domestic violence against women and girls, which has been attributed to government-imposed lockdowns in response to the COVID-19 pandemic.
[120] In the three weeks between March 16 and April 7 2020.
[121] The COVID-19 pandemic and subsequent lockdowns led to a surge in cybercrimes against children. With schools and other activities shifting online, children spent significantly more time on digital devices, making them more vulnerable to online predators. Increased internet usage coupled with reduced adult supervision created opportunities for offenders to groom and exploit children.
[122] “UNICEF and NCPA “Gravely Concerned” by Rise in Child Cruelty Cases since Start of COVID-19 Curfew | Daily FT.” Www.ft.lk, 9 Apr. 2020, www.ft.lk/breaking_news/UNICEF-and-NCPA-gravely-concerned-by-rise-in-child-cruelty-cases-since-start-of-COVID-19-curfew/10526-698705. Accessed 10 Oct. 2024.
23] Ibid
[124] See Footnote 49

මෙම ප්‍රත්‍යුත්ක්‍රම ප්‍රශංසනීය වන නමුත්, ළමයින්ගේ සුභසිද්ධිය කෙරෙහි වසංගතයේ සෘණාත්මක බලපෑම සැහැල්ලු කිරීම සඳහා ඔවුන්ගේ ඵලදායිතාව ඇගයීම සඳහා වැඩිදුර විශ්ලේෂණ අවශ්‍ය වේ(125). මෙම වැඩසටහනේ ප්‍රවාවයක් ළමාරක්ෂක අධිකාරියේ පුහුණුවලත් උපදේශකයින්ගේ නායකත්වයෙන් ක්‍රියාත්මක කරන ලද අතර, රජයේ ව්‍යුහය තුල පූර්ණව සංකලනය  කරන ලදි. මෙම ප්‍රවාවය සඳහා පුහුණුව ලත් නිලධාරීන්ගේ සේවය ලබා ගන්නා ලද අතර,  Save the Children, World Vision සහ ප්‍රජා සංවර්ධන සංවිධානයක් වන Leads සමඟින් සම්බන්ධීකරණවී සංවර්ධනය කරන ලද විෂය පරිපාටියක් උපයෝගී කර ගන්නා ලදි.

මෙම මැදිහත්වීම තුලින්, ළමුන් 5,110 කට පමණ තාත්වික මනෝ සමාජයීය සහාය සැපයීම මඟින් ළමා ආරක්ෂක අධිකාරිය විසින් 2,500 කට අධික පැමිණිලි ප්‍රමාණයක් සාර්ථකව කළමනාකරණය කර ඇත (126). මෙම තාත්වික පද්ධතිය මඟින්, වසංගත සමයේදී සාම්ප්‍රදායික මුහුණට-මුහුණ හමුවී ලබා දෙන සේවා බිඳ වැටී තිබියදී, තීරණාත්මක මනෝ සමාජයීය සහාය ලබාදීමෙන් ළමුන් වෙත දිවියොතක් (lifeline) ලබා දෙන ලදි. තවද, එමඟින් සහාය සැපයීම සඳහා අවැසි කුසලතා සහිත දේශීය ජාලයක් සූදානම් කිරීමෙන් ප්‍රජා ප්‍රත්‍යස්ථිතිය ශක්තිමත් කරන ලදි(127).

කොවිඩ් 19 වසංගතය සඳහා ළමා ආරක්ෂක අධිකාරිය දැක්වූ නවෝත්පාදිත ප්‍රතිචාරය මඟින් ළමයින්ගේ සුභසිද්ධිය ආරක්ෂණය කිරීම සඳහාවූ එහි කැපවීම ප්‍රදර්ශනය විය. අර්බුදකාරී කාලය තුලදී පවා ළමයින්ට අත්‍යවශ්‍ය සුරැකුම දිගටම ලබාදීම සහතික වීමේදී, දැඩි තාත්වික මනෝ සමාජයීය සහාය පද්ධතියක් ස්ථාපනය කිරීම මඟින් ළමා ආරක්ෂක අධිකාරිය වැදගත් භූමිකාවක් ඉටු කර ඇත.

<u>පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරය හමුවේ ළමා ආරක්ෂක අධිකාරියේ ප්‍රතිචාරය</u>

ප්‍රහාරයෙන් පසුව, ළමා වින්දියන්ට අමතර උපදේශන සහ මනෝ සමාජයීය සහාය ලබා දෙන ලදි(128). මෙම පරිශ්‍රමයන් එසේ තිබෙන නමුත්, මෙම අර්බුද හමුවේ ළමා අයිතීන් දාරණය කිරීම සඳහා ළමා ආරක්ෂක අධිකාරිය විසින් ගන්නා ලද පියවර පිළිබඳ තොරතුරු සීමිතව පවතී.

<u>ආර්ථික අර්බුදය හමුවේ ළමා ආරක්ෂක අධිකාරියේ ප්‍රතිචාරය</u>

ඉතිහාසය පුරාවටම කොන්කිරීමට සහ ඔවුන්ගේ ආවේණික අවාසි සහගත තත්වය නිසා උපයෝජනයට ලක්වූ ළමයින්ගේ අවදානමට භාජනය වීමේ වියහැකියාව 2022 ආර්ථික අර්බුදය හමුවේ වඩාත් තීව්‍ර විය. ළමා දරිද්‍රතාව පිටුදැකීම සඳහා, දැඩි සමාජ ආරක්ෂණ පද්ධතියක් මඟින් සියලුම ළමයින්ට අත්‍යවශ්‍ය සේවාවන් සඳහා සමානාත්මක ප්‍රවේශය සහතික කිරීම පිණිස විශේෂිත පියවර ස්ථාපිත කල යුතුය.

අර්බුදයෙන් මතුවූ එක් වඩාත් බලගතු සැලකිල්ලට භාජනය විය යුතු කරුණක් වූයේ, ළමා මෙහෙවර, හොර ජාවාරම සහ උපයෝජනයයි. ඊටත් අමතරව, ළමුන්ට එරෙහිව සිදුකරන ලද සයිබර් අපරාධ වැඩිවීම මඟින්, ඩිජිටල් යුගයේදී ළමයින්ගේ ආරක්ෂණය සඳහා හදිසි අවශ්‍යතාවය ඉස්මතු කර දක්වයි. අවදානමට  භාජනය වීමේ ළමයින්ගේ වියහැකියාව නිසා ඔවුන් මාර්ගගත හිංසාවට සහ අවදානම් සහිත චර්යාවන්ට අවනත වීමේ ඉඩකඩ ඉමහත්ය (129).



[125] The NCPA, with UNICEF's support, rapidly established a sustainable virtual psychosocial support system to meet the urgent needs of children during the COVID-19 pandemic. This included the training of 268 NCPA Officers, which included 25 district Psychosocial Officers and 243 Divisional Child Protection Officers, in remote psychological first aid, psychosocial support, and referrals, the integration of a virtual system with village-level social workers to ensure effective outreach and follow-up, and the development of the "Look, Listen, Link" strategy to guide efficient responses to children's urgent needs
[126]  UNICEF 2020: UNICEF and NCPA gravely concerned by increase in proportion of child cruelty cases report to NCPA Hotline since the start of the COVID-19 curfew.
[127] Ibid
[128] See Footnote 12
[129] See Footnote 115

## 3.2 සම්පත් වෙන්කිරීම සහ උපයෝගීතාව

### 3.2.1. මූල්‍ය විශ්ලේෂනය

රට තුල පැතිරී පවත්නා මිලියන 7 ක ආසන්න ළමයින්ගේ අයිතීන් සහ සුභසිද්ධිය සුරක්ෂිත කිරීමෙහි ලා, ශ්‍රී ලංකාවේ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වැදගත් භූමිකාවක් ඉටු කරයි. එසේ වුවද, අධිකාරියේ ඵලදායිතාවට සැලකිය යුතු කරුණක් වනුයේ එහි සම්පත් ඵලදායීව වෙන් කිරීම සහ උපයෙයෝගී කර ගැනීම වන අතර, එය මෑත වසරවලදී පරිනිරීක්ෂණයට (scrutiny) භාජනය වී ඇත.

ළමා ආරක්ෂක අධිකාරියේ වාර්ෂික වාර්තා, මූල්‍ය ප්‍රකාශන, ආදායම් ප්‍රකාශන, මුදල් ගලනය සහ විගණකාධිපතිවරයාගේ වාර්ෂික වාර්තා මඟින් සුවිශේෂ අඩුලුහුඩුකම් රාශියක් ගෙනහැර දක්වා ඇත.

### 3.2.2. අරමුදල් ඌණ උපයෝගිතාව

විශාල ප්‍රදානයන් වැය නොකර පවතින බව නිරීක්ෂනය කල හැකි අතර, එමගින් ළමා ආරක්ෂක අධිකාරියේ අයවැයෙහි අතිරික්තයක් පෙන්නුම් කරයි(130). මෙයින් හැඟවෙන්නේ, සැලසුම්කරණය සහ ක්‍රියාත්මක කිරීමේ අකාර්යක්ෂමතාව හෝ අරමුදල් ඵලදායීව උපයෝගී කර ගැනීමේ හැකියාවේ ඌණතාවයක් පවතින බවයි. විශේෂිත ව්‍යාපෘති සඳහා වෙන්කරන ලද අරමුදල් බෙදා හැරීමේ ප්‍රමාදයක් පෙන්නුම් කරන අතර, එමගින් ව්‍යාපෘති ප්‍රමාදය සහ බලපෑම් විභව ලෙස හීන කර ඇත. මෙයට නිලධාරිවාදී බාධක, කාර්ය මණ්ඩලයේ හිඟය හෝ අරමුදල් උපයෝගිතාව පිළිබඳ පැහැදිලි මාර්ගෝපදේශ නොමැති වීම හේතු වශයෙන් දැක්විය හැකිය.

උදාහරණයක් වශයෙන්, ළමා අපචාර වැළක්වීම සහ වින්දියන් ආරක්ෂා කිරීමෙ සඳහා 2010 වර්ෂයේදී ස්ථාපිත කරන ලද ජාතික ළමා ආරක්ෂක අරමුදල, 2018 වර්ෂයේ සිට අපෙක්ෂිත කාර්ය සඳහා උපයෝගී කරගෙන නොමැති බව, 2021 වර්ෂය සඳහාවූ විගණකාධිපතිවරයාගේ වාර්තාවෙන් ඉස්මතු කර ඇත. 2021 දෙසැම්බර් 31 දින වන විට, රුපියල් මිලියන 2.8 ක්වූ ශේෂයක් වෙන් නොකර පවතින අතර, එකතුව රුපියල් මිලියන 1.9 ක්වූ අරමුදල් තුනක් වසරක සිට වසර එකළොහකට අධික කාලයක් නිද්‍රාගතව පවතී. මෙමඟින් මෙම මූල්‍ය ඇණහිටීමට පිළියම් යෙදීමේ හදිසි අවශ්‍යතාවය ප්‍රබලව පෙන්නුම් කරයි.

### 3.2.3. අරමුදල් අවකළමනාකරණය

අරමුදල් අවභාවිතය වැනි මූල්‍ය අක්‍රමිකතා සිද්ධීන් වාර්තාවී ඇති අතර, එමගින් ළමා ආරක්ෂක අධිකාරිය තුල අවධානයේ සහ වගවීමේ හීනතාවයක් පවතින බව හැඟවෙන්නේය. විනිවිදභාවයෙන් තොරවීම, අරමුදල් භාවිතය සහ විභව අක්‍රමිකතා හඳුනා ගැනීම ලුහුබැඳීම දුෂ්කර ක්‍රියාවක් බවට පත් කිරීම මත ළමා ආරක්ෂක අධිකාරියේ මූල්‍ය වාර්තාකරණය දැඩි විවේචනයට භාජනයවී ඇත.

2022 වර්ෂය සඳහාවූ විගණකාධිපතිවරයාගේ වාර්තාවෙන් වටිනා වත්කම් උපයෝගී  කර ගැනීමේ ඌණතාවන් ඉස්මතු කර දක්වා ඇත: 2016 වර්ෂයේදී රුපියල් මිලියන 18 කට බද්දට ගන්නා ලද ඉඩමක් වැඩකට යොදා නොගෙන අතහැර දමා ඇත. මෙමඟින් විභව සම්පත් අවකළමනාකරණය සහ අභිමිවූ අවස්ථා පිළිබඳ අවදානය යොමු වේ.පාර්ශවකරුවන්ගේ සමූපදේශයේදී, නවීන පහසුකම් සහිත ගොඩනැගිල්ලක් සඳහාවූ මහා අපෙක්ෂාවන් සහිත සැලසුමක් අනාවරණය වූ නමුත්, ළමා ආරක්ෂක අධිකාරියේ වාර්තාවී ඇති සම්පත් සංරෝධනයේ (constraints) හේතුවෙන් එය යථාර්ථයක් විය නොහැකිය(131). සමුපදේශය පුරාවටම නැවත නැවත මතුකරන ලද කරුණක් වූයේ, ප්‍රමාණවත් අරමුදල් සහ සම්පත් හීනතාවය සහ එමඟින් ළමා ආරක්ෂක අධිකාරියට තම කර්තව්‍යයන් ඵලදායිව ඉටුකිරීමේ හැකියාවට බාධා පමුණුවා ඇත යන ප්‍රලාපයයි.

### 3.2.4. ගිණුම්කරන අඩුලුහුඬුකම් සහ මූල්‍ය අක්‍රමිකතා

ඉහත සඳහන් ගැටළුවලට අමතරව, ගිණුම්කරණ අඩුලුහුඩුකම් සහ මූල්‍ය අක්‍රමිකතා රැසක් හේතුවෙන් ළමා ආරක්ෂක අධිකාරියේ මූල්‍ය කළමනාකරණ පරිචය පරිනිරීක්ෂණයට භාජනය වී ඇති අතර, එමඟින් තම සම්පත් ඵලදායීව උපයෝගී කර ගැනීමේ අධිකාරියේ හැකියාව පිළිබඳව අවදානයට ලක්වී ඇත.

- හේතු දක්වා නොමැති විෂමතා: ළමා ආරක්ෂක අධිකාරියට එහි මූල්‍ය වාර්තා සහ භෞතික වත්කම් අතර විෂමතා අත්විඳින්නට සිදුව ඇති අතර, එමඟින් දේපල ලැයිස්තු කළමනාකරණය හෝ වත්කම් තක්සේරු පිළිබඳ විභව විෂමතා පවතින බවට ඉඟි පහළ වේ.

[130] See Footnote 67
[131] See Footnote 12
[132] The NCPA, failing to fulfil its mandate to investigate child abuse cases, has cited a lack of authority as an excuse. While the NCPA can receive complaints regarding child abuse, including rape, sexual abuse, physical abuse, and violations of the Children and Young Persons Ordinance, NCPA officers have stated that it lacks the power to initiate investigations into these matters.

- ඃනොපියවූ බැරකම්: ණයහිමියන්ට ගෙවිය යුතු හිඟයන් ඇතුළු නොපියවූ බැරකම් සැලකිය යුතු ප්‍රමාණයක් ළමා ආරක්ෂක අධිකාරියට පවතින බව අනාවරණය වී ඇත.මෙය ආයතනයේ මූල්‍ය ස්වස්ථාවට සහ කීර්තියට සෘණාත්මක බලපෑමක් ඇති කරයි.
- ඃසැලකිය යුතු ජංගම වත්කම් ශේෂයක් ඉදිරියට ගෙනයාම: ළමා ආරක්ෂක අධිකාරිය විසින් තම ජංගම වත්කම් ගිණුම්වල සැලකිය යුතු ශේෂයක් ඉදිරියට ගෙන යමින් සිටින්නේ, එම අරමුදල් ආයෝජනය කිරීමට හෝ උපයෝගී කර ගැනීමට සුදුසු පියවර ගැනීමකින් තොරවය. මෙමඟින් විභව ඉපැයීම් හෝ ආයෝජන අවස්ථා අහිමි විය හැකිය.

### 3.2.5. මානව සම්පත්

ළමා ආරක්ෂක අධිකාරියේ කාර්ය මණ්ඩල පරිපාලනයේ සැලකිය යුතු විෂමතා සහ අක්‍රියතා රැසක් විගණකාධිපතිවරයාගේ වාර්තා මඟින් ඉස්මතු කර දක්වා ඇත. මෙම අඩුලුහුඩුකම්, ශ්‍රී ලංකාවේ ළමයින්ගේ අයිතීන් සහ සුභසිද්ධිය ඵලදායිව සුරැකීමේ ළමා ආරක්ෂක අධිකාරියේ හැකියාව පිළිබඳ විචක්ෂණ ව්‍යංග්‍යත්වයක් (profound implications) නිර්මාණය කරයි.

තීරණාත්මක ගැටළුවක් වනුයේ, නිලබලයෙන් අනුමත කරන ලද තනතුරු වලට තියුණු ලෙස ප්‍රතිවිරෝධීව, අධිකාරියේ කාර්ය මණ්ඩල පුරප්පාඩු සුවිශේෂ ප්‍රමාණයක් පැවතීමයි.කාර්ය මණ්ඩල හිඟය, අත්‍යවශ්‍ය අවශ්‍යතා සැපයීමේ සහ ළමා ආරක්ෂණ අවශ්‍යතාවන්ට ක්ෂණික ප්‍රතිචාර දැක්වීමේ ආයතනයේ හැකියාවට සුවිශේෂ බාධකයකි. වැඩිමනත්ව, ඉදිරිපෙළ සේවා සැපයීමේදී සහ ළමා අපයෝජන සහ නොසැලකිල්ල පිළිබඳව කටයුතු කිරීමේදී අත්හළ නොහැකි ප්‍රාදේශිය ළමා ආරක්ෂක නිලධාරීනගේ දැඩි හිඟයකට ළමා ආරක්ෂක අධිකාරිය මුහුණදී සිටී. මෙම හිඟය මඟින්, පළාත් මට්ටමෙන් ළමයින් ආරක්ෂා කිරීම සඳහාවූ අධිකාරියේ ළඟාවීම සහ ඵලදායිතාව බලවත් ලෙස සීමිත කරයි. සංවර්ධන නිලධාරීන් සහ ක්ෂේත්‍ර නිලධාරින්ගේ අඩු වැටුප, ළමා ආරක්ෂක අධිකාරියේ ඵලදායිතාව සුවිශේෂව අභියෝගයට ලක් කරනුයේ, එමඟින් ඉහළ පිරිවැටුමක් නිර්මාණය කර ඇති අතර, කුසලතා පූර්ණ සේවක පිරිස රඳවා ගැනීමේ අධිකාරියේ හැකියාවට බාධා පමුණුවා ඇත(133).

ළමා ආරක්ෂක අධිකාරිය තුල අකාර්යක්ෂම සුපරීක්ෂණය සහ අනවධානය, මෙහෙයුම් අකාර්යක්ෂමතාවට සහ විභව අවකළමනාකරණයට දායක සාධකයක් විය හැකිය. කාර්ය මණ්ඩල හිඟය සහ අකාර්යක්ෂම සුපරීක්ෂණය සංයෝජනය වීමෙන්, ළමයින්ගේ ආරක්ෂණය සහ සුභසිද්ධිය උවදුරට ලක් කරමින්, ළමා අපයෝජන පැමිණිලි පිළිබඳ ප්‍රමාදවූ ප්‍රතිචාරයට සහ නොසැලකිල්ලට මුල පුරයි. ප්‍රමාණවත් නොවන කාර්ය මණ්ඩල සහ සම්පත් හේතුවෙන් ළමයින් සහ ඔවුන්ගේ පවුල්වලට ප්‍රමාණවත් සේවාවන් සැපයීමේ ළමා ආරක්ෂක අධිකාරියේ නොහැකියාව නිසා තත්වය වැඩිදුරටත් තීව්‍ර කරනු ඇත(134). ආනුශංගිකව, ප්‍රමාණවක් ළමා ආරක්ෂණ සේවා හීනතාවය නිසා, ළමයින් අපයෝජනය, නොසැලකිල්ල සහ උපයෝජනයට භාජනය වීමේ අවදානම වැඩි කරනු ඇත.



[133] See Footnote 12
[134] During the stakeholder consultation, it was revealed that the NCPA's capacity to fulfil its mandate is severely hindered by a significant staffing shortage, with only about 50% of its positions filled.

# 4. ඉදිරි ගමන

"ළමයින් පළමුව": ළමයින්ගේ ආරක්ෂාව පිළිබඳව ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ කාර්ය භාරය පිළිබඳ ගැඹුරු අධ්‍යයනයක්, නමැති මෙම වාර්තාව මඟින් ශ්‍රී ලංකාවේ ළමයින්ගේ සුභසිද්ධිය සහ අයිතිවාසිකම් දියුණු කිරීමෙහි ලා, ළමා ආරක්ෂක අධිකාරියේ ප්‍රගතිය සහ මුහුණ දී ඇති අභියෝග පිළිබිඹු කෙරේ. ළමා ආරක්ෂාව, ප්‍රතිපත්ති සංවර්ධනය සහ අපයෝජනය, උපයෝජනය සහ නොසැලකිල්ලෙන් ළමයින් සුරක්ෂිත කිරීම අරමුණු කරගත් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් පෙනී සිටීමේදී, ළමා ආරක්ෂක අධිකාරිය කේන්ද්‍රීය භූමිකාවක් ඉටු කර ඇත. එහි ප්‍රත්‍යුත්ක්‍රම මඟින්, අවදානමට භාජනය වියහැකි ළමයින් සඳහා තීරණාත්මක සහාය සපයා ඇති අතර, ළමා ආරක්ෂණය පිළිබඳ ජාතික අනුශාසනය සඳහා සැලකිය යුතු දායකත්වයක් දරා ඇත.

ළමා ආරක්ෂක අධිකාරියේ සාධනයන් ප්‍රශංසණීය වන අතර, මෙම ඇගයීම මඟින් වැඩිදුර වර්ධනය විය යුතු ක්ෂේත්‍ර අනාවරණය කෙරේ. සම්පත් වෙන්කිරීම, අන්තර්-නියෝජිතායතන සම්බන්ධීකරණය, සහ ප්‍රජාව වෙත ළඟාවීම ආදියෙහි ඉඩැස් පවතින අතර, ඒ සියලු කාර්ය බලපෑම් සහිත වෙනස්කම් පවත්වාගෙන යාම සඳහා අත්‍යවශ්‍ය වේ. නියාමන සහ විශ්ලේෂණ යාන්ත්‍රණ ශක්තිමත් කිරීම, මහජන දැනුවත්බව වැඩිකිරීම, රජයේ සහ රාජ්‍ය නොවන පාර්ශවකරුවන් අතර සම්බන්ධීකරණය දිරි ගැන්වීම, මෙම අභියෝග තරණය කිරීමට සහ ළමා ආරක්ෂක අධිකාරියේ මැදිහත්වීමේ ඵලදායිතාව වර්ධනය කිරීමට වැදගත් වන්නේය.

මෙම ඇගයුම තුලින් මතු වන ප්‍රධාන කරුණක් වනුයේ, ළමා ආරක්ෂක අධිකාරියේ වාර්ෂික වාර්තාවල වාර්තාකරණය දියුණු කිරීමයි. ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් පිළිබඳ වැඩිපුර පැහැදිලි කිරීම්, විස්තර සහ තොරතුරු මඟින් කියවන්නා තුල අධිකාරියේ කටයුතු වටහා ගැනීම ඉවැඩි කරනු ඇත. වාර්ෂික වාර්තා සම්පාදනයේ සංශෝධිත ආකෘතියක් මඟින්, ළමා ආරක්ෂක අධිකාරියේ මහජන අවබෝධය සුවිශේෂව දියුණු කල හැකිය. දිගු-කාලීන බලපෑම සහතික වීම පිණිස, අධිකාරිය විසින් එහි වාර්තාකරණ පරිචයන් ප්‍රමිතිකරණය සඳහා ප්‍රමුඛතාව දිය යුතුය. ස්ථාවර සහ විස්තීර්ණ වාර්තාකරණය මඟින්, ළමා ආරක්ෂක අධිකාරියට එහි වැඩසටහන් හොඳින් නියාමනය කිරීමට සහ විශ්ලේෂණය කිරීමට, වැඩිදියුණු කල යුතු ක්ෂේත්‍ර හඳුනා ගැනීමට, සහ සාක්ෂි මත පදනම්වූ තීරණ ගැනීම් දැන්වීමට හැකියාව ලැබෙනු ඇත. පැහැදිලි වාර්තාකරණ මාර්ගෝපදේශ ස්ථාපිත කිරීමෙන් සහ ප්‍රමිතිගත දත්ත එක්රැස් කිරීමේ මෙවලම් භාවිතයෙන්, ළමා ආරක්ෂක අධිකාරියට, ප්‍රගතිය ඇගයීම සහ අනාගත උපාය මාර්ග දැන්වීම සඳහා උපයෝගි කරගත හැකි, විශ්වාසදායක සහ සංසන්ධනාත්මක දත්ත උපදවා ගැනීමට හැකියාව ලැබෙනු ඇත. ඊටත් අමතරව, අධිකාරිය විසින්, එහි මැදිහත්වීම් වල දිගු-කාලීන බලපෑම විශ්ලේෂනය සඳහා දැඩි පසු විපරම් යාන්ත්‍රණයක් වෙනුවෙන් ආයෝජනය කල යුතුය. කලින් කලට තම වැඩසටහන් වල ප්‍රතිඵල ලුහුබැඳීම මඟින්, ළමා ආරක්ෂක අධිකාරියට අමතර සහාය අවශ්‍ය ක්ෂේත්‍ර හඳුනා ගැනීම සහ උපරිම ඵලදායිතාව සඳහා තම ප්‍රවේශය ප්‍රසාධනය කල හැකිය.

එහි බලපෑම තවදුරටත් ඉවැඩි කිරීම පිණිස, ළමා ආරක්ෂක අධිකාරිය විසින්, ළමා ආරක්ෂණය පිළිබඳ විශේෂණීකෘත (specialise) සිවිල් සමාජ සංවිධාන සමඟ සම්බන්ධීකරණයට ප්‍රමුඛතාව දිය යුතුය. මෙම හවුල්කාරිත්වය මඟින් ළමා ආරක්ෂණය පිළිබඳ සංකීර්ණ ගැටළුවලට පිළියම් සෙවීම සඳහා වටිනා සම්පත්, ප්‍රවීණතාව, සහ නවෝත්පාදන ප්‍රවේශයන් සපයා ගැනීමේ හැකියාව පවතී, එක්ව ක්‍රියා කිරීම තුලින්, ළමා ආරක්ෂක අධිකාරියට සහ සිවිල් සමාජ සංවිධානවලට, වඩාත් විස්තීර්ණ සහ ඵලදායි මැදිහත්වීම් නිර්මාණය කර ගැනීම සඳහා ඔවුන්ගේ සාමූහික ශක්තිය උත්තෝලනය කල හැකිය. ජාත්‍යන්තර සංවිධාන සහ ප්‍රවීණයක් සමඟ කටයුතු කිරීමෙන්, ළමා ආරක්ෂණය පිළිබඳ ලොකව්‍යාප්ත නැඹුරුතා පිළිබඳව දැනුවත්ව ඒ අනුව තම උපායමාර්ග අනුවර්තනය කර ගැනීමට ළමා ආරක්ෂක අධිකාරියට හැකිවනු ඇත.

ළමයින්ගේ අවශ්‍යතාවන් සඳහා ප්‍රමුඛත්වය දීමෙන් සහ සම්බන්ධීකරණ ප්‍රවේශය ප්‍රවර්ධනය කිරීමෙන්, ළමා ආරක්ෂක අධිකාරියට තම ප්‍රතිෂ්ඨාපිත කටයුතු මත ඉදිරි කටයුතු අඛණ්ඩව කරගෙන යාමට සහ ශ්‍රී ලංකාව පුරාවට ළමයින් සුරක්ෂිත කිරීමේ එහි මෙහෙවර වැඩි දියුණු කර ගැනීමට හැකිය. අත්‍යන්තව, මෙම වාර්තාවේ අනාවරණ මඟින්, සෑම ළමයෙකුටම ආරක්ෂිත, පොෂණීය, සහ සහායක වාතාවරණයක් තුල හැදී වැඩීමේ අවස්ථාව සහතික කරන, ළමයින් පළමු ස්ථානයේ තැබීමේ අචල කැපවීමේ වැදගත්කම ඉස්මතු කර දක්වයි.

# 5. පුස්තක නාමාවලිය


Anandakugan, N. (2020, August 31). The Sri Lankan Civil War and Its History, Revisited in 2020. Harvard International Review. Retrieved 10 14, 2024, from https://hir.harvard.edu/sri-lankan-civil-war/

Children with Disabilities. (n.d.). Retrieved from United Nations Special Representative of the Secretary-General on Violence Against Children: https://violenceagainstchildren.un.org/content/children disabilities#:~:text=The%20lives%20of%20children%20with,%2C%20neglect%2C%20abuse%20and%20exploitation.

Daily FT. (2020, April 09). UNICEF and NCPA "gravely concerned" by rise in child cruelty cases since start of COVID-19 curfew. Retrieved 10 14, 2024, from Daily FT: https://www.ft.lk/breaking_news/UNICEF-and-NCPA-gravely-concerned-by-rise-in-child-cruelty-cases-since-start-of-COVID-19-curfew/10526-698705

Ellapolla, Y. (2016, April 25). Sri Lanka's Invisible Children: The Need for Inclusive Education for Children with Special Needs. Retrieved from Talking Economics: https://www.ips.lk/talkingeconomics/2016/04/25/sri-lankas-invisible-children-the-need-for-inclusive-education-for-children-with-special-needs/

Fry, D., & Neelakantan, L. (2020). Protecting Children and Families: Development of a virtual Psychosocial Support in Sri Lanka. UNICEF Sri Lanka. Retrieved 10 10, 2024, from https://www.unicef.org/rosa/media/14141/file/Case%20Study%20-%20Sri%20Lanka%20-%20Protecting%20Children%20and%20Families.pdf

Gopallawa, S. (2024, July 30). Combatting Child Trafficking in Sri Lanka: Blog. Retrieved 10, 11, 2024, from Save the Children: https://www.savethechildren.net/blog/combatting-child-trafficking-sri-lanka

Government of Sri Lanka. (2012, April 25). NCPA launches programme to assist war affected children in North. Retrieved 11 01, 2024, from Relief Web: https://reliefweb.int/report/sri-lanka/ncpa-launches-programme-assist-war-affected-children-north

Gunawardane, B., Suraweera, A., Perera, L., Epasinghe, P., Sandarasegaram, S., Jiffry, M., . . . Edirisinghe, E. (n.d.). New Education Act for General Education in Sri Lanka: Final Report. The National Committee for Formulating A New Education Act in Sri Lanka. Retrieved from https://nec.gov.lk/wp-content/uploads/2017/12/Towards-a-New-Education-Act.pdf

Hamilton, P., & Smith, D. (2023). An Assessment of Routine Data Collection Gaps in the Justice Sector for Children Sector in Sri Lanka and Recommendations on Improving Systems and Addressing Data Gaps. UNICEF Sri Lanka. Retrieved 10 12, 2024, from https://www.unicef.org/srilanka/media/4111/file/Justice%20for%20Children%20Report%20Final.pdf

iProbono. (2024, July). Right to Information Win for Child Protection in Sri Lanka. Retrieved 10 09, 2024, from iProbono: i-probono.com/case-study/right-to-information-win-for-child-protection-in-sri-lanka/

Minister of Labour Relations and Productivity Improvement. (2010, 08 20). Gazette Extraordinary 1667/41.

Ministry of Education. (2011, May 10). A program implemented jointly by the Ministry of Education and the National Child Protection Authority. Circular No. 17/2011. Ministry of Education.

Ministry of Labour, Trade Union Relations and Sabaragamuwa Development. (2017). The National Policy on Elimination of Child Labour in Sri Lanka. Ministry of Labour, Trade Union Relations and Sabaragamuwa Development. Retrieved 10 Oct, 2024, from Ministry of Labour, Trade Union Relations and Sabaragamuwa Development.

National Audit Office. (2020). Annual Report of the Auditor General. National Audit Office. Retrieved 10 Nov, 2024, from http://auditorgeneral.gov.lk/web/images/audit-reports/upload/annual/2020/Annual-Report-of-the-Auditor-General-2020-English-Report.pdf

National Audit Office. (2021). Annual Report of the Auditor General. National Audit Office. Retrieved 10 Nov, 2021, from http://auditorgeneral.gov.lk/web/images/audit-reports/upload/annual/2021/Annual-Report-of-the-Auditor-General-2021-English.pdf

National Audit Office. (2022). Annual Report of the Auditor General. National Audit Offce. Retrieved 10 Nov, 2024, from http://auditorgeneral.gov.lk/web/images/audit-reports/upload/2022/Annual_report_2022/English.pdf

National Child Protection Authority. (n.d.). 1929 Call Centre Helpline.Retrieved 12 10, 2024 from National Child Protection Authority: https://childprotection.gov.lk/en/what-we-do/1929-call-centre-helpline

National Child Protection Authority. (2014). Annual Report of the National Child Protection Authority. National Child Protection Authority. Retrieved 10 09, 2024

National Child Protection Authority. (2015). Annual Report of the Child Protection Authority. National Child Protection Authority. Retrieved 10 10, 2024

National Child Protection Authority. (2016). Annual Report of the Child Protection Authority. National Child Protection Authority. Retrieved 10 10, 2024

National Child Protection Authority. (2017). Annual Report of the Child Protection Authority. National Child Protection Authority. Retrieved 10 10, 2024

National Child Protection Authority. (2018). Annual Report of the Child Protection Authority. National Child Protection Authority. Retrieved 10 10, 2024

National Child Protection Authority. (2019). A Study on Child Disciplinary Methods Practiced in Schools in Sri Lanka. National Child Protection Authority. Retrieved 10 15, 2024, from https://childprotection.gov.lk/images/imu-publications/A_Study_on_Child_Disciplinary_Methods_Practiced_in_Schools_in_Sri__Lanka_-_EN.pdf

National Child Protection Authority. (2019). Annual Report of the Child Protection Authority 2019. National Child Protection Authority.

National Child Protection Authority. (2019, December). Child Protection Journal. Issue 1, 2019.

National Child Protection Authority. Retrieved 10 20, 2024, from https://childprotection.gov.lk/images/pdfs/other-publications/2019%20-%20Child%20Protection%20Journal%20-%20Issue%20No%2001.pdf

National Child Protection Authority. (2019). Trainers Guide: General Child Care Course for Careers in Child Caregiving. Battaramulla: National Child Protection Authority. Retrieved from https://childprotection.gov.lk/images/pdfs/acts-guidelines/2019%20-%20Trainers%20Guide%20(%20General%20Child%20Care%20Course%20_%20NVQ%20Level%204)%20-%20English.pdf

National Child Protection Authority. (2020). Annual Report of the National Child Protection Authority. National Child Protection Authority. Retrieved 10 12, 2024

National Child Protection Authority. (2021). Annual Report of the National Child Protection Authority. National Child Protection Authority. Retrieved 10 12, 2024

National Child Protection Authority. (2021). Establishing a Methodology to Identify Children with Invisible Disabilities. Retrieved from National Child Protection \ Authority: https://childprotection.gov.lk/images/imu-publications/Invisible_Dissabilities-_English_Book.pdf

National Child Protection Authority. (2022). Annual Report of the National Child Protection Authority. National Child Protection Authority. Retrieved 12 10, 2024

National Child Protection Authority. (2024). National Child Protection Authority Annual Reports. Retrieved 10 20, 2024, from https://childprotection.gov.lk/en/resource-centre/annual-reports

National Child Protection Authority. (2024). Statistics. Retrieved 10 20, 2024, from https://childprotection.gov.lk/en/resource-centre/statistics-3

National Child Protection Authority. (n.d.). Internet Watch Foundation Sri Lanka Portal Launch: International Reporting Portal to Report Child Sexual Abuse Material Found Online. Retrieved 10 14, 2024, from National Child Protection Authority: https://childprotection.gov.lk/en/2024/internet-watch-foundation-sri-lanka-portal-launch

National Child Protection Authority. (n.d.). Psychosocial Services. Retrieved 10 09, 2024, from https://childprotection.gov.lk/en/what-we-do/psychosocial-services

National Child Protection Authority. (n.d.). Special Police Unit. Retrieved 10 24, 2024, from https://childprotection.gov.lk/en/what-we-do/special-police-unit

National Child Protection Authority. (n.d.). Statistics. Retrieved 10 12, 2024, from National Child Protection Authority: https://childprotection.gov.lk/en/resource-centre/statistics-3

National Child Protection Authority. (n.d.). Video Evidence Unit. Retrieved 10 12, 2024, from National Child Protection Authority: https://childprotection.gov.lk/en/what-we-do/law-enforcement-services/video-evidence-unit

National Child Protection Authority, Ministry of Women and Child Affairs and Dry Zone Development. (2019). National Guidelines for Child Day Care Centres in Sri Lanka. Save the Children. Retrieved from https://childprotection.gov.lk/images/pdfs/acts-guidelines/Daycare%20Guide%20Line-Final-English-2019.11.04.pdf

National Child Protection Authority, Ministry of Women, Child Affairs and Social Empowerment. (2019). National Guidelines and Minimum Standards for Child Development Centres in Sri Lanka. National Child Protection Authority. Retrieved from https://childprotection.gov.lk/images/news/national-guidelines--minimum-standards-for-CDC-in-SL-e.pdf

Parliament of Sri Lanka. (n.d.). Children and Young Persons Ordinance No. 48 of 1939. Retrieved from https://www.socialproba.cp.gov.lk/download/ord_1939_48_en.pdf

Parliament of Sri Lanka. (n.d.). COPE Committee recommends for an expeditious implementation of the National Policy on Child Protection. Retrieved 10 09, 2024, from Parliament.lk: https://parliament.lk/en/news-en/view/2057?category=33&tmpl=component&print=1

Parliament of Sri Lanka. (n.d.). Employment of Women, Young Persons and Children Act, No. 47 of 1956. Retrieved from https://www.parliament.lk/uploads/acts/gbills/english/6200.pdf

Parliament of Sri Lanka. (n.d.). Penal Code of Sri Lanka. Retrieved from https://www.srilankalaw.lk/p/878-penal-code-ordinance.html

Parliament of Sri Lanka. (n.d.). The National Child Protection Act No. 50 of 1998. 12.11.1998. Retrieved from https://childprotection.gov.lk/images/pdfs/acts-guidelines/National%20Child%20Protection%20Act,%20No.%2050%20of%201998.pdf

Roar Media. (2016, November 4). The Plight Of Sri Lanka’s Special Needs Children. Retrieved from Roar Media: https://archive.roar.media/english/life/reports/plight-sri-lankas-special-needs-children

Sathiadas, M., Viswalingam, A., & Vijayaratnam, K. (2018, May 5). Child abuse and neglect in the Jaffna district of Sri Lanka – a study on knowledge attitude practices and behavior of health care professionals. BMC Pediatrics, 18(152). doi:https://doi.org/10.1186/s12887-018-1138-3

Save the Children. (2021). An Assessment of Child Rights Risks in Sri Lanka's Accomodation and Tourism Sector. The Centre for Child Rights and Business. Retrieved from https://www.childrightsbusiness.org/public/uploads/files/20240805/20240805%20An%20Assessment%20of%20Child%20Rights%20Risks%20in%20Sri%20Lanka%27s%20Accommodation%20and%20Tourism%20Sector.pdf

Save the Children. (2019). Save the Children's Response to Covid-19 in Sri Lanka. Save the Children. Retrieved 14 Oct, 2024, from https://srilanka.savethechildren.net/sites/srilanka.savethechildren.net/files/library/Sri_Lanka_COVID%2019_Strategy_Booklet_Final.pdf

Sri Lanka College of Paediatricians. (2022). Safe Communities for Children: A Project for the Protection of Children from Violence by the Child Protection Committee of the Sri Lanka College of Paediatricians. Retrieved 12 Nov, 2024, from Sri Lanka College of Paediatricians: https://slcp.lk/safe-communities-for-children/

State Minister of Women and Child Development, Pre-school and Primary Education, School Infrastructure and Education Services. (2021). Progress and Performace Report. State Minister of Women and Child Development, Pre-school and Primary Education, School Infrastructure and Education Services. Retrieved from https://childprotection.gov.lk/images/annual-reports/Progress__Performance__2021_1.pdf

State Ministry of Women and Child Development, Pre-Schools & Primary Education, Schools Infrastructure and Education Services. (2020). National Policy on Child Protection. Retrieved 11 Oct, 2024, from https://childprotection.gov.lk/images/pdfs/acts-guidelines/2020.12.31%20 National%20Policy%20on%20Child%20Protection.pdf

Statistical Handbook. (2021). State Ministry of Women and Child Development, Pre-Schools & Primary Education, School Infrastructure & Education Services. Retrieved 10 20, 2024, from https://www.childwomenmin.gov.lk/uploads/common/statistical-hand-book.pdf

Stop Child Cruelty Trust. (2024). Child sexual abuse crisis in Sri Lanka. Retrieved 7 Nov, 2024, from Stop Child Cruelty Trust: https://stopchildcruelty.com/News-Detail/Child-Sexual-Abuse-Crisis/78

The Child Protection Committee of the Sri Lanka College of Paediatricians. (2014). National Guideline for the Management of Child Abuse and Neglect: A Multi-Sectoral Approach. Sri Lanka College of Paediatricians. Retrieved 12 Oct, 2024, from https://medicine.kln.ac.lk/depts/forensic/images/LearningMaterials/ Guidelines/National_Guideline_on_Child_Abuse_and_Neglect.pdf

The Impact of the War on Children in Sri Lanka. (2002). Retrieved 10 Oct, 2024, from Sangam: https://sangam.org/ANALYSIS/Children_1_28_03.htm

The Max Planck Foundation for International Peace and the Rule of Law. (2020). Consultation with National Child Protection Authority held on Children interacting with the Justice System in Sri Lanka. Retrieved 15 Oct, 2024, from The Max Planck Foundation for International Peace and the Rule of Law: https://www.mpfpr.de/2020/08/27/consultation-with-ncpa-sri-lanka/

Thoradeniya, K. (2022). War and Children: Sri Lankan Experience. KALAM International Research Journal, 15(2). Retrieved 15 Oct, 2024, from Sangam: http://ir.lib.seu.ac.lk/bitstream/123456789/6604/1/01.%20KIRJ%2015%282%29%2001-08.pdf

UNICEF Sri Lanka. (2020). UNICEF and NCPA gravely concerned by increase in proportion of child cruelty cases reported to NCPA hotline since the start of the COVID-19 curfew. Retrieved 19 Oct, 2024, from https://www.unicef.org/srilanka/press-releases/unicef-and-ncpa-gravely-concerned-increase-proportion-child-cruelty-cases-reported

Weerakoon, G. (2022). Children still fall prey to predators as NCPA handicapped. Retrieved 19 Oct, 2024, from Ceylon Today: https://ceylontoday.lk/2022/10/29/children-still-fall-prey-to-predators-as-ncpa-handicapped/

Wickramasinghe, K. (2024). Legal crisis hindering justice for Sri Lanka's vulnerable children? Retrieved 24 Oct, 2024, from Daily Mirror: https://www.dailymirror.lk/opinion/Legal-crisis-hindering-justice-for-Sri-Lankas-vulnerable-children/172-277428

iProbono

Together, We Can! Stop Child Cruelty Trust

# අපව අමතන්න

**ඊමේල්**

contact@i-probono.com

**වෙබ් අඩවිය**

www.i-probono.com

/@iprobono /@iProbono /@iProbono